# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# වාර්ෂික වාර්තාව | 2023

# අන්තර්ගතය




| | |
|---|---|
| සාරාංශය | 04 |
| වාර්තාව පිළිබඳව | 05 |
| හැඳින්වීම | 06 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 11 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 12 |
| ඉහළ කළමණාකාරිත්වය | 13 |
| කාර්යසාධන සමාලෝචනය | 15 |
| විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි අනුබද්ධ ආයතනය | 52 |
| අධ්‍යක්ෂ වාර්තාව | 53 |
| පාලන ව්‍යුහය | 55 |
| ආයතනික සමාජීය වගකීම් වාර්තාව | 57 |
| අවදානම් විශ්ලේෂණ වාර්තාව | 58 |
| මූල්‍ය ප්‍රකාශ | 63 |
| විගණකාධිපති වාර්තාව | 115 |
| විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණය | 129 |

# සාරාංශය

**විදේශ රැකියා සඳහා ලියාපදිංචිවීම් 297,656**

→

**පිරිමි : 164, 608 (55.30%)**
**කාන්තා : 133, 048 (44.70%)**

| පුහුණු | | | | අර්ධ පුහුණු | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | % | පිරිමි | කාන්තා | එකතුව | % | |
| 106, 763 | 101, 823 | 208, 586 | 70.08 | 57, 845 | 31, 225 | 89, 070 | 29.92 | 297, 656 |

**ප්‍රධාන වශයෙන් ශ්‍රම ඉල්ලුම සහිත රටවල්** - සවුදි අරාබිය | කුවේට් | කටාර්

**සේවක ප්‍රේෂණ** - ඇ.ඩො.මි. 5,970 | රු. බිලියන 1,950

**කාර්යාංශ ආදායම්** - රු. මිලියන 12,222

**සේවක සුභසාධන අරමුදල් වියදම්** - රු. මිලියන 2,027

**කාර්යාංශ වියදම්** - රු. මිලියන 2,411

# වාර්තාව පිළිබඳව

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2023 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව කාර්යාංශය සහ ඊට අනුබද්ධ ආයතනයේ 2023 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ එකාබද්ධ මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය ඉදිරිපත් කරයි.

ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා නියාමනය, පහසුකම් සැළසීම සහ සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සිය කටයුතු ඉටු කිරීමේදී මුහුණ දුන් විස්තීර්ණ උත්සාහයන්, ජයග්‍රහණ සහ අභියෝග මෙම වාර්තාවෙන් ප්‍රකාශ කෙරේ.

වාර්තාකරණ කාල සීමාව පුරාවටම, ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා සදාචාරාත්මක සහ ප්‍රයෝජනවත් විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට විදේශ සේවා නියුක්ති කාර්යාංශය සිය කැපවීමෙහි නොසැලී සිටියේය. විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ප්‍රයත්නයන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග, සංක්‍රමණික සේවකයින් සඳහා ශක්තිමත් සුබසාධන සේවා, කුසලතා සංවර්ධන මුලපිරීම් සහ දෙස් විදෙස් පාර්ශවකරුවන් සමඟ උපාය මාර්ගික සහයෝගීතාවයන් ඇතුළත් විය.

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (SLFRS/LKAS), රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ, 1971 අංක 28 දරන මූල්‍ය පනත සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචය සංග්‍රහයට අනුකූලව මූල්‍ය තොරතුරු සකස් කර ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තා සමඟ මෙහිදී ප්‍රකාශයට පත් කර ඇත.

මෙම වාර්තාවේ අඩංගු තොරතුරු අදාළ නිලධාරීන්,මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය තහවුරු කරමින් විගණකාධිපතිවරයා සහ අදාළ අවස්ථාවලදී සාමාන්‍යාධිකාරී,සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.

# හැඳින්වීම

## එතෙර සවියට මෙතෙර අත්වැල

### දැක්ම

එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම.

### මෙහෙවර

දේශිය ආර්ථිකයට දායකවෙමින් හා සියලුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම.

### තත්ත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය එහි සේවාවන්හි ගුණාත්මකභාවය අඛණ්ඩව ඉහළ නංවමින් පාරිභෝගික තෘප්තිය අතික්‍රමණය කිරීම පිණිස කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීම සඳහා කැපවී සිටී.

**ශ්‍රී ලංකාව තුළ විදේශ රැකියා කර්මාන්තයේ පාලනය හා නියාමනය සඳහා පූර්ණ අධිකාරී බලය අප සතු වේ.**

# ප්‍රධාන අරමුණු

විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබා දීම.

ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින් සහ මෙරට සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය හා සුරක්ෂිතතාව සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම

ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම් හා ඒවා ප්‍රවර්ධනය කිරීම

# ආයතන ව්‍යුහය

**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**

2022.07.22 දිනැති අතිවිශේෂ ගැසට් අංක. 2289/43

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පනත සහ එහි සංශෝධිත 1994 අංක 04 සහ 2009 අංක 56 මගින් ස්ථාපිත

**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය**

1996 වසරේදී පිහිටුවන ලද, විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි පූර්ණ අනුබද්ධිත ආයතනයකි

# අපගේ දේශීය ජාලය

ප්‍රධාන කාර්යාලය :
අංක 234,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල

**විගමණික සම්පත් මධ්‍යස්ථාන**

1. මතුගම
2. තංගල්ල
3. හාලි ඇල
4. රත්නපුර
5. අම්පාර
6. කුරුණෑගල
7. නුවර
8. වවුනියාව
9. අනුරාධපුර

**ප්‍රාදේශීය දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන**

1. යාපනය
2. මඩකලපුව
3. හලාවත
4. දඹුල්ල
5. ගාල්ල
6. පොලොන්නරුව
7. ත්‍රිකුණාමලය

**පුහුණු මධ්‍යස්ථාන**

1. කුරුණෑගල (වැහැර)
2. පන්නිපිටිය

අපගේ
ශ්‍රම බලකාය
1119



# අපගේ විදේශ ජාලය



### විදේශයන්හි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලවල පිහිටි රැකියා සහ සුභසාධන අංශ

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. | අබුඩාබි | 02. | බහරේන් | 03. | ඩුබායි |
| 04. | ඊශ්‍රායලය | 05. | ජෙඩා | 06. | ජෝර්දානය |
| 07. | කුවේට් | 08. | ලෙබනනය | 09. | මැලේසියාව |
| 10. | මාලදිවයින | 11. | ඕමානය | 12. | කටාර් |
| 13. | රියාද් | 14. | සිංගප්පූරුව | 15. | දකුණු කොරියාව |

විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි විදේශ දූත මණ්ඩල පරිපාලන හා විදේශ සම්බන්ධතා අංශය රටවල් 13 ක; "එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේනය, ඊශ්‍රායලය, ජෝර්දානය, සෞදි අරාබිය, කුවේට්, ලෙබනනය, මැලේසියාව, මාලදිවයින, ඕමානය, කටාර්, දකුණු කොරියාව සහ සිංගප්පූරුව", ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලවල ස්ථාපිත කර ඇති රැකියා සහ සුබසාධන (E&W) අංශ 15 ක මෙහෙයුම් සම්බන්ධීකරණය කරයි. මෙම රැකියා සහ සුබසාධන අංශ ඔස්සේ විදේශගත සංක්‍රමණික සේවකයන්ට සේවා සපයයි.

| | |
|---|---|
| එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා විදේශ රැකියා නියෝජිතායතන / සමාගම් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම | |
| විදේශ රැකියා නියෝජිතායතන / සමාගම් ලියාපදිංචි කිරීම් | 1188 |
| විදේශ රැකියා නියෝජිතායතන / සමාගම් ලියාපදිංචිය අලුත් කිරම් | 914 |
| එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා විගමනික ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම | |
| විගමනික ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම | 2797 |
| විගමනික ශ්‍රමිකයින්ගේ කාර්යාංශ ලියාපදිංචිය අලුත් කිරීම | 4609 |
| දූත මණ්ඩල හරහා විගමනික ශ්‍රමිකයින්ගේ දුක්ගැනවිලිවලට අදාල පැමිණිලි | |
| ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 5901 |
| විසඳු පැමිණිලි සංඛ්‍යාව | 3477 |



# සභාපතිතුමාගේ පණිවුඩය

ජාතියක් ලෙස මුහුණ දුන් ආර්ථික අර්බුදයේ ප්‍රතිවිපාකවලින් සංක්‍රමණය වෙමින් ශ්‍රී ලංකාව 2023 වර්ෂයේදී කැපී පෙනෙන ප්‍රකෘතියක් අත්විඳිමින් තිබිණ. නීත්‍යානුකූල මාර්ගයෙන් එවන ලද ශ්‍රමික ප්‍රේෂණ අපගේ ආර්ථිකය පුනර්ජීවනය කිරීමට දායක වූ ප්‍රධාන සාධකයක් විය. 2023 වර්ෂයේ සේවක ප්‍රේෂණ ලෙස ඩොලර් මිලියන 5970 ක් වාර්තා විය.

ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් තම ප්‍රේෂණ මගින් අපේ රටේ ආර්ථිකයට කරන ලද දායකත්වය අගයමින් 2023 වසර සුබසාධනයේ වසර ලෙස නම් කර ඇත. දැනට ක්‍රියාත්මක වන වැඩසටහන් රැසකට අමතරව විගමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා තවත් සුබසාධන ක්‍රියාමාර්ග ලබාදීම සඳහා නව වැඩසටහන් රැසක් දියත් කරන ලදී. 2023 වර්ෂයේදී බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල වෘත්තීයභාවය ඉහළ නැංවීම සහ ඔවුන්ගේ සංවර්ධනය උදෙසා නව බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමත් බලපත්‍රලාභීන් සහ කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යයන වැඩසටහන් හඳුන්වාදීමටත් කටයුතු කරන ලදී. විදේශ සේවා නියුක්ති කාර්යාංශය පුද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතන සමග විශේෂයෙන්ම අනාගත සංක්‍රමණික ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්ෂේත්‍රය තුළ පුහුණු ශ්‍රමිකයින් වැඩි වශයෙන් විදේශයන්හි යැවීම සහ පුහුණු ශ්‍රමිකයින් සංචිතයක් නිර්මාණය කිරීමේ අරමුණින් තම කටයුතු වැඩි කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලාංකිකයන් 297,656ක් විදේශ රැකියා සඳහා ලියාපදිංචි වී ඇත. එයින් 70.08% ක් වෘත්තීය කාණ්ඩ සඳහාය. 2022 වර්ෂය සඳහා වූ රුපියල් මිලියන 11,470 ක සැබෑ ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මුළු ආදායම රුපියල් මිලියන 12,222 ක් විය.

2023 වසර පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය, විදේශ රැකියා ප්‍රවර්ධනය සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රසාරණය කෙරෙහි අවධානය යොමු කරන වැඩසටහන් රැසකින් ද සමන්විත විය.

අපගේ සියලු ජයග්‍රහණ හමුවේ, කාර්යාංශයෙහි ක්‍රියාකාරීත්වය සහ කාර්ය සාධනය ශක්තිමත් කිරීමට ඉවහල් වූ සහ කැපවූ කාර්ය මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයටත් අපගේ සියලුම පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ සහයෝගීතාවය වෙනුවෙනුත් මගේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ ශක්තිමත් සහයෝගය වෙනුවෙනුත් මාගේ බලවත් කෘතඥතාව පුදකර සිටිමි. ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා, ගරු විදේශ රැකියා රාජ්‍ය අමාත්‍යතුමා සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබාදුන් මගපෙන්වීම් අගය කරමි.

විදේශ රැකියා ප්‍රජාව සඳහා විශිෂ්ටත්වය සහ සහයෝගය ලබා දෙමින් සැමට සමෘද්ධිය උදා කිරීම සඳහා අප තවදුරටත් එක්ව කටයුතු කරන්නෙමු.

ඒ.ඒ.එම්. හිල්මි
සභාපති

# අධ්‍යක්ෂ මණ්ඩලය

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 05 වන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය පහත සමාජිකයින්ගෙන් සමන්විත වේ.

01 සාමාජිකයකු - මුදල් අමාත්‍යාංශයෙන්
01 සාමාජිකයකු - විදේශ කටයුතු අමාත්‍යාංශයෙන්
01 සාමාජිකයකු - කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන්
සාමාජිකයින් 04 දෙනෙකු - බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවලින්
සාමාජිකයින් 04 දෙනෙකු - විදේශ රැකියා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි

**2023 දෙසැම්බර් 31න් අවසන් වසර තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය**

| අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර |
|---|---|
| 01. ඒ .ඒ. එම්. හිල්මි මහතා | සභාපති |
| 02. මහේන්ද්‍ර කුමාරසිංහ මහතා | අධ්‍යක්ෂ |
| 03. සමින්ද ජයසේකර මහතා | අධ්‍යක්ෂ |
| 04. ජේ. එම්. එස්. ඩී. රත්නායක මිය | අධ්‍යක්ෂ |
| 05. චන්දන විරසේන මහතා | අධ්‍යක්ෂ |
| 06. නිල්මිනි හේරත් මිය | අධ්‍යක්ෂ |
| 07. ජෙෆ් ගුණවර්ධන මහතා | අධ්‍යක්ෂ |
| 08. එම්. එෆ්. එම්. අර්ෂාඩ් මහතා | අධ්‍යක්ෂ |
| 09. ඒ. එල්. එම්. හසාම් මහතා | අධ්‍යක්ෂ |
| 10. එම්. ආර්. එම්. ෆස්ලි මහතා | අධ්‍යක්ෂ |
| 11. නිශාන්ත ජයකොඩි මහතා | අධ්‍යක්ෂ |

# ඉහළ කළමනාකාරිත්වය

- ඒ.ඒ.එම්. හිල්මි මයා - සභාපති
- ඩී.ඩී.ඩී.පී. සේනානායක මයා - සාමාන්‍යාධිකාරී

- ආර්.කේ.කේ.එම්.පී. රන්දෙණිය මයා - අතිරේක සාමාන්‍යාධිකාරී (දේශීය කටයුතු)
- එම්.ආර්.සී.බී. ඒකනායක මයා - අතිරේක සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර කටයුතු)
- එල්.ඒ.පී.කේ.ලියන්වල මයා - අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු)

- ඒ.කේ.යූ. රෝහණ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( තොරතුරු තාක්ෂණ සහ ගුවන් තොටුපල ඒකක)
- පී.පී. වීරසේකර මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( රැකියා අනුමැති)
- වයි.සී.එන්. අබේගුණවර්ධන මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( අභ්‍යන්තර විගණන)
- කේ.එල්.එච්.කේ. විජේරත්න මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( විදේශ සම්බන්ධතා)
- ජේ.එම්.ආර්.යූ. ජයසිංහ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( පරිපාලන හා මානව සම්පත්)
- පී.එම්. රත්නසිංහආරච්චි මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමථ)
- ඩබ්ලිව්.ඒ.කේ. කුමාරි මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
- එම්.ආර්. විජේසේන මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)
- ජේ.ඒ.ඩී.පී. මංජුල මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ සවර්ධන)
- එල්.වයි. පතිරණ මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු)
- ආර්.ඒ.එස්. චාමින්ද මයා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ක්‍රමසම්පාදන හා බලපත්‍ර)
- ජී.ටී.එස්.සී.විජේරත්න මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සංවර්ධන)

- එච්.එම්. සුනිල් මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු ( උතුරු මැද පළාත)
- ජගත් බටුගෙදර මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු- නඩත්තු ( සියලු ශාඛා)
- එස්. ගාල්ලගේ මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ඌව පළාත)
- ආර්.ඩබ්ලිව්.ඒ.ජී.එස්. චාමින්ද මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (දකුණු පළාත)
- බී.ඒ. රෝහිණී මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (සබරගමුව පළාත)
- එම්.ඒ.එම්. මලික් මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (බස්නාහිර පළාත)
- ජී.ජී.පී. විජේවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වයඹ පළාත)
- කේ.ඒ.ඩී.එස්. කුමාරපේලි මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (නැගෙනහිර පළාත)
- ඒ.එල්.ඩී.ඩි.ලක්රාණි මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (උතුරු පළාත)
- එන්.කේ. කන්නන්ගර මිය - ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මධ්‍යම පළාත)

# ආයතනික සංවිධාන ව්‍යුහය




Admin & HR - පරිපාලන හා මානව සම්පත්
hum. Tra. - මිනිස් වෙළඳාමට එරෙහි අංශ
Plan - සැලසුම්
BS - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
INV - විමර්ෂණ
Rec (K) - බඳවාගැනීම් (කොරියාව)
Fin - මුදල්
Train (D) - පුහුණු (ගෘහස්ථ)

FR - විදේශ සබඳතා
Mkt - අලෙවිකරණ
App - අනුමැති
ICT - කාර්මික හා ආයතනික පුහුණු
QA - තත්ත්ව ආරක්ෂන
Con II - සමථ II
Main - නඩත්තු
Trans - ප්‍රවාහන

MPS - මිනිස් බල සැපයුම සහ පාරිභෝගික සහාය
Air - ගුවන් තොටුපල
IA - අභ්‍යන්තර විගණන
Pub - ප්‍රචාරක
Con I - සමථ I
Lice - බලපත්‍ර
Rein - ප්‍රත්‍යානුකලන
Wel - සුබසාධන

Admin - පරිපාලන
HR - මානව සම්පත්
Proc - ප්‍රසම්පාදන
Bus. Dis. - ව්‍යාපාර ගැටලු නිරාකරණය
IT - තොරතුරු තාක්ෂණ
Rec (G) - බඳවාගැනීම් (සාමාන්‍ය)
Res - පර්යේෂන

පළාත් සඳහා පත් කර ඇති ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු) ගේ අධීක්ෂණයට යටත් වේ.

# කාර්යය සාධන සමාලෝචනය

**විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබාදීම**

- බලපත්‍රකරණය
- රැකියා ඇණවුම් අනුමත කිරීමේ හා රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන්
- නීති පැනවීම
- ව්‍යාපාර ආරවුල් නිරාකරණය

## බලපත්‍රකරණය

වි.සේ.නි.කාර්යාංශයෙහි බලපත්‍ර අංශය විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා පහසුකම් සපයමින් බඳවා ගැනීමේ ආයතන සඳහා බලපත්‍ර ලබා දීම සහ නියාමනය කිරීමේ වගකීම දරයි. එම අංශය විසින් බලපත්‍රලාභී බඳවා ගැනීමේ ආයතන අදාළ නීති, රෙගුලාසි සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරයි. විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන අනුව අවශ්‍යතා සපුරා ඇති අය සඳහා විදේශ රැකියා ව්‍යාපාර කරගෙන යාමට කාර්යාංශය බලපත්‍ර නිකුත් කරයි. බලපත්‍රයක් වසරක කාලයක් සඳහා වලංගු වන අතර නැවත අලුත් කළ හැකිය.

**බලපත්‍ර අංශයේ ක්‍රියාකාරකම් :**

a. නව බලපත්‍ර නිකුත් කිරීම.
b. බලපත්‍ර අලුත් කිරීම.
c. බලපත්‍ර අවලංගු කිරීම.
d. නව බලපත්‍රලාභීන් සහ සියලුම ලියාපදිංචි ඒජන්සි ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
e. උසාවි නඩු සඳහා පෙනී සිටීම.
f. සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වූ නව බලපත්‍රලාභීන් සඳහා අයදුම්පත් නිකුත් කිරීම.
g. බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල ශාඛා කාර්යාල සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
h. බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන ශ්‍රේණිගත කිරීම.

| අංශය මගින් සිදුකරනු ලබන කටයුතු | | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| 01. | නව බලපත්‍ර නිකුත් කිරීම. | 37 | 113 | 144 |
| 02. | බලපත්‍ර අලුත් කිරීම. | 808 | 864 | 961 |
| 03. | බලපත්‍ර අවලංගු කිරීම. | 19 | 22 | 33 |
| 04. | දැනුවත් කිරීමේ වැඩසටහන් | 02 | 4 | 12 |
| 05. | උසාවි නඩු සඳහා පෙනී සිටීම. | 46 | 108 | 206 |
| 06. | නව බලපත්‍රලාභින් සඳහා නිකුත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | 157 | 233 | 228 |
| 07. | ශාඛා කාර්යාල සංඛ්‍යාව | 0 | 15 | 75 |

**i. බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සඳහා ත්‍යාග යෝජනා ක්‍රම**




## රැකියා ඇණවුම් අනුමත කිරීමේ හා රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන් බලපත්‍රකරණය

ශ්‍රී ලාංකිකයින්ට සාධාරණ හා සදාචාරාත්මක බඳවා ගැනීමේ පිළිවෙත් සහතික කිරීමත් විදේශ රැකියා සඳහා සම්බන්ධ සේවා යෝජකයන්ගේ සහ ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා, සුබසාධනය ආරක්ෂා කිරීමත් අරමුණු කර ගනිමින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය රැකියා ඇණවුම අනුමත කිරීමේ සහ රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාවට නංවා ඇත. කාර්යාංශයේ පළමු අනුමැති අංශය සහ අවසාන අනුමැති අංශය යන අංශ ඔස්සේ මෙය ක්‍රියාත්මක වේ.

**පළමු අනුමැති අංශය**

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන මගින් ඉදිරිපත් කරනු ලබන රැකියා ඇණවුම් සහ වෙළඳ දැන්වීම් සඳහා අනුමැතිය ලබා දෙනු ලබයි. එමෙන්ම, පෞද්ගලික ක්‍රමයන් (ස්වයං ලියාපදිංචිය) ඔස්සේ රැකියා අවස්ථා ලැබෙන විගමනික ශ්‍රමිකයින් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ද මෙමගින් පහසුකම් සලසනු ලබයි.

**අවසන් අනුමැති අංශය**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් අනුමත කරන ලද රැකියා ඇණවුම් ප්‍රකාරව විදේශ රැකියා අවස්ථා සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීම පිණිස බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන වෙත අනුමැතිය ලබාදෙනු ලබයි.

| පළමු අනුමැති අංශයේ ක්‍රියාකාරකම් | වසර | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023 |
| ස්වයං මාර්ග ලියාපදිංචිය | 81,281 | 187,639 | 121,844 |
| අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාව | 2,392 | 3,138 | 4,260 |
| අනුමත කරන ලද වෙළඳ දැන්වීම් සංඛ්‍යාව | 746 | 1,005 | 1,341 |

**ලියාපදිංචි විදේශ රැකියා ආයතන ඔස්සේ අවසාන අනුමත අංශය විසින් සිදු කරන ලද විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම්**

| මධ්‍යස්ථානය | ප්‍රධාන කාර්යාලය | පළාත් කාර්යාල | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අම්පාර | අනුරාධපුර | බදුල්ල | හලාවත | නුවර | කුරුණෑගල | රත්නපුර |
| ලියාපදිංචිවීම් | 101,916 | 510 | 2,204 | 68 | 873 | 5,887 | 32,318 | 07 |
| | 101,916 | 41,867 | | | | | | |
| එකතුව | 143,783 | | | | | | | |




**2021 සිට 2023 දක්වා ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන ඔස්සේ විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම්**

| මධ්‍යස්ථානය | | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| පළාත් කාර්යාල | ප්‍රධාන කාර්යාලය | 30,936 | 87,405 | 101,916 |
| | අම්පාර | 0 | 1,955 | 510 |
| | අනුරාධපුර | 495 | 1,850 | 2,204 |
| | බදුල්ල | 06 | 90 | 68 |
| | හලාවත | 0 | 57 | 873 |
| | නුවර | 1,686 | 5,400 | 5,887 |
| | කුරුණෑගල | 8,480 | 26,518 | 32,318 |
| | රත්නපුර | 0 | 21 | 07 |
| | පළාත් කාර්යාලවල එකතුව | 10,667 | 35,891 | 41,867 |
| | **එකතුව** | **41,603** | **123,296** | **143,783** |






කාර්යාංශයෙහි ලියාපදිංචිවීමේ සංඛ්‍යාලේඛනවලට අනුව, 43% ගෘහස්ත ගෘහ පාලන සහකාර , 31 % අඩු පුහුණු ශ්‍රමිකයන්, 1% අර්ධ නිපුණතා සහ 21% පුහුණු ශ්‍රමිකයන් යන කාණ්ඩ යටතේ විය. ඉතිරි සංඛ්‍යා ලේඛනගත කර ඇත්තේ කම්කරු නොවන කාණ්ඩය යටතේ - මධ්‍යම මට්ටමේ 2%, වෘත්තීය 1%, ලිපිකරු සහ අදාළ 1% යටතේය. ඔවුන් ප්‍රධාන වශයෙන් ගල්ෆ් කලාපීය රටවල එනම් බහරේන්, කුවේට්, ඕමානය, කටාර්, සෞදි අරාබිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සේවයේ යෙදී සිටිති.




මැදපෙරදිග කලාපය ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් සඳහා විශාලතම විදේශ රැකියා වෙළඳපොළ ලෙස හඳුනාගෙන ඇති අතර, ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් 89% කට වැඩි පිරිසක් එම කලාපයේ සේවය කරති.




ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් බැහැර රැකියා අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම ශ්‍රී ලාංකිකයෙකු විසින් ම එසේ පිටත්ව යාමට පෙරාතුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ලියාපදිංචි වීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ එසේ ලියාපදිංචි වීම මඟින්, සත්කාරක රටවලදී ශ්‍රී ලාංකිකයින්ගේ අයිතිවාසිකම් සහ අපේක්ෂාවන් සුරක්ෂිත කෙරෙන වලංගු රැකියා ගිවිසුමක් සහිතව ශ්‍රී ලාංකිකයින් විදේශගත රැකියාවක නිරත වන බවට සහතික කරනු ලබයි. එසේ ලියාපදිංචි වන විගමණික ශ්‍රමිකයින් හට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ගාස්තු අයකිරීමකින් තොරව රක්ෂණාවරණයක් පිරිනමනු ලබන අතර එය ඔවුන්ගේ කොන්ත්‍රාත් කාල පරිච්ජේදය සඳහා වලංගු වේ. අදාළ රැකියා කොන්ත්‍රාත්තුව ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ලියාපදිංචිය වසර දෙකක හෝ තුනක කාලයක් සඳහා වලංගු වේ. රැකියා නියුක්තිකයින් සඳහා සිය ලියාපදිංචිය දීර්ඝ කර ගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් සිදු කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇත.

## නීති පැනවීම

විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් බඳවා ගැනීම සහ යෙදවීම නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විවිධ නීති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම්වල නිරත වේ. විදේශ සේවා නියුක්ති කාර්යංශයෙහි නීති අංශය, විශේෂ විමර්ශන අංශය සහ මිනිස් ජාවාරම් ඒකකය නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා ක්‍රියාත්මක වේ. රැකියා අපේක්ෂකයින්, සංක්‍රමණික සේවකයින්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහ අනෙකුත් අගතියට පත් පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විවිධ නීති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කරයි. එහි ප්‍රධාන නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් සමහරක් ඇතුළත් වේ.

- **නියාමන අනුකූලතාව** : බඳවා ගැනීමේ නියෝජිතායතන බලපත්‍ර අවශ්‍යතා, චර්යාධර්ම සංග්‍රහය සහ අනෙකුත් නීතිමය බැඳීම්වලට අනුකූලව කටයුතු කරන බව සහතික කරමින්, විදේශීය රැකියා සම්බන්ධ රෙගුලාසි බලාත්මක කරයි.

- **අධීක්ෂණය සහ පරීක්ෂණය** : රෙගුලාසිවලට අනුකූලද යන්න තහවුරු කර ගැනීම සඳහා බඳවා ගැනීමේ නියෝජිතායතනවල නිරන්තර පරීක්ෂණ පැවැත්වීම සහ නිරීක්ෂණය කිරීම. මෙයට සේවා කොන්දේසි, බඳවා ගැනීමේ පරිචයන් සහ සංක්‍රමණික සේවකයින්ගේ සුභසාධනය තක්සේරු කිරීම ඇතුළත් වේ.

- **පැමිණිලි විමර්ශනය** : බඳවාගැනීම් වංචා, සූරාකෑම, අපයෝජනය හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සංක්‍රමණික සේවකයින් හෝ ඔවුන්ගේ පවුල් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සහ දුක්ගැනවිලි විමර්ශනය කරයි.

- **නඩු පැවරීම සහ නීතිමය ක්‍රියාමාර්ග** : බඳවා ගැනීමේ ආයතන හෝ සේවා යෝජකයින් විසින් විෂමාචාර හෝ නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වැරදිකරුවන්ට නඩු පැවරීම සහ වැරදි ආයතනවල බලපත්‍ර අවලංගු කිරීම ඇතුළුව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබයි.

- **මිනිස් ජාවාරම වැළැක්වීම** : විදේශ රැකියා සන්දර්භය තුළ මිනිස් ජාවාරම වැළැක්වීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නීතිය බලාත්මක කිරීමේ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරන අතර ජාවාරමට එරෙහිව සටන් කිරීම සහ අවදානමට ලක්විය හැකි සංක්‍රමණික සේවකයින් ආරක්ෂා කිරීම අරමුණු කරගත් දැනුවත් කිරීමේ ව්‍යාපාර, පුහුණු වැඩසටහන් සහ මුලපිරීම් සඳහා සහභාගී වේ.

| නීති අංශය මගින් සිදු කරනු ලබන කටයුතු | | ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | 2021 | 2022 | 2023 |
| 01. | කාර්යාංශයට එරෙහිව ගොනු කරන ලද නඩුවකදී නීති උසාවි සහ විනිශ්චය සභාවල පෙනී සිටීම. | 86 | 106 | 185 |
| 02. | නීතිය උල්ලංඝනය කළ බලපත්‍රලාභී නියෝජිතයින්ට සහ බලපත්‍ර නොමැති පුද්ගලයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. | 134 | 54 | 25 |
| 03. | බලපත්‍රලාභී නියෝජිතයින්ට සහ බලපත්‍රලාභී නොවන පුද්ගලයින්ට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගොනු කරන ලද නඩු වලදී අධිකරණවල පෙනී සිටීම. | 3,066 | 4,121 | 4,472 |
| 04. | නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම සහ සහතික කිරීම. | 31 | 57 | 98 |
| 05. | විදේශ රැකියා වලදී අදාළ නීතිය සහ ඊට අදාළ අනෙකුත් නීති පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම සඳහා කාර්යාංශ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 01 | 00 | 02 |
| 06. | පවතින නීතිය පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීම/ සංවර්ධනය සඳහා ජාතික සහ ජාත්‍යන්තර නීති වැඩමුළු සහ වැඩසටහන් සඳහා නීති නිලධාරීන් සහභාගී කරවීම. | 00 | 01 | 02 |
| 07. | කාර්යාංශ පනත යටතේ මිනිස් ජාවාරම වැළැක්වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්ය මණ්ඩලය, පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 00 | 01 | 02 |
| 08. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළාත් කාර්යාලය හරහා විගමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට නීති සහකාර/උපදෙස් ලබා දීම. | 00 | 00 | 02 |
| 09 | මානව හිමිකම් කොමිෂන් සභා සහ වෙනත් සමාන සංවිධානවල අවශ්‍යවිට පෙනී සිටීම සහ අවශ්‍ය තොරතුරු සැපයීම. | 00 | 56 | 14 |
| | | | | |
| කාර්යාංශයේ වෙනත් ආංශික කටයුතු සඳහා නීති සහය ලබා දීම. | | | | |
| | | 2021 | 2022 | 2023 |
| 09. | බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් කළ වාර්තා ගණන. | 808 | 1,233 | 1,242 |
| 10. | සම්පූර්ණ කරන ලද රක්ෂණ ගෙවීම් ගොනු ගණන. | 315 | 199 | 277 |



## වලංගු කාර්යාංශ බලපත්‍රයක් නොමැති පුද්ගලයින් විසින් සිදු කරනු ලබන බඳවා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්යාංශයෙහි විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරන ලද වැටලීම්.

| වසර | සිදු කරන ලද වැටලීම් ගණන | සාර්ථක වැටලීම් ගණන |
|---|---|---|
| 2021 | 04 | 04 |
| 2022 | 27 | 27 |
| 2023 | 15 | 15 |
| එකතුව | **46** | **46** |

### විසඳා ඇති පැමිණිලි ගණන

| වසර | විසඳා ඇති පැමිණිලි ගණන |
|---|---|
| 2021 | 1,065 |
| 2022 | 922 |
| 2023 | 1,348 |
| එකතුව | 3,334 |









2023 වසරේ මිනිස් ජාවාරම්වලට එරෙහි කාර්යාංශ ඒකකයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව - 59



## ව්‍යාපාර ආරවුල් නිරාකරණය

කාර්යාංශයෙහි ව්‍යාපාර ආරවුල් නිරාකරණය කිරීමේ අංශය අදාළ පාර්ශව අතර, එනම් බලපත්‍රලාභී විදේශ රැකියා ඒජන්සි දෙකක් හෝ වැඩි ගණනක් අතර, විදේශ බඳවා ගැනීමේ නියෝජිතායතනයක් සහ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනයක් අතර හෝ විදේශ රැකියා නියෝජිතායතනය සහ සංක්‍රමණික සේවකයෙක් හෝ රැකියා සොයන්නෙක් අතර පැන නගින ආරවුල් සහ ගැටුම් නිරාකරණය කිරීම සඳහා ක්‍රියා කරයි. ව්‍යාපාර ආරවුල් නිරාකරණය කිරීමේ අංශයේ මූලික අරමුණ වන්නේ විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින්ට සාධාරණ ලෙස සැලකීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කිරීමයි. ආරවුල් කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස විසඳා ගැනීමෙන්, ශ්‍රී ලාංකික විදේශ ශ්‍රමිකයන්ගේ කීර්ති නාමය පවත්වා ගැනීමට සහ ශ්‍රී ලංකාව සහ එහි පුරවැසියන් සේවය කරන රටවල් අතර ධනාත්මක සබඳතාවයක් ප්‍රවර්ධනය කිරීමට මෙම අංශය ක්‍රියා කරයි.

| අනු අංක | ක්‍රියාකාරකම | ලැබුණු පැමිණිලි | විසඳූ පැමිණිලි |
|---|---|---|---|
| 01. | විදේශ නියෝජිතායතනවලට එරෙහිව බලපත්‍රලාභී දේශීය රැකියා නියෝජිතායතන වෙතින් ලැබුණු ව්‍යාපාරික ආරවුල් | 81 | 13 |
| 02. | බලපත්‍රලාභී රැකියා ඒජන්සි ආයතන අතර ඇතිවුන ආරවුල් සම්බන්ධ පැමිණිලි | 9 | 2 |
| 03. | බලපත්‍රලාභී රැකියා නියෝජිතායතන වෙතින් රැකියා සොයන්නන්ට එරෙහිව ව්‍යාපාරික ආරවුල් | 1,467 | 316 |
| 04. | කාර්යාංශයේ ලියාපදිංචියකින් තොරව විදේශ ගමන් බලපත්‍ර රඳවාගෙන සිටින ඒජන්සි ආයතනවලට එරෙහිව රැකියා අපේක්ෂකයින්ගෙන් ලැබෙන පැමිණිලි | 436 | 181 |

**ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින් සහ මෙරට සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය හා සුරක්ෂිතතාව සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම**

- පැමිණිලි නිරාකරණය / සමථකරණය
- සුභසාධන සේවා
- පැය 24 තොරතුරු සේවා
- නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සඳහා සහය

## පැමිණිලි නිරාකරණය / සමථකරණය

සමථ අංශය ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් මැදිහත්කරුවෙකු සහ ආරක්ෂකයෙකු ලෙස ක්‍රියා කරමින් ඔවුන්ගේ සුබසාධනය සහතික කිරීම සහ රැකියා ආශ්‍රිත ගැටලු කාර්යක්ෂමව විසඳයි. විදේශගත ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ රැකියා සම්බන්ධ ආරවුල් විසඳීම සහ දුක්ගැනවිලි විසඳීම සඳහා මෙම අංශය ක්‍රියාත්මක වේ.

ලියාපදිංචි විගමනික ශ්‍රමිකයෙකු හෝ ඔහු / ඇය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙකුට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ, පළාත් කාර්යාලවල හෝ අදාල රටේ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශවල පැමිණිලි ගොනු කිරීම කළ හැක. සමථ අංශයට හෝ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශයට අනුයුක්තව සිටින කාර්යාංශයේ බලය ලත් නිළධාරීන්, අදාල බලපත්‍රලාභි විදේශ රැකියා නියෝජිතායතන හා විදේශ රැකියා එජන්සි ආයතන හරහා පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමව ඉහළ නැංවීම උදෙසා කාර්යාංශය විසින් පැමිණිලි කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පාර්ශවයන්ට පැමිණිලි කළමනාකරණ පද්ධතිය ඔස්සේ සන්නිවේදනය කිරීමට හා තොරතුරු වාර්තා කිරීමට පහසුකම් සලසා ඇත.

| | වසර | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023 |
| ලැබුණු පැමිණිලි | 2,362 | 3,236 | 6,637 |
| විසඳූ පැමිණිලි | 3,360 | 3,167 | 5,630 |
| සංක්‍රමණික සේවකයින් සඳහා මූල්‍ය ප්‍රතිලාභ | Rs. 2,295,925/- | Rs. 17,992,054/- | Rs. 27,647,653/- |







පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා සමථ අංශය විසින් අදාළ පාර්ශ්ව සමඟ විශේෂ සමථ දින වැඩසටහන් පවත්වනු ලබයි.

අගතියට පත් පාර්ශ්වයන් සහ විදේශ රැකියා නියෝජිතායතන හෝ සේවා යෝජකයන් අතර ගැටුම් සහ ආරවුල් සුහදව විසඳා ගැනීමට මෙම අංශය මැදිහත් වේ. අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි විසඳුමකට එළඹීම සඳහා සාකච්ඡාකිරීම් සිදුකර අවශ්‍ය පහසුකම් සැලසීම මෙයට ඇතුළත් වේ.





## සුභසාධන සේවා

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සුබසාධන අංශය ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා කැපවී සිටී. මෙම අංශය ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අවශ්‍යතා සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාත්මක වන අතර, ඔවුන්ගේ අවශ්‍යතා සහ අභියෝගවලට මුහුණ දීම සඳහා පුළුල් ආධාරක පද්ධතියක් සපයයි.

සුබසාධන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් :

01. සංක්‍රමණික සේවකයන්ට රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට සහාය වීම.
02. සංක්‍රමණික සේවකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
03. ශ්‍රී ලංකාවට පැමිණ රෝහල්ගත කර සිටින සංක්‍රමණික සේවකයින්ගේ යහපැවැත්ම සොයා බලා වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි ඖෂධ සහ ප්‍රතිකාර ලබා දීම.
04. සංක්‍රමණික සේවකයන්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම.
05. ස්ථිර පූර්ණ ආබාධ සහිතව ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින් සඳහා "සහන නිවාස යෝජනා ක්‍රමය" යටතේ නිවාස ඉදිකර දීම.

06. සංක්‍රමණික කම්කරුවන්ගේ පවුල් සඳහා වෛද්‍ය කඳවුරු සංවිධානය කිරීම

07. ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයින් වෙනුවෙන් ඔවුන්ගේ සේවා යෝජකයා විසින් ගෙවීම් සිදුකරන ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

08. රක්ෂණ ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලබන සංක්‍රමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට කම්කරු සුභසාධන අරමුදල (සේ.සු.අ.)යටතේ ආධාර ලබා දීම.

09. ආපදා තත්ත්වයන් වලදී සහාය වීම

10. පෙර විගමණික ණය ලබා ගැනීම සඳහා බැංකු වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම.

11. "මනුසවි" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිළිබඳව විගමණික ශ්‍රමිකයන් දැනුවත් කිරීම.

12. වියළි සලාක පැකේජ පිරිනැමීම

13. මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වල සහාය ඇතිව බහුකාර්ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

| අනු අංක | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | දරන ලද පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| 01. | රක්ෂණ ප්‍රතිලාභ ලබාදීම.<br>ලියාපදිංචි වූ දින සිට වසර දෙකක කාලය තුළ මිය ගිය හෝ රෝගාබාධ, පුද්ගලික අනතුරු, හිරිහැරවලට ලක් වූ ලියාපදිංචි සංක්‍රමණික සේවකයන්ට රක්ෂණ ප්‍රතිලාභ හිමි වේ. | 782 | 129.35 |
| | සංක්‍රමණික සේවකයින් වෙනුවෙන් රක්ෂණ වාරික (දේශීය) | 194,247 | 430.2 |
| | ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් සඳහා සේවා යෝජකයා විසින් ගෙවන ලද ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ (විදේශීය) ගෙවා ඇති හිමිකම් ගණන | 17 | 6.84 |
| 02. | ශිෂ්‍යත්ව ප්‍රදානය<br>ලියාපදිංචි සංක්‍රමණික සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම; උසස් අධ්‍යාපනය ලබන, 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස (සා.පෙළ) විභාගය, අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් | 2,064 | 57.3 |
| 03. | පාසල් උපකරණ ලබාදීම<br>මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් තම අධ්‍යාපනය කරගෙන යාමට නොහැකි වන සංක්‍රමණික සේවකයන්ගේ දරුවන්ට පාසල් උපකරණ ලබාදීම. | 956 | 12 |
| 04. | සංක්‍රමණික සේවකයන්ගේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා ආධාර සැපයීම. | 03 | 0.67 |
| 05. | සංක්‍රමණික සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් වෙත අවස්ථානුකූලව බස් ගාස්තු/ආහාර සැපයීම. | 282 | 2.23 |
| 06. | රක්ෂණ ප්‍රතිලාභ හිමි නොවන සංක්‍රමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට කම්කරු සුභසාධන අරමුදල (සේ.සු.අ.) යටතේ ආධාර සැපයීම. | 142 | 31.27 |
| 07. | කාර්යාංශ ලියාපදිංචිය සහිතව විදේශයන්හි සේවය කරමින් සිටියදී හදිසි අනතුරක් හේතුවෙන් ආබාධිතවූ සේවකයින් (ආබාධිත බව 65% හෝ ඊට වැඩි) සඳහා නිවසක් ඉදිකිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීම. | 1 | 0.35 |

| අනු අංක | ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | දරන ලද පිරිවැය (රු.මි.) |
|---|---|---|---|
| 08. | අවශ්‍යතා ඇති ලියාපදිංචි සංක්‍රමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට වෛද්‍ය ප්‍රතිකාර, නිර්දේශිත ඖෂධ සහ පෝෂණ ආහාර ගෙවීම් ලබා දීම. | 22 | 1.19 |
| 09. | ආපදා තත්ත්වයකදී සංක්‍රමණික සේවකයන්ට සහාය වීම. | 1 | 0.015 |
| 10. | සංක්‍රමණික සේවකයන්ගේ පවුල් සඳහා වෛද්‍ය කඳවුරු සංවිධානය කිරීම. | 4 | 3.11 |
| 11. | පෙර විගමණික ණය ලබා ගැනීම සඳහා බැංකු වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම. | 1,878 | 0 |
| 12. | "මනුසවි"විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය පිළිබඳව විගමණික ශ්‍රමිකයන් දැනුවත් කිරීම. | ඇතුළත් කිරීම් 18,583 | සාමාජිකත්වයන් - 62 |
| 13. | පළමු වරට කාර්යාංශයේ ලියාපදිංචි වූ කාන්තා සංක්‍රමණික සේවිකාවන් සඳහා තෑගි වවුචර පිරිනැමීම | 52 | 0.52 |

## ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම




## පාසල් උපකරණ බෙදාදීම




## සේවක සුභසාධන අරමුදලෙන් ආධාර





## ආබාධිත තත්ත්ව සඳහා ආධාර පිරිනැමීම






| අනු අංක | ක්‍රියාකාරකම | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව | වියදම (රු.මි.) |
| 01. | සංක්‍රමණික සේවකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම | 872 | 86.4 | 2,755 | 3.3 | 2,064 | 57.3 |
| 02. | පාසල් උපකරණ සඳහා ආධාර සැපයීම. | 46 | 0.54 | 789 | 7.4 | 956 | 12 |
| 03. | කම්කරු සුබසාධන අරමුදල යටතේ විශේෂ සහය ලබාදීම. | 131 | 26.92 | 66 | 14.025 | 142 | 31.27 |
| 04. | පකිස්ථානයේදී ඝාතනයට ලක්වූ ප්‍රියන්ත කුමාරගේ පවුලට ආධාරයක් ලබාදීම. | 3 | 2.5 | - | - | - | - |
| 05. | විගමණික ශ්‍රමිකයන්ට ලබාදුන් නිවාස ණයට අදාළ පොලියෙන් කොටසක් කාර්යාංශය විසින් ප්‍රතිපූරණය කිරීම. | 4 | 0.099 | 4 | 0.005 | 0 | 0 |
| 06. | සංක්‍රමණික සේවකයින් වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවීම. | 72,946 | 96.34 | 314,057 | 444.49 | 194,247 | 430.2 |
| 07. | හිමිකම් රක්ෂණ ප්‍රතිලාභ සඳහා හිමිකම් පාන්නන්ට සහාය වීම. | 640 | 130.29 | 551 | 111.685 | 782 | 129.355 |
| 08. | වෛද්‍ය ප්‍රතිකාර, නිර්දේශිත ඖෂධ, ආහාර සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා ගෙවීමට සංක්‍රමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට සහායවීම. | 5 | 0.248 | 15 | 0.221 | 22 | 1.19 |
| 09. | ආබාධිත සංක්‍රමණික සේවකයින් සඳහා නිවාස ඉදිකිරීම සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබා දීම. | 2 | 0.60 | 06 | 2.1 | 1 | 0.35 |
| 10. | සංක්‍රමණික සේවකයින්ගේ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා විශේෂ ආධාර ලබා දීම. | 14 | 0.188 | 11 | 0.633 | 3 | 0.675 |
| 11. | පවත්වන ලද වෛද්‍ය කඳවුරු සංඛ්‍යාව. | 0 | 0 | 2 | 0.629 | 4 | 3.11 |
| 12. | ළමා ආරක්ෂාව සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 0 | 0 | - | - | - | - |
| 13. | සංක්‍රමණික සේවකයින් හෝ පවුලේ අය සඳහා බස් ගාස්තු / ආහාර ලබාදීම. | 7 | 0.001 | 182 | 0.66 | 282 | 2.23 |
| 14. | ආපදා තත්ත්වයකදී සංක්‍රමණික සේවකයින්ගේ පවුල්වලට සහය වීම. | 0 | 0 | 5 | 0.75 | 1 | 0.015 |
| 15. | කොවිඩ්-19 හේතුවෙන් මියගිය සංක්‍රමණික සේවකයින් වෙනුවෙන් ආගමික කටයුතු සඳහා රු.40,000/- මුදලක් ලබාදීම. | 83 | 3.32 | - | - | - | - |
| 16. | නිරෝධායන සේවකයින් සඳහා ගෙවීම්. | 575 | 25.08 | - | - | - | - |
| | **කාර්ය සාධනය** | **75,328** | **372.526** | **318,443** | **585.928** | **198,504** | **667.695** |

## ආබාධිත සංක්‍රමණික සේවකයින් සඳහා නිවාස ඉදිකිරීම





## "මනුසවි" බහුකාර්ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ උත්සවය

"මනුසවි" යනු ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ට සහනදායී පොලී අනුපාත යටතේ උපකාර කිරීම සඳහා කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද බහුකාර්ය ණය යෝජනා ක්‍රමයකි. බලපත්‍රලාභී බැංකු සම්බන්ධ කර ගනිමින් මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ඔස්සේ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ සුබසාධනය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබේ.

ප්‍රථම වරට විදේශ රැකියා සඳහා පිටත්ව යන ගෘහාශ්‍රිත අංශයේ සංක්‍රමණික සේවිකාවන් සඳහා වියළි සලාක පැකේජ ප්‍රදානය කිරීම.







## පැය 24 තොරතුරු සේවා




ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පැය 24 පුරා ක්‍රියාත්මක වන තොරතුරු මධ්‍යස්ථානය මගින් ඕනෑම පුද්ගලයෙකුට විදේශ රැකියා පිළිබඳව තොරතුරු සැපයීමට සහ සංක්‍රමණික සේවකයින්ගෙන් හෝ ඔවුන් වෙනුවෙන් පැමිණිලි භාරගැනීම සිදු කරයි. ඕනෑම පුද්ගලයෙකුට ක්ෂණික ඇමතුම් අංකයක් (1989) සහ විශේෂිත දුරකථන මාර්ග (011-2879900), විද්‍යුත් තැපැල (infor_center@slbfe.lk), ස්කයිප් (24 hours call center - SLBFE) සහ Whatsapp / Viber / Imo (+94719802822) ඔස්සේ තොරතුරු මධ්‍යස්ථානය සම්බන්ධ කර ගත හැක.

## නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සඳහා සහය

ආපසු පැමිණි සංක්‍රමණික සේවකයින්ට ඔවුන්ගේ නැවත සමාජගත කිරීම සහ සුබසාධනය සඳහා සහාය වීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ආධාර සහ ක්‍රියාකාරකම් රාශියක් සපයයි. එමගින්, මෙරටට ආපසු පැමිණි සංක්‍රමණික සේවකයින් ශ්‍රී ලාංකීය සමාජයට නැවත ඒකාබද්ධ කිරීමට සහය ලබා දෙන අතර රටේ ආර්ථිකයට සහ සංවර්ධනයට ඔවුනට ධනාත්මක ලෙස දායක විය හැකි බව සහතික කරයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රත්‍යානුකලන අංශය අනෙකුත් අදාළ ආයතන ඇතුළු දිස්ත්‍රික් සම්බන්ධීකරණය සමඟින් බොහෝ ක්‍රියාකාරකම් සිදු කරයි. ආපසු පැමිණි සංක්‍රමණික සේවකයින් ශ්‍රී ලාංකීය සමාජයට සහ ශ්‍රම බලකායට නැවත අනුගත වීම සඳහා සහාය වීමට මෙම අංශය කැපවී සිටී. විදේශයන්හි සිටින සංක්‍රමණික ශ්‍රමිකයින් විසින් ලබා ගන්නා ලද අත්දැකීම් සහ නිපුණතා ඔවුන් ආපසු පැමිණීමෙන් පසු ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව එය සහතික කරයි.

ප්‍රත්‍යානුකලන අංශය බොහෝ විට අනෙකුත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර ආයතන සමඟ එක්ව පහත සඳහන් වැඩසටහන් සහ මුල පිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගීව කටයුතු කරයි.

- තිරසාර ආදායම් උත්පාදන අවස්ථා සංවර්ධනය කිරී.ම
- ප්‍රජා සංවර්ධනයට දායක වීම සඳහා ආපසු පැමිණි සංක්‍රමණික සේවකයන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම.
- සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා සහාය වන ප්‍රතිපත්ති සහ භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.

මෙම විස්තීර්ණ සේවාවන් සහ ආධාරක යාන්ත්‍රණයන් ලබා දීමෙන්, ආපසු පැමිණි සංක්‍රමණික සේවකයන්ට සාර්ථකව ශ්‍රී ලාංකේය සමාජයට නැවත සම්බන්ධ වීමට සහ ඔවුන්ගේ ප්‍රජාවන්ට සහ ජාතික ආර්ථිකයට අර්ථවත් දායකත්වයක් ලබා දීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රත්‍යානුකලන අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.




කාර්යාංශයේ ලියාපදිංචිය සහිතව විදේශ රැකියාවකට ගොස් වසර 05ක් නොඉක්මව නැවත මෙරටට පැමිණි සංක්‍රමණික සේවකයන්ට උපරිම රු. 50,000/-කට යටත්ව ස්වයං රැකියා ආරම්භ කිරීමට සහ ආරම්භ කර ඇති ස්වයං රැකියා වැඩිදියුණු කිරීමට ද්‍රව්‍යමය ආධාර ලබා දීම.




| අනුක්‍රමික අංකය | පළාත | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල් ප්‍රමාණය රු. |
|---|---|---|---|
| 01. | මධ්‍යම පළාත | 14 | 685,313 |
| 02. | ඌව පළාත | 9 | 449,700 |
| 03. | සබරගමුව පළාත | 10 | 483,600 |
| 04. | උතුරු මැද පළාත | 5 | 250,000 |
| 05. | වයඹ පළාත | 8 | 399,975 |
| 06. | දකුණු පළාත | 41 | 2,046,998 |
| 07. | බස්නාහිර පළාත | 10 | 492,490 |
| 08. | උතුරු පළාත | 17 | 845,292 |
| 09. | නැගෙනහිර පළාත | 1 | 50,000 |
| එකතුව | | 115 | 5,703,368 |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය සහිත විදේශ රැකියාවකට ගොස් වසර 05ක් නොඉක්මවන ආපසු පැමිණි සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ දරුවන්ට එක් දරුවෙකුට රුපියල් 10,000/= ක උපරිමයකට යටත්ව අධ්‍යාපනික සහනයක් යටතේ පාසල් උපකරණ ලබා දීම.





**ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම් හා ඒවා ප්‍රවර්ධනය කිරීම.**

- පුහුණු කිරීම්
- බඳවාගැනීම්
- රැකියා ප්‍රවර්ධනය

## පුහුණු කිරීම්

කාර්යාංශය සංක්‍රමණික සේවකයින්ට ඔවුන්ගේ ආරක්ෂාව, යහපැවැත්ම සහ වෘත්තීය නිපුණතාවය සහතික කිරීම සඳහා මනා පුහුණුවක් ලබා දෙයි. කාර්යාංශයේ පුහුණු අංශ; පුහුණු (ගෘහස්ථ) සහ පුහුණු (කාර්මික සහ ආයතනික) යන අංශ ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් ආරක්ෂාව සහ විදේශයන්හි සාර්ථකත්වයක් අත්කර ගැනීමේ හැකියාවක් ලබන අයුරින් ඔවුන්ව හොඳින් සූදානම්කර ඇති බව සහතික කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

පරිපූර්ණ පූර්ව පිටත්වීම් සහ වෘත්තීය පුහුණුව ලබා දීමෙන්, කාර්යාංශය විසින් ශ්‍රමිකයින් සූරාකෑමෙන් ආරක්ෂා කිරීම සහ විදේශීය පරිසරයන් තුළ දියුණු වීමට අවශ්‍ය දැනුම සහ කුසලතා වලින් ඔවුන්ව සවිබල ගැන්වීම අරමුණු කරයි. මෙම පුහුණු කිරීම් මගින් වඩා හොඳ වැටුප් සහිත රැකියා සුරක්ෂිත කිරීමට වැඩි ඉඩක් ඇති බැවින් එය ශ්‍රී ලංකා ආර්ථිකයට ප්‍රේෂණ වැඩි වීමටද හේතුවේ. භාෂා සහ සංස්කෘතික පුහුණුව සේවකයින්ට ඔවුන්ගේ සත්කාරක රටවලට වඩාත් සුමට ලෙස ඒකාබද්ධ වීමට උපකාර කරයි, හුදකලා වීමේ අවදානම සහ සංස්කෘතික වරදවා වටහාගැනීම් අඩු කරයි.

**පුහුණු අංශය (ගෘහස්ථ) විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් :**

- ගෘහ සේවිකාවන් ලෙස මැදපෙරදිග රටවලට පිටත්ව යන කාන්තා සේවිකාවන් සඳහා දින 28 ක පුහුණු වැඩසටහන (නේවාසික පුහුණු සුදුසුකම් NVQ - III මට්ටම ප්‍රමිතිය).
- ගෘහස්ථ ගෘහ පාලන සහකාර ලෙස යුරෝපයට සහ නැගෙනහිර ආසියාතික රටවලට පිටත්ව යන කාන්තා ශ්‍රමිකයින් සඳහා දින 28 ක නිශ්චිත පුහුණු වැඩසටහන (නේවාසික පුහුණු සුදුසුකම් NVQ - III මට්ටම).
- ඉදිරියේදී සාත්තු සේවක ලෙස යාමට අපේක්ෂා කරන රැකියා අපේක්ෂකයින් සඳහා දින 45 ක පුහුණු වැඩසටහන. (සුදුසුකම් ලබන NVQ - III මට්ටම).
- සේවා පළපුරුද්ද යල් පැන ගිය සහ අතීත අත්දැකීම් සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ නොහැකි අය සඳහා නැවත පිටත්වන කාන්තාවන් සඳහා දින 7 ක පුහුණු පාඨමාලාව.
- ඉදිරියේදී සාත්තු සේවක ලෙස ඊශ්‍රායලයට යාමට අපේක්ෂා කරන තෝරාගත් රැකියා අපේක්ෂකයින් සඳහා දින 7ක පුහුණුව.
- සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම.
- අනාගත රැකියා සොයන්නන් සඳහා විදේශ රැකියා ඉලක්ක කරගත් ඉංග්‍රීසි භාෂා පුහුණුව.
- TVEC සමඟ එක්ව ගෘහාශ්‍රිත ගෘහ පාලනය සහ රැකවරණ පුහුණු වැඩසටහන සාර්ථකව නිම කළ සංක්‍රමණික සේවකයන්ට NVQ - III මට්ටමේ සහතික ප්‍රදානය කිරීම.

| පුහුණු ක්‍රියාකාරකම්හි කාර්ය සාධන සාරාංශය | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | පන්ති ගණන |
|---|---|---|
| ගෘහස්ත ගෘහ පාලන සහකාර - මැද පෙරදිග අංශය (දින 28) | 7,373 | 307 |
| ගෘහස්ත ගෘහ පාලන සහකාර - යුරෝපය සහ නැගෙනහිර ආසියාව (දින 28) | 1,030 | 43 |
| සාත්තු සේවක (දින 45) තක්සේරු NVQ III මට්ටම සමඟ | 2,609 | 74 |
| සාක්ෂරතා පුහුණු වැඩසටහන (දින 18) - සිංහල සහ දෙමළ භාෂා | 16 | 03 |
| විදේශ පලපුරුදු ඇතත් පුහුණු සහතික නොමැති පිරිස සඳහා(IFE)⋆ පුහුණු වැඩසටහන (දින 7) | 693 | 46 |
| ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන | 902 | 27 |
| ඊශ්‍රායලයේ නිවෙස් පදනම් කරගත් සාත්තු සේවක වශයෙන් පිටත්වන්නන් සඳහා දිශානති වැඩසටහන | 667 | 33 |

## කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානවල තිබෙන පුහුණු පාඨමාලා

| මධ්‍යස්ථානය | මැදපෙරදිග (දින 28) | නැගෙනහිර ආසියාව (දින 28) | සාත්තු සේවක (දින 45) | IFE ⋆ (දින 7) | සාක්ෂරතාව (දින 18) | ඉංග්‍රීසි (දින 14) | ඊශ්‍රායලයට නිවෙස් පදනම් කරගත් සාත්තු සේවක සඳහා පූර්වගාමී දිශානති වැඩසටහන (දින 7) |
|---|---|---|---|---|---|---|---|
| හලාවත | | | | ✓ | | | |
| දඹුල්ල | ✓ | | | | | | |
| කුරුණෑගල | | ✓ | | ✓ | | ✓ | |
| නුවර | ✓ | | | ✓ | | | |
| මතුගම | ✓ | ✓ | | | | | |
| පන්නිපිටිය | ✓ | | ✓ | ✓ | | ✓ | |
| රත්නපුර | ✓ | | ✓ | | ✓ | ✓ | ✓ |
| තංගල්ල | ✓ | ✓ | ✓ | | | ✓ | |
| බදුල්ල | ✓ | | ✓ | | | ✓ | |







**පුහුණු (කාර්මික හා ආයතනික) අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් :**

- පිරිමි/කාන්තා රැකියා අපේක්ෂකයින් සඳහා පිටත් වීමට පෙර දිශානති පුහුණු වැඩසටහන්.
- කොරියානු රැකියා අපේක්ෂකයින් සඳහා පිටත්වීමට පෙර පුහුණු වැඩසටහන්.
- දිවයින පුරා කාර්යාංශයේ ලියාපදිංචි වෙල්ඩින් පුහුණු ආයතනවලින් FCAW සහතික නිකුත් කිරීම පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ජපන් රැකියා අපේක්ෂකයින් සඳහා ජපන් භාෂා පුහුණු වැඩසටහන්.
- ජපානයට සම්බන්ධ රැකියා සොයන්නන් සඳහා පිටත්වීමට පෙර පුහුණු වැඩසටහන් (TITP).
- ඊශ්‍රායල කෘෂිකර්ම රැකියා අපේක්ෂකයින් සඳහා පිටත්වීමට පෙර පුහුණු වැඩසටහන්.
- උපදේශකයින් සඳහා TOT වැඩසටහන්.
- පුහුණු මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම (කාර්යාංශය සහ පුද්ගලික).
- පුහුණු පාඨමාලා සඳහා පුහුණු සහතික පිරිනැමීම.







| පුහුණු ක්‍රියාකාරකම්හි කාර්ය සාධන සාරාංශය | 2021 | | 2022 | | 2023 | |
|---|---|---|---|---|---|---|
| | අභ්‍යාස ලාභීන් සංඛ්‍යාව | පන්ති ගණන | අභ්‍යාස ලාභීන් සංඛ්‍යාව | පන්ති ගණන | අභ්‍යාස ලාභීන් සංඛ්‍යාව | පන්ති ගණන |
| දිශානති වැඩසටහන් (ගෘහස්ත ගෘහ පාලන සහකාර හැර වෙනත්) - දින 2 | 18,166 | 1,706 | 15,273 | 1,592 | 57,201 | 2,028 |
| පිටත්වීමට පෙර කොරියානු පුහුණුව | 572 | 25 | 1,410 | 43 | 3,643 | 88 |
| ජපන් භාෂා වැඩසටහන | 2,932 | 170 | 3,660 | 98 | 616 | 30 |
| ජපානයේ රැකියා අපේක්ෂකයින් සඳහා පෙර පිටත්වීමේ පුහුණුව (TITP) | 138 | 16 | 65 | 07 | 115 | 15 |

## බඳවාගැනීම්

බඳවා ගැනීමේ ක්‍රියාකාරකම් වන්නේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විදේශයන්හි යහපත් සහ ආරක්ෂිත රැකියා සුරක්ෂිත කිරීම, ඔවුන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීම සහ ප්‍රේෂණ මගින් ජාතික ආර්ථිකයට දායක වීම සහතික කිරීමයි.

මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙන්, ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා සුරක්ෂිත සහ මනා පරිසරයක් නිර්මාණය කිරීමට, ඔවුන්ගේ සමස්ත අත්දැකීම් වැඩිදියුණු කිරීමට සහ බඳවා ගැනීමේ සහ රැකියා ක්‍රියාවලිය පුරාවට ඔවුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට කාර්යාංශය උත්සහ කරයි.

**බඳවා ගැනීමේ (සාමාන්‍ය) අංශය සහ බඳවා ගැනීමේ (කොරියාව) අංශය** බඳවා ගැනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීමට, සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය සුරක්ෂිත කිරීමට සහ විදේශ රැකියා අංශය තුළ සදාචාරාත්මක භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට ඒකාබද්ධව කටයුතු කරයි.

**බඳවා ගැනීමේ (සාමාන්‍ය) අංශය** විසින් පහත බඳවා ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

❖ ජපානය සඳහා සේවකයින් බඳවා ගැනීම

ජපානයේ International Manpower Organization මගින් කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභින් (Technical Intern Trainees) යොමු කිරීම.

ජපානයේ International Relations Organization මගින් කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභින් (Technical Intern Trainees) යොමු කිරීම.

ජපානයේ රැකියා සඳහා නිශ්චිත පුහුණු සේවකයින් (Specified skilled workers) යොමු කිරීම.

❖ ඊශ්‍රායලය සඳහා ගෘහ ආශ්‍රිත සාත්තුසේවක /සේවිකාවන් බඳවා ගැනීම

**ජපානයේ International Manpower Organization හරහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභින් (Technical Intern Trainees) පිටත්වීම්**

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාත්තු සේවය | 08 | 00 | 03 | 00 | 08 | 00 | 02 | 10 | 01 | 05 | 00 | 03 | 40 |
| ඉදි කිරීම් | 05 | 02 | 00 | 00 | 04 | 00 | 14 | 00 | 07 | 10 | 00 | 02 | 44 |








**ජපානයේ International Relations Organization මගින් කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් (Technical Intern Trainees) යොමු කිරීම**

| අංශය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාත්තු සේවය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ඉදි කිරීම් | - | - | - | - | - | - | - | - | 03 | - | 03 | - | 06 |
| කාර්මික ඇසුරුම් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ආහාර සකස් කිරීම | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |





**ජපානයේ රැකියා සඳහා නිශ්චිත පුහුණු සේවකයින් (Specified skilled workers) යොමු කිරීම**

මෙම වැඩසටහන යටතේ රැකියා ක්ෂේත්‍ර 14ක් පවතින අතර ශ්‍රී ලාංකිකයින්ට පහත සඳහන් කාණ්ඩ සඳහා නිපුණතා පරීක්ෂණ සඳහා ජපාන රජය විසින් අවස්ථා ලබා දී ඇත.

01. හෙද සත්කාර සේවය
02. ආහාර සේවා කර්මාන්තය
03. කෘෂිකර්මය



2023.10.11 දින මෙරටට පැමිණි ජපානයේ නියෝජිත පිරිස

ඊශ්‍රායලය සඳහා ගෘහ ආශ්‍රිත සාත්තුසේවක/සේවිකාවන් බඳවා ගැනීමේ වැඩසටහන

| අනු අංකය | විස්තරය | ස්ත්‍රී පුරුෂ භාවය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | කාර්යාංශයේ ලියාපදිංචි අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | 74 | 123 | 88 | 55 | 51 | 54 | 34 | 57 | 45 | 16 | 76 | 187 | 860 |
| | | ගැහැණු | 85 | 124 | 109 | 76 | 74 | 64 | 98 | 89 | 82 | 46 | 296 | 282 | 1,425 |
| 02 | ඊශ්‍රායලය වෙත යොමු කරන ලද සුදුසුකම් ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | | ගැහැණු | 144 | 164 | 57 | 46 | 146 | 61 | 73 | 37 | 48 | 59 | 39 | 104 | 978 |
| 03 | ලොතරැයි ක්‍රමය මඟින් ඊශ්‍රායලය විසින් තොරා ගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | | ගැහැණු | 189 | - | 197 | - | 127 | - | 74 | 71 | 61 | 74 | - | - | 793 |
| 04 | ගිවිසුම් ලැබූ සංඛ්‍යාව | පිරිමි | 02 | 01 | 05 | 04 | 10 | 08 | 14 | 11 | 11 | 14 | 13 | 13 | 106 |
| | | ගැහැණු | 15 | 14 | 31 | 29 | 48 | 73 | 99 | 87 | 64 | 65 | 61 | 118 | 704 |
| 05 | අවලංගු වූ ගිවිසුම් සංඛ්‍යාව | පිරිමි | - | - | - | 01 | 01 | - | - | - | | 01 | 02 | | 05 |
| | | ගැහැණු | 02 | 03 | 01 | 01 | 04 | 05 | 09 | 06 | 01 | 04 | 03 | 06 | 45 |
| 06 | සේවා ගිවිසුම් අත්සන් කරනලද අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | 02 | - | 06 | 04 | 09 | 07 | 09 | 14 | 09 | 13 | 10 | 13 | 96 |
| | | ගැහැණු | 14 | 14 | 28 | 31 | 44 | 67 | 66 | 94 | 74 | 62 | 68 | 116 | 678 |
| 07 | පිටත්වීම් සංඛ්‍යාව | පිරිමි | 02 | 03 | 01 | 04 | 05 | 07 | 06 | 11 | 10 | 03 | 24 | 13 | 89 |
| | | ගැහැණු | 11 | 10 | 11 | 35 | 29 | 40 | 45 | 76 | 63 | 19 | 117 | 57 | 513 |
| 08 | යාමට කැමැත්තක් නැති / ප්‍රතිචාර නොදක්වන අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | - | - | - | 01 | - | - | - | - | - | 01 | - | - | 02 |
| | | ගැහැණු | 01 | - | 04 | 01 | 03 | 05 | 06 | 01 | 03 | 04 | 06 | 04 | 38 |








2004 වසරේ අත්සන් කරන ලද රජයන් දෙක අතර වරින් වර අලුත් කෙරෙන අවබෝධතා ගිවිසුමට අනුව කොරියාවේ රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ දකුණු කොරියානු ජනරජයට ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් බඳවා ගැනීමට **බඳවා ගැනීමේ අංශය (කොරියාව)** පහසුකම් සපයයි.

**කොරියාවට පිටත්වීම**

| අංශය | 2021 | 2022 | 2023 | එකතුව |
|---|---|---|---|---|
| සාමාන්‍ය | 152 | 4,594 | 3,786 | 8,532 |
| විශේෂ | 02 | 888 | 1,205 | 2,095 |
| නැවත ඇතුල් වීම | 954 | 1,157 | 1,421 | 3,532 |
| **මුළු සංඛ්‍යාව** | **1,108** | **6,639** | **6,412** | **14,159** |







**www.slbfe.lk**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් රැකියා අපේක්ෂකයින්ට මාර්ග ගත රැකියා බැංකුව ඔස්සේ ලියාපදිංචි වී විදේශ රැකියා අවස්ථාවන් සොයාගැනීම සඳහා පහසුකම් සලසයි.ඔවුන්ට මාර්ග ගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වීමට හෝ කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයට හෝ දිවයින පුරා පිහිටුවා ඇති පළාත් කාර්යලයක් වෙත අයදුම්පත් යොමු කිරීම සිදු කල හැක. බලපත්‍රලාභි විදේශ රැකියා නියෝජිතායතවලට හා සේවායෝජකයින්ට ඔවුන් සතු පුරප්පාඩු සඳහා මාර්ග ගත රැකියා බැංකුව මගින් සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීමට ද පහසුකම් සලසා ඇත.

## රැකියා ප්‍රවර්ධන

විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා අවස්ථා සහ රැකියා තත්ත්වයන් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් කාර්යාංශය විසින් රැකියා ප්‍රවර්ධන කටයුතු සිදු කරයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ **අලෙවිකරණ අංශය** මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

**කාර්යාංශය විසින්;**

- සුදුසුකම්ලත් සේවකයින්ව සෘජුවම ජාත්‍යන්තර සේවා යෝජකයින්/ බලපත්‍රලාභී රැකියා නියෝජිතායතන සමඟ සම්බන්ධ කිරීම සඳහා රැකියා පොළවල් සහ බඳවා ගැනීමේ වැඩසටහන් සංවිධානය කරයි.
- ආරක්ෂිත සංක්‍රමණ පිළිවෙත්, සේවකයින්ගේ අයිතිවාසිකම් සහ නීතිවිරෝධී සංක්‍රමණයේ අවධානම් පිළිබඳව සුදුසුකම්ලත් සේවකයින්ව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි.
- විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින පුද්ගලයින්ට මගපෙන්වීම සහ ආධාර සැපයීම සඳහා ශ්‍රී ලංකාව පුරා තොරතුරු මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරයි.
- නැගී එන රැකියා අවස්ථා සහ ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ පිළිබඳ පර්යේෂණ සිදුකරයි.
- පර්යේෂණ සොයාගැනීම් මත පදනම්ව ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා අවස්ථා විවිධාංගීකරණය කිරීම සඳහා නව රැකියා වෙළඳපොල ප්‍රවර්ධනය කරයි
- ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට රැකියා අවස්ථා විවිධාංගීකරණය කිරීම සඳහා නව රැකියා වෙළෙඳපොළ ප්‍රවර්ධනය කරයි.

| දිවයින පුරා පවත්වන ලද රැකියා පොළවල් | පවත්වන ලද රැකියා පොළවල් ගණන | සහභාගී වූ රැකියා සොයන්නන් සංඛ්‍යාව | සහභාගී වූ ලියාපදිංචිගත බඳවා ගැනීමේ ඒජන්සි සංඛ්‍යාව | මූලිකව තෝරාගත් රැකියා සොයන්නන් සංඛ්‍යාව | රැකියා බැංකුව ඔස්සේ ලැබුණු අයදුම්පත් ගණන |
|---|---|---|---|---|---|
| | 2023 | 2023 | 2023 | 2023 | 2023 |
| ඌව පළාත | 11 | 939 | 34 | 511 | 406 |
| නැගෙනහිර පළාත | 5 | 261 | 9 | 84 | 65 |
| මධ්‍යම පළාත | 13 | 3,017 | 44 | 356 | 111 |
| උතුරු පළාත | 4 | 380 | 15 | 40 | 366 |
| දකුණු පළාත | 6 | 1,809 | 22 | 421 | 0 |
| සබරගමුව පළාත | 10 | 3,844 | 84 | 562 | 21 |
| උතුරු මැද පළාත | 2 | 164 | 8 | 64 | 9 |
| බස්නාහිර පළාත | 14 | 2,318 | 38 | 1,019 | 227 |
| වයඹ පළාත | 4 | 367 | 31 | 0 | 94 |
| එකතුව | 69 | 13,099 | 285 | 3,057 | 1,299 |









# "Glocal Fair" - යාපනය







කාර්යාංශයේ සේවාවන්, ප්‍රතිපත්ති සහ මුලපිරීම් පිළිබඳව දැනුවත් කිරීම සහ තොරතුරු බෙදා හැරීම සඳහා ප්‍රචාරක අංශය ක්‍රියාත්මක වේ. කාර්යාංශයේ සේවාවන් පිළිබඳ නිවැරදි සහ අදාළ තොරතුරු පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ළඟා කරමින් විදේශ රැකියා ප්‍රවර්ධනය සහ නියාමනය කිරීමට කටයුතු කරන කාර්යාංශයේ මෙහෙවර තහවුරු කරනු ලබයි.

**ප්‍රචාරක අංශයේ ප්‍රධාන කාර්යයන් :**

- තොරතුරු බෙදා හැරීම.
- මහජන දැනුවත් කිරීමේ වැඩසටහන්.
- ඩිජිටල් සහ සමාජ මාධ්‍ය ව්‍යාප්තිය.
- කාර්යාංශය විසින් සංවිධානය කරන ලද රැකියා පොළවල්, බඳවා ගැනීමේ වැඩසටහන් සහ අනෙකුත් ප්‍රවර්ධන වැඩසටහන් ප්‍රචාරණය කිරීම.

## රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන්







## සමාජ මාධ්‍ය




## බැනර්/පත්‍රිකා



## මාධ්‍ය ආවරණ ජපානයේ IRO ආයතනයේ නිලධාරීන්ගේ හමුව



## පරිපාලන හා මානව සම්පත් අංශය

කාර්යාංශයේ පරිපාලන හා මානව සම්පත්, ප්‍රසම්පාදන, නඩත්තු, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, අභ්‍යන්තර විගණන සහ පර්යේෂණ යන අංශ සිය මෙහෙයුම් විශිෂ්ටත්වය සහ අඛණ්ඩතාව සහතික කරමින් ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා නියාමනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වන කාර්යාශයේ මෙහෙවර ක්‍රියාත්මක කිරීම සඳහා මනා කාර්යභාරයක් ඉටු කරයි.

**කාර්යාංශයේ අභ්‍යන්තර මෙහෙයුම් සහ උපකාරක සේවාවන් කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණය සඳහා වගකීම දරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් :**

- මානව සම්පත් කළමනාකරණය : දක්ෂ හා අභිප්‍රේරිත ශ්‍රම බලකායක් සහතික කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පුහුණුව, කාර්ය සාධනය ඇගයීම සහ සංවර්ධනය කිරීම අධීක්ෂණය කිරීම.
- පහසුකම් කළමනාකරණය : හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කාර්යාල පහසුකම්, යටිතල පහසුකම් සහ උපකරණ කළමනාකරණය කිරීම.
- ප්‍රසම්පාදන සහ සැපයුම්: භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන හැසිරවීම, කොන්ත්‍රාත්තු කළමනාකරණය කිරීම සහ කාලෝචිත සහ ලාභදායී සැපයුම් සහාය සහතික කිරීම.
- වාර්තා සහ ලේඛනः නිවැරදි වාර්තා පවත්වා ගැනීම, ලේඛන කළමනාකරණය සහ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම.
- සම්බන්ධීකරණය සහ සන්නිවේදනයः අභ්‍යන්තර සන්නිවේදනයට පහසුකම් සැලසීම, විවිධ දෙපාර්තමේන්තු හරහා ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ සුමට මෙහෙයුම් කාර්ය ප්‍රවාහයක් සහතික කිරීම.

## විගණන අංශය

කාර්යාංශයෙහි ක්‍රමානුකූල ඇගයීම සහ අධීක්ෂණය තුළින් විනිවිදභාවය, වගවීම සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා කැපවී සිටී.

- අවදානම් තක්සේරුව: කාර්යාංශයෙහි ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සහ ඒවා අවම කිරීමට පියවර නිර්දේශ කිරීම.
- අනුකූලතා විගණනː කාර්යාංශයේ සියලුම මෙහෙයුම් අදාළ නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වන බව සහතික කිරීම.
- මූල්‍ය විගණනː අරමුදල්වල නිරවද්‍යතාවය, අඛණ්ඩතාව සහ නිසි භාවිතය සහතික කිරීම සඳහා මූල්‍ය ගනුදෙනු, ගිණුම් සහ වාර්තා සමාලෝචනය කිරීම.
- මෙහෙයුම් විගණනː මෙහෙයුම් ක්‍රියාවලීන්ගේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඇගයීම සහ වැඩිදියුණු කිරීම් නිර්දේශ කිරීම.
- වාර්තා කිරීම සහ නිර්දේශː පාලනය සහ පාලන යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම සඳහා සොයාගැනීම් සහ ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ සහිත විගණන වාර්තා කළමනාකරණයට ලබා දීම.

ප්‍රධාන කාර්යාලය, විදේශයන්හි පිහිටි දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශ ඇතුළු දේශීය සහ විදේශීය කාර්යාල, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ විදේශ බඳවාගැනීම් ආයතන සම්බන්ධ කරන පුළුල් ප්‍රදේශීය ජාලය (Wide Area Network) මඟින් කාර්යාංශයේ මෙහෙයුම් කටයුතුවල කාර්යාක්ෂමතාව වැඩිදියුණු කෙරේ.

## IOM ශ්‍රී ලංකා සමඟ සහයෝගීතාවයෙන් පැවති සංක්‍රමණය පිළිබඳ කොළඹ ක්‍රියාදාම කලාපීය ප්‍රතිපත්ති සවාදය







## දකුණු කොරියාවේ හයුන්ඩායි හෙවි ඉන්ඩස්ට්‍රීස් පුහුණුව සහ නැව් තැනීමේ අංශයේ සංක්‍රමණික සේවකයින් සහතික කිරීම වෙනුවෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම



## නිශ්චිත පුහුණු සේවක වැඩසටහන (Specified Skilled Worker Program) පිළිබඳ ජපානයේ IM Japan සමඟ ගිවිසුමක් අත්සන් කිරීම



# මූල්‍ය දළ විශ්ලේෂණය

2023 - 2021 වර්ෂ දක්වා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය කාර්යසාධනය (රු.මිලියන)

**2023 - 2021 වර්ෂ දක්වා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය කාර්යසාධනය (රු.මිලියන)**

| | 2023 | 2022 | 2021 |
|---|---|---|---|
| | | | |
| මුළු ආදායම | 12,222 | 11,470 | 3,053 |
| මුළු වියදම | -4,438 | -3,680 | -2,421 |
| **බදු පෙර ලාභය** | **7,784** | **7,790** | **632** |
| | | | |
| ජංගම නොවන වත්කම් | 4,800 | 1,863 | 1,905 |
| ජංගම වත්කම් | 23,104 | 25,167 | 15,651 |
| **මුළු වත්කම්** | **27,904** | **27,030** | **17,556** |
| | | | |
| ජංගම වගකීම් | 3,457 | 3,855 | 1,756 |
| ජංගම නොවන වගකීම් | 5,549 | 5,538 | 4,257 |
| **මුළු වගකීම්** | **9,006** | **9,393** | **6,013** |
| | | | |
| **ශුද්ධ වත්කම්** | 18,898 | 17,637 | 11,543 |

ඉහත පෙන්වා ඇති පරිදි 2022 වර්ෂය සඳහා වූ රුපියල් මිලියන 11,470 ක සත්‍ය ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මුළු ආදායම රුපියල් මිලියන 12,222 ක් විය. 2022 වසරට සාපේක්ෂව කාර්යාංශයේ ආදායමේ සුළු දියුණුවක් ඇති විය. එය 2022 වසරට සාපේක්ෂව ස්ථාවර තැන්පතු සඳහා බැංකු විසින් ලබා දෙන ඉහළ පොලී අනුපාත හේතුවෙන් ආයෝජන මත පොලී ආදායමේ වැඩිවීමකි. සුබසාධන ආශ්‍රිත වැඩසටහන් රැසක් නැවත ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2022 වසරට සාපේක්ෂව සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුබසාධන වියදම් ඉහළ ගොස් ඇත.

**2023 - 2021 කාර්යාංශ ආදායම**



2023 - 2013 වර්ෂ දක්වා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය කාර්යසාධනය (රු.මිලියන)

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| මුළු ආදායම | 2,871 | 3,461 | 2,978 | 3,974 | 3,692 | 4,471 | 4,218 | 1,780 | 3,053 | 11,470 | 12,222 |
| මුළු වියදම | -2,561 | -3,044 | -2,528 | -2,663 | -2,623 | -2,946 | -3,169 | -2,411 | -2,421 | -3,680 | -4,438 |
| **බදු පෙර ලාභය** | **310** | **417** | **450** | **1,311** | **1,069** | **1,525** | **1,049** | **-631** | **632** | **7,790** | **7,784** |
| | | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 2,238 | 5,356 | 7,060 | 7,620 | 6,729 | 2,648 | 2,244 | 2,088 | 1,905 | 1,863 | 4,800 |
| ජංගම වත්කම් | 8,736 | 6,645 | 6,079 | 6,469 | 8,385 | 13,898 | 14,554 | 14,440 | 15,651 | 25,167 | 23,104 |
| **මුළු වත්කම්** | **10,974** | **12,001** | **13,139** | **14,089** | **15,114** | **16,546** | **16,798** | **16,528** | **17,556** | **27,030** | **27,904** |
| | | | | | | | | | | | |
| ජංගම වගකීම් | 4,196 | 4,613 | 1,334 | 1,450 | 1,574 | 1,820 | 1,715 | 1,817 | 1,756 | 3,855 | 3,457 |
| ජංගම නොවන වගකීම් | 3,218 | 3,411 | 3,780 | 2,599 | 2,860 | 3,408 | 3,692 | 4,071 | 4,257 | 5,538 | 5,549 |
| **මුළු වගකීම්** | **7,414** | **8,024** | **5,114** | **4,049** | **4,434** | **5,228** | **5,407** | **5,888** | **6,013** | **9,393** | **9,006** |
| | | | | | | | | | | | |
| **ශුද්ධ වත්කම්** | **3,560** | **3,977** | **8,025** | **10,040** | **10,680** | **11,318** | **11,391** | **10,640** | **11,543** | **17,637** | **18,898** |
| | | | | | | | | | | | |
| **භාණ්ඩාගාරයට ගෙවන ලද මුදල්** | **වසර** | **2011** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2022** | **2023** | **එකතුව** | |
| | මුදල | 625 | 1,000 | 185 | 200 | 650 | 22 | 1,200 | 7,000 | 10,882 | |

කාර්යාංශයේ ආදායම්: 2013-2023 (රු.මිලියන)



කාර්යාංශයේ ප්‍රධාන ආදායම්: 2013-2023 (රු.මිලියන)

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| ලියාපදිංචි ගාස්තු (ඒජන්සි) | 511 | 527 | 285 | 385 | 308 | 300 | 311 | 83 | 188 | 555 | 711 |
| ලියාපදිංචි ගාස්තු (ස්වයං) | 600 | 654 | 617 | 1,107 | 1,076 | 1,151 | 1,017 | 276 | 690 | 1,757 | 1,774 |
| කොරියානු බඳවාගැනීම් ප්‍රවර්ධන ගාස්තු | 0 | 0 | 0 | 249 | 116 | 102 | 120 | 48 | 7 | 230 | 279 |
| පහසුකම් ගාස්තු | 58 | 59 | 50 | 48 | 42 | 42 | 40 | 11 | 25 | 61 | 59 |
| බලපත්‍ර ගාස්තු | 80 | 70 | 67 | 87 | 49 | 51 | 61 | 42 | 60 | 93 | 114 |
| සෙස් ආදායම | 22 | 292 | 255 | 202 | 158 | 194 | 198 | 55 | 317 | 943 | 986 |
| කොරියානු පරිපාලන ගාස්තු | 21 | 20 | 23 | 28 | 13 | 19 | 14 | 5 | 0.8 | 26 | 26 |
| නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තු | 9 | 3 | 7 | 15 | 14 | 16 | 14 | 7 | 17 | 23 | 25 |
| පුහුණු ආදායම | 237.8 | 222 | 205 | 198 | 132 | 155 | 217 | 66 | 192 | 575 | 366 |
| විදේශ තානාපති කාර්යාලවල ආදායම | 617 | 707 | 705 | 836 | 841 | 1172 | 1080 | 274 | 869 | 3,599 | 3,622 |
| මූල්‍ය ආදායම | 361 | 452 | 501 | 632 | 810 | 890 | 994 | 765 | 532 | 1,888 | 2,815 |



2013 - 2023 කාර්යාංශයේ ප්‍රධාන මෙහෙයුම් වියදම් - රු. මිලියන

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| කර්ය මණ්ඩල පිරිවැය | 670 | 819 | 941 | 1,342 | 1,415 | 1,577 | 1,744 | 1,467 | 1,341 | 1,893 | 1,875 |
| ආයතනික වියදම් | 244 | 293 | 268 | 488 | 476 | 549 | 525 | 391 | 412 | 581 | 782 |
| මෙහෙයුම් වියදම් | 245 | 260 | 241 | 297 | 255 | 317 | 327 | 299 | 278 | 402 | 528 |
| මූල්‍ය වියදම් | | | | 5 | 5 | 4 | 9 | 33 | 22 | 24 | 18 |
| වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණ | 82 | 201 | 33 | 25 | 12 | 9 | 13 | 7 | 8 | 20 | 115 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 45 | 98 | 25 | 29 | 36 | 45 | 68 | 9 | 5 | 93 | 82 |
| සුහසාධන - වෙනත් වියදම් | 1,273 | 1,372 | 1,018 | 476 | 422 | 442 | 481 | 204 | 352 | 664 | 1,036 |




## අපගේ ගණුදෙණුකාර බැංකු

# තිරසාරභාවය පිළිබඳව වාර්තාව

සදාචාරාත්මක බඳවා ගැනීම් සහතික කිරීම වෙනුවෙන් කාර්යාංශය දැඩි පාලන ප්‍රතිපත්ති අනුගමනය කරයි.

**කාර්යාංශය විසින්,**

- විදේශ රැකියා ඒජන්සි සඳහා බලපත්‍ර ලබා දීම සහ ඒවා අධීක්ෂණය කිරීම.
- මිනිස් ජාවාරම සහ නීති විරෝධී බඳවා ගැනීම් මැඩපැවැත්වීම සඳහා නීති ක්‍රියාත්මක කිරීම.
- සදාචාරාත්මක ශ්‍රම සංක්‍රමණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වයි.

**කාර්යාංශය සිය මෙහෙයුම් වලදී තිරසාර භාවිතයන් ඒකාබද්ධ කරන්නේ**

- කඩදාසි භාවිතය අඩු කිරීම සඳහා ඩිජිටල් විසඳුම් ක්‍රියාත්මක කිරීම.
- පරිසර හිතකාමී සේවා ස්ථාන ප්‍රතිපත්ති දිරිමත් කිරීම.
- ආර්ථිකමය වශයෙන් ඔරොත්තුදීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා තිරසාර මූල්‍ය ප්‍රේෂණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.

**සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්මට ප්‍රමුඛත්වය දෙමින් කාර්යාංශය පහත සඳහන් දෑ සපයයි**

- රැකියා අයිතිවාසිකම්, ආරක්ෂාව සහ සංස්කෘතික අනුවර්තනය පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම සඳහා පිටත්වීමට පෙර පුහුණුව.
- පීඩාවට පත් සේවකයින් සඳහා මූල්‍ය ආධාර සහ නීති ආධාර ඇතුළු සුභසාධන වැඩසටහන්
- දේශීය රැකියා සුරක්ෂිත කිරීම හෝ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා නැවත පැමිණෙන සේවකයින්ට සහාය වීම සඳහා නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන්.

**සංක්‍රමණික සේවකයින් සිය ප්‍රේෂණ හරහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැළකිය යුතු දායකත්වයක් සපයයි. කාර්යාංශය ජාතික සංවර්ධන ඉලක්ක සමග පෙළගැසෙන්නේ**

- ස්ථාවර ආර්ථික ගලා ඒම් සහතික කිරීම සඳහා විදේශ රැකියා අංශය ශක්තිමත් කිරීම.
- ශ්‍රී ලාංකික සේවකයින්ගේ ගෝලීය රැකියා හැකියාව වැඩිදියුණු කිරීම සඳහා කුසලතා සංවර්ධන මුලපිරීම් වැඩිදියුණු කිරීම.
- සාධාරණ කම්කරු ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**තිරසාරභාවය ඉදිරියට ගෙන යාම සඳහා කාර්යාංශය කැපවී සිටින්නේ**

- වැඩි ප්‍රවේශ්‍යතාවයක් සහ කාර්යක්ෂමතාවයක් සඳහා ඩිජිටල් සේවාවන් පුළුල් කිරීම.
- සේවක ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ගමනාන්ත රටවල් සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීම.
- ආරක්ෂිත සංක්‍රමණ පිළිවෙත් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ප්‍රජා සත්කාර වැඩසටහන් වැඩි කිරීම.
- කාර්යාංශය විසින් අනුගමනය කරන තිරසාර මුලපිරීම් මගින් සදාචාරාත්මක බඳවා ගැනීම්, සේවක ආරක්ෂාව සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව සහතික කෙරේ.

  අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සහ උපායමාර්ගික ප්‍රතිපත්ති ඔස්සේ කාර්යාංශය සේවකයින්ට සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ප්‍රතිලාභ ලබා දෙමින් තිරසාර විදේශ රැකියා කළමනාකරණයක් සඳහා කැපවී සිටී.

# විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පාර්ශවකරුවන්



# ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය (කාර්යාංශයට අනුබද්ධ ආයතනය)

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය, රජයට අනුබද්ධ එකම ඒජන්සි ආයතනය ලෙස 1996 දී ස්ථාපිත කරන ලදී. එහි ප්‍රධාන අරමුණ වන්නේ විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින අයට කාර්යක්ෂම, සුදුසු සේවාවක් සැපයීම සහ මෙරට ප්‍රාථමික බඳවා ගැනීමේ නියෝජිතායතනය ලෙස කටයුතු කිරීමයි. පූර්ණ රාජ්‍ය මැදිහත්වීම සහිතව සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය සඳහා රැකියා අවස්ථා සුරක්ෂිත කිරීම සඳහා විදේශ රැකියා ඒජන්සිය විදේශීය පාර්ශවයන් සමඟ කටයුතු කරයි.

මූල්‍ය තොරතුරු

| පිටත්වීමේ විස්තර - 2023 සහ 2022 | | |
|---|---|---|
| මාසය | 2023 | 2022 |
| ජනවාරි | 26 | 5 |
| පෙබරවාරි | 81 | 16 |
| මාර්තු | 275 | 23 |
| අප්‍රේල් | 290 | 40 |
| මැයි | 334 | 81 |
| ජූනි | 359 | 90 |
| ජූලි | 509 | 117 |
| අගෝස්තු | 534 | 156 |
| සැප්තැම්බර් | 567 | 168 |
| ඔක්තෝබර් | 603 | 210 |
| නොවැම්බර් | 647 | 252 |
| දෙසැම්බර් | 663 | 316 |
| එකතුව | 4,888 | 1,474 |

| විස්තරය | 2023 (රු.) | 2022 (රු.) |
|---|---|---|
| මුළු ආදායම | 314,890,111 | 89,559,474 |
| මුළු වියදම | 96,628,614 | 44,167,097 |
| ලාභය | 218,261,497 | 45,392,378 |

විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින් සඳහා රැකියා අවස්ථා ලබා දීමේ දී එහි කාර්යක්ෂමතාව සහ කැපවීම පිළිබිඹු කරමින් 2023 වසරේ පිටත්වීම් සංඛ්‍යාවෙහි කැපී පෙනෙන වර්ධනයක් විදේශ රැකියා ඒනජන්සිය විසින් පෙන්නුම් කර ඇත. කොරියාවේ Hung Gung Consultɥng සහ සයිප්‍රස්හි කොන්සල් ජෙනරාල් කාර්යාලය වැනි ප්‍රධාන විදේශීය නියෝජිතයන් මගින් ශ්‍රම බලකායෙන් වැඩි ප්‍රමාණයක් සේවයේ යොදවා ගනිමින්, විදේශ රැකියා ඒජන්සිය විසින් 2023 වසරේ මුළු පිටත්වීම් 659කට සාර්ථකව පහසුකම් සපයා ඇත. කොරියාවේ සහ සයිප්‍රසයේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා දැඩි ඉල්ලුමක් පවතින බව පෙන්නුම් කරමින්, මෙම නියෝජිතයන් දෙදෙනා පමණක් මුළු පිටවීම්වලින් 60% කට වඩා වැඩි ප්‍රමාණයකට දායක වී තිබේ. අනෙකුත් සැලකිය යුතු දායකයන් අතරට ජෝර්දානය, රුසියාව සහ මෝල්ඩෝවා හි නියෝජිතායතන ඇතුළත් වන අතර, ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා විවිධ රැකියා ගමනාන්තයන් පිලිබඳව ඉන් ප්‍රදර්ශනය කරයි.



# අධ්‍යක්ෂ වාර්තාව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 2023 වසරේදී ගෝලීය ආර්ථික උච්චාවචනයන් සහ අභියෝග යන්ට මුහුණදීම සහ අනුවර්තනය වීමේ හැකියාව අඛණ්ඩව පෙන්නුම් කර ඇත. ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව සහතික කිරීමේ අපගේ මෙහෙවර ස්ථිරව පවතී. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 2023 සඳහා අධ්‍යක්ෂ වාර්තාව සහ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඉදිරිපත් කරමු. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යාංශයෙහි සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් සමාලෝචනය කර හොඳින් තක්සේරු කර ඇත. මූල්‍ය ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.05.27 දින අනුමත කරන ලදී.

ඉහළ ලියාපදිංචි ගාස්තු සහ නව සේවා ගාස්තු හඳුන්වාදීම හේතුවෙන් ආදායම් වැඩි වීමත් සමඟ කාර්යාංශයෙහි මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් වී ඇත. කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ විවිධ ක්‍රියාමාර්ග ඔස්සේ අපගේ මෙහෙයුම් පිරිවැය ප්‍රශස්ත කිරීමට ද අප සමත් වී ඇත. සවිස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන ඇමුණුමේ දක්වා ඇත.

**ප්‍රධාන ජයග්‍රහණ**

මෙම වසරේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඔස්සේ විදේශ රැකියා සඳහා ලියාපදිංචි වන ශ්‍රමිකයින් සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි. ජාත්‍යන්තර රැකියා වෙලඳපොලවල් සහ අපගේ වැඩි දියුණු කරන ලද ව්‍යාප්ති වැඩසටහන් පිළිබඳ විශ්වාසයක් පිළිබිඹු කරමින්, 2022 හා සසඳන විට ලියාපදිංචි වූ මුළු සේවක සංඛ්‍යාව 15% කින් ඉහළ ගොස් ඇත.

ජාත්‍යන්තර රැකියා සඳහා අවශ්‍ය නිපුණතාවලින් අපගේ සේවකයන් වඩාත් හොඳින් සන්නද්ධ කිරීම සඳහා අපගේ පුහුණු වැඩසටහන් පුළුල් කර ඇත. නව වෘත්තීය පාඨමාලා හඳුන්වාදීම, භාෂා පුහුණුව සහ සංස්කෘතික දිශානති සැසි මෙයට ඇතුළත් වේ. 2023 දී මෙම වැඩසටහන් වලින් 25,000 කට අධික සේවකයින් ප්‍රතිලාභ ලබා ඇත.

අපගේ සංක්‍රමණික ශ්‍රමිකයින් සඳහා වන ආරක්ෂණ යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීමට කාර්යාංශය උනන්දුවෙන් කටයුතු කර ඇත. අපගේ සේවකයින්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සත්කාරක රටවල් සමඟ අපගේ සහයෝගීතාවය ද වැඩි කර ඇත.

2023 දී, අපි අපගේ සේවකයන්ට අත්‍යවශ්‍ය තොරතුරු වෙත ප්‍රවේශය සැපයීම සහ උපකාරක සේවා සැපයීම ඉලක්ක කරගත් ඩිජිටල් වේදිකා ක්‍රියාත්මක කළෙමු. මෙම මුලපිරීම මගින් සැකසුම් කාලය සැලකිය යුතු ලෙස අඩු කර ඇති අතර අපගේ පාර්ශවකරුවන් සමඟ සන්නිවේදන මාර්ග වැඩිදියුණු කර ඇත

**උපාය මාර්ගික මුලපිරීම්**

නැගී එන ආර්ථිකයන් සහ අංශ කෙරෙහි අවධානය යොමු කරමින් අපගේ ශ්‍රමිකයින් සඳහා රැකියා වෙලඳපොල විවිධාංගීකරණය කිරීමට අපි ක්‍රියාකාරීව උත්සාහ කර ඇත. මෙම උපායමාර්ගික පියවර සාම්ප්‍රදායික වෙළඳපල මත යැපීම අවම කිරීම සහ අපගේ ශ්‍රම බලකාය සඳහා පුළුල් පරාසයක අවස්ථා ලබා දීම අරමුණු කරයි.

කාර්යාංශය දේශීය හා ජාත්‍යන්තර ආයතන සමඟ සිය හවුල්කාරිත්වය ශක්තිමත් කර ඇත. අධ්‍යාපන ආයතන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ විදේශ රැකියා නියෝජිතායතන සමඟ සහයෝගීතාවය අපගේ සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ප්‍රධාන තැනක් ගනී.

ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින් මුහුණ දෙන අභියෝග හඳුනා ගනිමින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි සුබසාධන සහ නැවත ඒකාබද්ධ කිරීමේ වැඩසටහන් ශක්තිමත් කර ඇත. දේශීය ආර්ථිකයට නැවත සුමට සංක්‍රමණයක් සහතික කිරීම සඳහා මූල්‍ය ආධාර, ව්‍යවසායකත්ව පුහුණුව එයට ඇතුළත් වේ.

**අභියෝග සහ අනාගත දැක්ම**

අපගේ සාර්ථකත්වයන් තිබියදීත්, ශ්‍රම සඳහා ගෝලීය ඉල්ලුම උච්චාවචනය වීම, සත්කාරක රටවල නියාමන වෙනස්කම් සහ තාක්ෂණික දියුණුවට අඛණ්ඩව අනුගත වීමේ අවශ්‍යතාවය ඇතුළු අභියෝගවලට කාර්යාංශය මුහුණ දී ඇත. කෙසේ වෙතත්, අපගේ උපායමාර්ගික මුලපිරීම් සැලසුම් කර ඇත්තේ මෙම අභියෝගවලට සක්‍රීයව මුහුණ දීම සඳහා ය.

ඉදිරිය දෙස බලන විට, අපගේ සංක්‍රමණික සේවකයන්ගේ සුබසාධනය තවදුරටත් වැඩිදියුණු කිරීමට, අපගේ පුහුණු වැඩසටහන් පුළුල් කිරීමට සහ තිරසාර මූල්‍ය වර්ධනයක් සහතික කිරීමට කාර්යාංශය කැපවී සිටී. විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනයක් වීමේ අපගේ දැක්ම වෙනුවෙන් අපි කැපවී සිටිමු.

අවසාන වශයෙන්, අපගේ කොටස්කරුවන්ට, පාර්ශවකරුවන්ට සහ අපගේ කැපවූ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ නොසැලෙන සහයෝගය සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීම පිළිබඳව අපගේ කෘතඥතාව පළ කරමු. අපගේ සංක්‍රමණික ශ්‍රමිකයින්ට සේවය කිරීම සහ ජාතියේ ආර්ථික වර්ධනයට දායක වීමේ විශිෂ්ටත්වය සඳහා අපි එක්ව කටයුතු කරමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

…………………………………………..
ඒ. ඒ. එම්. හිල්මි
සභාපති

…………………………………………..
මහේන්ද්‍ර කුමාරසිංහ
අධ්‍යක්ෂ

# පාලන ව්‍යුහය

**හැඳින්වීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, 2009 අංක 56 සහ 1994 අංක 04 යටතේ සංශෝධිත 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි මූලික අරමුණ වන්නේ ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සමග සුබසාධනය සහ ආරක්ෂාව සහතික කිරීමයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් විවිධ පාර්ශවකරුවන්, ප්‍රතිපත්ති සහ යාන්ත්‍රණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පාලනයට ඇතුළත් වේ.

**පාලන ව්‍යුහය**

කාර්යාංශයේ පාලන ව්‍යුහය ප්‍රධාන කොටස් කිහිපයකින් සමන්විත වේ:

01. අධ්‍යක්ෂ මණ්ඩලය: කාර්යාංශය පාලනය කරනු ලබන්නේ විශය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයක් මගිනි. අධ්‍යක්ෂ මණ්ඩලයට මුදල් අමාත්‍යාංශය, කාන්තා කටයුතු අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, බඳවා ගැනීමේ ආයතනවල නියෝජිතයින් සිව්දෙනෙකු සහ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සිව්දෙනෙකු ඇතුළත් වේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උපාය මාර්ගික දිශානතිය සැකසීම සහ එහි මෙහෙයුම් අධීක්ෂණය කිරීමේ වගකීම මණ්ඩලය සතු වේ.

02. සභාපති: අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් අතරින් විෂය භාර අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලබන අතර ඔහු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය මෙහෙයවීම, නිල උත්සවවලදී කාර්යාංශය නියෝජනය කිරීම සහ සංවිධානයේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සභාපතිවරයාගේ වගකීම වේ.

03. සාමාන්‍යාධිකාරී: සාමාන්‍යාධිකාරීවරයා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර, සංවිධානයේ එදිනෙදා කළමනාකාරිත්වයේ වගකීම දරයි. සාමාන්‍යාධිකාරීවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණ සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි.

04. අංශ: කාර්යාංශය විවිධ අංශවලට සංවිධානය කර ඇති අතර, බඳවා ගැනීම්, සුභසාධනය, නීති කටයුතු, මුදල්, විදේශ සබඳතා, සමථකරණය, තොරතුරු තාක්ෂණ, පර්යේෂණ, ප්‍රත්‍යානුකරන, පුහුණු, සැලසුම්කරණය සහ පරිපාලනය සහ මානව සම්පත් වැනි විවිධ අංශ එක් එක් ක්‍රියාවන්ට වගකීම් දරයි. මෙම අංශ අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ කළමනාකරුවන් විසින් ප්‍රධානත්වය දරමින් ඔවුන් සාමාන්‍යාධිකාරී සහ සභාපති වෙත වාර්තා කරයි.

**ප්‍රධාන කාර්යයන් සහ වගකීම්**

කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන් සහ වගකීම් කිහිපයක් ඇත.

01. බඳවා ගැනීමේ නියෝජිතායතන නියාමනය: කාර්යාංශය විසින් ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විදේශගත කිරීමට සම්බන්ධ පුද්ගලික බඳවා ගැනීමේ ආයතන නියාමනය කරයි. කම්කරු නීති සහ රෙගුලාසිවලට අනුකූලව බලපත්‍ර ලබා දීම, අධීක්ෂණය කිරීම සහ බලාත්මක කිරීම මෙයට ඇතුළත් වේ.

02. විදේශ රැකියා ප්‍රවර්ධනය: රැකියා පොළවල්, විදේශ සේවා යෝජකයින් සමඟ සහයෝගීතා සහ සත්කාරක රටවල් සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම් ඇතුළු විවිධ මූලපිරීම් ඔස්සේ ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට කාර්යාංශය කටයුතු කරයි.

03. සංක්‍රමණික සේවකයින්ගේ සුභසාධනය සහ ආරක්ෂාව: ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව සහතික කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූලික

වගකීමකි. මේ සඳහා පෙර පිටත්වීමේ පුහුණුව, නීති ආධාර, හදිසි සහය සහ නැවත ගෙන්වා ගැනීමේ සේවා සැපයීම ඇතුළත් වේ.

04. දත්ත රැස් කිරීම සහ පර්යේෂණ: කාර්යාංශය සංක්‍රමණ ප්‍රවණතා, රැකියා රටා සහ ශ්‍රම වෙළඳපොළ ඉල්ලීම් පිළිබඳ දත්ත රැස්කර විශ්ලේෂණය කරයි. මෙම තොරතුරු ප්‍රතිපත්ති තීරණ දැනුම් දීමට සහ විදේශ රැකියා කටයුතු පාලනය වැඩිදියුණු කිරීමට භාවිතා කරයි.

05. මහජන දැනුවත් කිරීම සහ අධ්‍යාපනය: විදේශ රැකියා ආශ්‍රිත අවස්ථා සහ අවදානම් පිළිබඳව විභව සංක්‍රමණික සේවකයන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මහජනතාවට දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අධ්‍යාපනික වැඩසටහන් පවත්වයි.

**විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුව**

කරුණු කිහිපයක් නිසා කාර්යාංශයේ පාලන රාමුවට විගණන සහ කළමනාකරණ කමිටුව ඉතා වැදගත් වේ;

- මූල්‍ය අඛණ්ඩතාව වැඩි දියුණු කිරීම: මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලීන් අධීක්ෂණය කිරීමෙන්, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන නිරවද්‍ය සහ විශ්වාසනීය බව සහතික කිරීමට කමිටුව උපකාර කරයි.
- කාර්යක්ෂමතාව සහ ඵලදායී බව ප්‍රවර්ධනය කිරීම : මෙහෙයුම් සහ කළමනාකරණ කාර්ය සාධනය පිළිබඳ නිරන්තර සමාලෝචනය හරහා, කමිටුව වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර හඳුනාගෙන, වඩාත් කාර්යක්ෂම හා ඵලදායී මෙහෙයුම් සඳහා දායක වේ.
- අවදානම් අවම කිරීම: අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පිළිබඳ කමිටුවේ අවධානය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙවර සහ අරමුණු කෙරෙහි බලපෑම් ඇති කළ හැකි අවදානම් අවම කිරීමට උපකාරී වේ.
- වගවීම සහතික කිරීම: විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම මගින් කමිටුව ආයතනය තුළ අඛණ්ඩතාව සහ සදාචාරාත්මක හැසිරීම් සංස්කෘතියක් පෝෂණය කරයි.

ආයතනයේ මූල්‍ය සෞඛ්‍යය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීමේදී කාර්යාංශයේ විගණන සහ කළමනාකරණ කමිටුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. කමිටුව සිය වගකීම් ඵලදායි ලෙස ඉටු කරමින්, ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය සහ ආරක්ෂාව සහතික කරමින් විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීමේ සිය මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ කාර්යාංශයෙහි හැකියාව වැඩි දියුණු කරයි.

# ආයතනික සමාජීය වගකීම් වාර්තාව

කාර්යාංශය විසින් මෙම වාර්තාව 2023 දී සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල, සමස්තයක් වශයෙන් ඔවුන්ගේ සමාජ ජීවිත වැඩිදියුණු කිරීම අරමුණු කරගනු ලැබූ මූලික මුලපිරීම් දක්වා ඇත.

**2023 වර්ෂයේදි සිදු කරන ලද ප්‍රධාන ආයතනික සමාජ වගකීම්**

**සංක්‍රමණික සේවකයින් සඳහා සුභසාධනය සහ සහාය**

- පීඩාවට පත් සංක්‍රමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට මූල්‍ය ආධාර ලබා දීම.
- අර්බුදකාරී අවස්ථාවන්හිදී සේවකයින්ට සහාය වීම සඳහා විදේශ සුභසාධන වැඩසටහන් ශක්තිමත් කිරීම.
- රැකියා අභියෝගවලට මුහුණ දෙන සේවකයින් සඳහා උපදේශන සහ නීති ආධාර සේවා පුළුල් කිරීම.

**ප්‍රජා සහභාගීත්වය සහ සංවර්ධනය**

- ශ්‍රී ලංකාව පුරා ආරක්ෂිත සංක්‍රමණ පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- නැවත පැමිණෙන සංක්‍රමණික සේවකයින්ගේ රැකියා නියුක්තිය සහ වෘත්තීය වර්ධනය වැඩි දියුණු කිරීම සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සහාය වීම.
- නැවත මෙරටට ගෙන්වා ගත් සේවකයින් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා දේශීය සංවිධාන සමඟ හවුල් වීම

**සදාචාරාත්මක බඳවා ගැනීම් සහ සේවක ආරක්ෂාව**

- නීති විරෝධී බඳවා ගැනීම් වැළැක්වීම සඳහා දැඩි අධීක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම.
- සේවකයින්ගේ අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම සඳහා දිවයින පුරා වැඩසටහන් පැවැත්වීම.
- සදාචාරාත්මක ශ්‍රම සංක්‍රමණය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීම.

**ආර්ථික හා මූල්‍ය සවිබල ගැන්වීම**

- ප්‍රේෂණ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිළිබඳව සංක්‍රමණික සේවකයින් දැනුවත් කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.
- සංක්‍රමණික පවුල්වලට කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමට සහාය වීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය මුලපිරීම් දියත් කිරීම.
- සංක්‍රමණික සේවකයින්ගේ අවශ්‍යතාවලට ගැලපෙන මූල්‍ය සේවා සැපයීම සඳහා බැංකු සමඟ හවුල් වීම.

**පාරිසරික වගකීම**

- කඩදාසි භාවිතය අඩු කිරීමට සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ඩිජිටල් සැකසුම් පද්ධති හඳුන්වා දීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ කාර්යාල තුළ පරිසර හිතකාමී සේවා ස්ථාන මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රේෂණ වගකීමෙන් යුතුව භාවිතා කිරීම දිරිමත් කිරීම මගින් තිරසාර මූල්‍ය ආයෝජන සඳහා පෙනී සිටීම.

**අනාගත ආයතනික සමාජ වගකීම් සඳහා කැපවීම්**

- සේවක සුභසාධන වැඩසටහන් පුළුල් කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම.
- ආරක්ෂිත සංක්‍රමණය සහ සදාචාරාත්මක රැකියා පිළිබඳ දැනුවත්භාවය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපනික මුලපිරීම් වැඩි කිරීම.
- නැවත පැමිණෙන සේවකයින්ට තිරසාර ජීවනෝපායන් සුරක්ෂිත කිරීම සඳහා සහාය වීමට ප්‍රත්‍යානුකලන කිරීමේ වැඩසටහන් පුළුල් කිරීම.

# අවදානම් විශ්ලේෂණ වාර්තාව

මෙම වාර්තාව කාර්යාංශය මුහුණ දෙන මූලික අවදානම්, ඒවායේ වියහැකි බලපෑම් සහ අවම කිරීමේ උපාය මාර්ග ඉස්මතු කරයි.

**මූලික අවදානම් සාධක**

නියාමන සහ අනුකූලතා අවදානම්

- ගමනාන්ත රටවල විදේශ රැකියා නීතිවල වෙනස්කම් සේවක ඉල්ලුමට කරන බලපෑම
- ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්ට අනුකූල නොවීම් වලට තුඩු දීම සීමා කිරීම.
- විදේශ රැකියා ක්‍රියා පටිපාටිවලට බලපාන ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය වෙනස්කම්

අවම කිරීමේ උපාය මාර්ග

- නියාමන පෙළගැස්ම සහතික කිරීම සඳහා ගමනාන්ත රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ශක්තිමත් කිරීම.
- ජාත්‍යන්තර කම්කරු නීති නිතිපතා අධීක්ෂණය කිරීම සහ ඒ අනුව දේශීය ප්‍රතිපත්ති අනුවර්තනය කිරීම.
- බඳවා ගැනීමේ ආයතන සඳහා අනුකූලතා පියවර වැඩිදියුණු කිරීම.

ආර්ථික අවදානම්

- රැකියා අවස්ථා කෙරෙහි බලපාන සංක්‍රමණික ශ්‍රමය සඳහා වන ගෝලීය ඉල්ලුමේ උච්චාවචනයන්.
- ආර්ථික පසුබෑම් හේතුවෙන් ප්‍රේෂණ ගලා ඒම් අඩු වීම, ජාතික දළ දේශීය නිෂ්පාදිතයට බලපෑම් කිරීම.
- රැකියා සොයන්නන්ගේ දැරිය හැකි මිලට බලපාන බඳවා ගැනීමේ පිරිවැය ඉහළ යාම.

අවම කිරීමේ උපාය මාර්ග

- නිශ්චිත කලාප මත යැපීම අඩු කිරීම සඳහා රැකියා වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම.
- තරඟකාරිත්වය වැඩි කිරීම මත කුසලතා පාදක පුහුණුව දිරිමත් කිරීම.
- දැරිය හැකි බඳවා ගැනීමේ මූල්‍යකරණ විකල්ප සැපයීම සඳහා මූල්‍ය ආයතන සමඟ හවුල් වීම.

මෙහෙයුම් අවදානම්

- අයදුම්පත් සැකසීමේදී අකාර්යක්ෂමතාව හේතුවෙන් ප්‍රමාදයන් සහ අතෘප්තිය ඇති වීම
- සංවේදී සේවක දත්ත සම්මුතියට ඇති කරන සයිබර් ආරක්ෂණ තර්ජන.
- අනපේක්ෂිත භූ දේශපාලනික ගැටලු හේතුවෙන් විදේශ රැකියා ස්ථානගත කිරීම්වලට බාධා.

අවම කිරීමේ උපාය මාර්ග

- ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා ඩිජිටල් පරිවර්තන මුලපිරීම් ක්‍රියාත්මක කිරීම.
- සේවක තොරතුරු ආරක්ෂා කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ආරක්ෂක ප්‍රොටෝකෝල ශක්තිමත් කිරීම
- භූ දේශපාලනික අවිනිශ්චිතතාවයන් සඳහා අසම්භාව්‍ය/අහඹු සැලසුම් ස්ථාපිත කිරීම.

සමාජ හා සුභසාධන අවදානම්

- සංක්‍රමණික සේවක සූරාකෑම සහ අපයෝජන සිද්ධීන් වැඩි වීම
- පීඩාවට පත් සේවකයින්ට කාලානුරූපව ආධාර සැපයීමේ අභියෝග.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ සේවාවන් සම්බන්ධයෙන් මහජන මතය සහ විශ්වාසය පිළිබඳ ගැටලු.

අවම කිරීමේ උපාය මාර්ග

- ආරක්ෂිත සංක්‍රමණ පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් කිරීම.
- ක්ෂණික ආධාර සඳහා විදේශීය සහාය ජාල ශක්තිමත් කිරීම.
- මහජන වාර්තාකරණ යාන්ත්‍රණ හරහා මෙහෙයුම්වල විනිවිදභාවය වැඩි දියුණු කිරීම

**පාරිසරික අවදානම්**

- නිශ්චිත කර්මාන්තවල ශ්‍රම ඉල්ලුමට බලපාන දේශගුණික බාධා.
- සංක්‍රමණික ගමනාගමනයට බලපාන ආන්තික කාලගුණික සිදුවීම් හේතුවෙන් ගමන් සීමාවන්.

**අවම කිරීමේ උපාය මාර්ග**

- දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන රැකියා අවස්ථා හඳුනා ගැනීම සඳහා කර්මාන්ත ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම
- ගමන් බාධා සඳහා අනමු සැලසුම් වැඩි දියුණු කිරීම.

කාර්යාංශය, ක්‍රියාකාරී කළමනාකරණයකට අවශ්‍ය වන නියාමන, ආර්ථික, මෙහෙයුම්, සමාජීය සහ පාරිසරික අවදානම් රාශියකට මුහුණ දෙයි. උපායමාර්ගික අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීමෙන්, ගෝලීය ශ්‍රම වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ගේ අඛණ්ඩ සාර්ථකත්වය සහ ආරක්ෂාව සහතික කරමින්, එහි ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම කාර්යාංශයේ අරමුණයි.

# මූල්‍ය ප්‍රකාශන

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය**

| | සටහන් | සමූහය 2023 රු. | සමූහය 2022 රු. | ශ්‍රී. ල. වි. සේ. නි. කා 2023 රු. | ශ්‍රී. ල. වි. සේ. නි. කා 2022 රු. |
|---|---|---|---|---|---|
| ආදායම් | **4** | 8,620,450,788 | 7,929,502,632 | 7,967,304,526 | 7,867,797,179 |
| වෙනත් ආදායම් | **5** | 1,514,409,492 | 1,771,465,140 | 1,439,787,563 | 1,714,889,345 |
| | | **10,134,860,279** | **9,700,967,772** | **9,407,092,089** | **9,582,686,524** |
| **වියදම්** | | | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | **6** | 1,907,458,069 | 1,917,890,400 | 1,875,674,039 | 1,893,353,426 |
| ආයතනික වියදම් | **6** | 793,474,961 | 591,014,974 | 782,066,919 | 581,282,404 |
| මෙහෙයුම් වියදම් | **6** | 1,021,736,008 | 453,335,333 | 528,896,940 | 402,426,195 |
| දැන්වීම් හා ප්‍රචාරණ | **6** | 115,428,265 | 20,674,282 | 115,428,265 | 20,606,606 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | **6** | 98,735,800 | 93,448,787 | 82,177,391 | 93,087,645 |
| සුභ සාධන වෙනත් වියදම් | **6** | 1,036,249,283 | 664,997,730 | 1,036,249,283 | 664,997,730 |
| මූල්‍ය වියදම් | **6** | 28,900,059 | 24,897,211 | 18,167,656 | 24,761,025 |
| | | **5,001,982,446** | **3,766,258,716** | **4,438,660,493** | **3,680,515,030** |
| මූල්‍ය ආදායම් | **7** | 2,869,317,181 | 1,901,017,641 | 2,815,501,918 | 1,888,162,823 |
| | | **2,869,317,181** | **1,901,017,641** | **2,815,501,918** | **1,888,162,823** |
| | | | - | | |
| බදු වලට පෙර ලාභ/(අලාභ) | | **8,002,195,014** | **7,835,726,697** | **7,783,933,513** | **7,790,334,318** |
| | | | - | | |
| බදු වියදම | | 2,922,530,034 | 1,712,422,780 | 2,856,353,884 | 1,704,722,014 |
| | | | - | | |
| **බදු ගෙවීමෙන් පසු ලාභය** | | **5,079,664,980** | **6,123,303,917** | **4,927,579,629** | **6,085,612,304** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

| | සමූහය 2023 රු. | සමූහය 2022 රු. | ශ්‍රී. ල. වි. සේ. නි. කා 2023 රු. | ශ්‍රී. ල. වි. සේ. නි. කා 2022 රු. |
|---|---|---|---|---|
| **බදු ගෙවීමෙන් පසු ලාභය** | 5,079,664,980 | 6,123,303,917 | 4,927,579,629 | 6,085,612,304 |
| වෙනත් විස්තීරණ ආදායම් | | | | |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මත ආයු ගණක (ලාභ/ අලාභ) | (63,422,020) | 9,659,468 | (62,490,701) | 9,803,587 |
| ආයු ගණක (ලාභ /අලාභ) මත කල්දැමූ බද්ද | (18,747,210) | (2,646,968) | (18,747,210) | (2,646,968) |
| ප්‍රත්‍යාගණන ලාභය මත වූ කල්බදු බලපෑම | 180,278,756 | | 180,278,756 | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 3,100,403,545 | - | 3,100,403,545 | - |
| **වර්ෂය සඳහා වූ වෙනත් මුළු විස්තීර්ණ ආදායම් (බදු ශුද්ධ)** | **3,198,513,071** | **7,012,500** | **3,199,444,390** | **7,156,619** |
| **වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම්** | **8,278,178,051** | **6,130,316,417** | **8,127,024,019** | **6,092,768,923** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
**2023 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | සමූහය 2023 | සමූහය 2022 | ශ්‍රී. වි. සේ. නි. කා 2023 | ශ්‍රී. වි. සේ. නි. කා 2022 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 13,719,623 | 1,000 | 13,719,623 | 1,000 |
| භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් | 10.1 | 410,675,000 | 159,881,649 | 410,675,000 | 159,881,649 |
| දේපළ පිරියත සහ උපකරණ | 10.2 | 3,974,502,008 | 1,309,077,569 | 3,896,357,527 | 1,233,433,090 |
| අනුබද්ධිත ආයෝජන | 11 | - | - | 5,000,000 | 5,000,000 |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 326,202,314 | 289,571,002 | 326,202,314 | 284,715,739 |
| පෙර ගෙවුම් කාර්යය මණ්ඩල ණය | 12.2 | 143,067,851 | 138,770,846 | 143,067,851 | 138,770,846 |
| කල්දැමූ බදු වත්කම් | 18.1 | - | 36,356,505 | - | 36,091,851 |
| කෙරීගෙන යන වැඩ - ගොඩනැගිලි | 10.3 | 4,621,324 | 5,375,927 | 4,621,324 | 5,375,927 |
| | | **4,872,788,120** | **1,939,034,498** | **4,799,643,639** | **1,863,270,102** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොගය | 14 | 17,702,992 | 16,054,361 | 17,430,577 | 15,781,946 |
| ජංගම මූල්‍යය වත්කම් | 13 | 18,007,019,837 | 23,251,261,985 | 17,704,811,447 | 23,127,984,014 |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 125,272,252 | 106,368,866 | 118,444,876 | 106,368,866 |
| පෙර ගෙවුම් සහ ලැබිය යුතු දේ | 15 | 2,801,526,345 | 1,106,014,117 | 2,759,375,261 | 1,088,416,478 |
| විවිධ අත්තිකාරම් | | 18,252,967 | 16,551,789 | 18,252,967 | 16,481,983 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 16 | 2,568,783,218 | 850,363,625 | 2,486,126,028 | 812,244,924 |
| | | **23,538,557,611** | **25,346,614,743** | **23,104,441,156** | **25,167,278,211** |
| **මුලු වත්කම්** | | **28,411,345,731** | **27,285,649,241** | **27,904,084,795** | **27,030,548,313** |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| ප්‍රාග්ධනය | | 691,161,789 | 691,161,789 | 691,161,789 | 691,161,789 |
| සමුච්චිත අරමුදල | | 15,357,240,788 | 17,046,963,678 | 15,063,935,460 | 16,904,500,172 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 3,166,570,891 | 66,167,346 | 3,142,116,891 | 41,713,346 |
| **සම්පූර්ණ හිමිකම්** | | **19,214,973,467** | **17,804,292,813** | **18,897,214,140** | **17,637,375,307** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 3.11 | 365,737,360 | 276,131,384 | 359,049,935 | 270,845,610 |
| කුවේට් වන්දි මුදල් සංචිතය | 20 | 5,189,259,131 | 5,212,391,154 | 5,189,259,131 | 5,212,391,154 |
| ප්‍රදාන | 24 | 819,353 | - | 819,353 | - |
| කල්බදු වගකීම් | | - | 54,803,487 | - | 54,803,487 |
| | | **5,555,815,844** | **5,543,326,025** | **5,549,128,419** | **5,538,040,251** |
| **ජංගම වගකීම්** | | | | | |
| බදු | 18.2 | 1,266,340,750 | 1,143,883,629 | 1,201,858,089 | 1,138,149,275 |
| නියෝජිතායන/ණය හිමියෝ | | 371,520,271 | 374,287,836 | 373,132,590 | 376,748,580 |
| උපචිත වියදම් | | 176,382,319 | 315,602,562 | 176,382,319 | 309,653,297 |
| විවිධ ණය හිමියෝ සහ ණයගැනීම් | 19 | 898,952,937 | 2,038,301,480 | 780,453,990 | 1,964,642,766 |
| බදු වගකීම් | | 54,803,488 | 55,341,133 | 54,803,488 | 55,341,133 |
| සංක්‍රමණික සේවකයින්ගේ දායකත්වය | | 12,118,703 | 10,597,704 | 12,118,703 | 10,597,704 |
| කල්බදු | 18.1 | 860,421,893 | | 858,993,057 | - |
| ගෙවිය යුතු ලාභාංශ බදු | | 16,059 | 16,059 | - | - |
| | | **3,640,556,419** | **3,938,030,403** | **3,457,742,236** | **3,855,132,755** |
| **සම්පූර්ණ හිමිකම් සහ වගකීම්** | | **28,411,345,731** | **27,285,649,241** | **27,904,084,795** | **27,030,548,313** |

පිටු 09 සිට 57 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන 2024.05.27 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

.................................
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)
ඩබ්. ඒ. කේ. කුමාරි

.................................
සභාපති
ඒ. ඒ. එම්. හිල්මි

.................................
අධ්‍යක්ෂ
සමින්ද ජයසේකර

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

**ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ අරමුදල සහ සුභසාධක අරමුදල (WWF) අතර මූල්‍ය තත්ත්වය ප්‍රකාශය වෙන් කිරීම**

**2023 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | ශ්‍රී. වි. සේ. නි. කා 2023 රු. | ශ්‍රී. වි.සේ. නි. කා 2022 රු. | කාර්යාංශයේ අරමුදල 2023 රු. | කාර්යාංශයේ අරමුදල 2022 රු. | සුභ සාධන අරමුදල 2023 රු. | සුභ සාධන අරමුදල 2022 රු. |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 13,719,623 | 1,000 | 13,719,623 | 1,000 | - | - |
| භාවිතය සඳහා අයිතිය ඇති වත්කම් | 10.1 | 410,675,000 | 159,881,649 | 410,675,000 | 159,881,649 | - | - |
| දේපළ පිරියත සහ උපකරණ | 10.2 | 3,896,357,527 | 1,233,433,090 | 3,581,492,413 | 849,945,791 | 314,865,114 | 383,487,299 |
| අනුබද්ධිත ආයෝජන | 11 | 5,000,000 | 5,000,000 | 5,000,000 | 5,000,000 | - | - |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 326,202,314 | 284,715,739 | 326,202,314 | 284,715,739 | - | - |
| පෙර ගෙවුම් කාර්යය මණ්ඩල ණය | 12.2 | 143,067,851 | 138,770,846 | 143,067,851 | 138,770,846 | - | - |
| කල්දැමූ බදු වත්කම් | 18.1 | (858,993,057) | 36,091,851 | (858,993,057) | 36,091,851 | - | - |
| කෙරීගෙන යන වැඩ - ගොඩනැගිලි | 10.3 | 4,621,324 | 5,375,927 | - | 5,375,927 | 4,621,324 | - |
| | | **3,940,650,583** | **1,863,270,102** | **3,621,164,145** | **1,479,782,803** | **319,486,438** | **383,487,299** |
| **ජංගම වත්කම්** | | | | | | | |
| තොගය | 14 | 17,430,577 | 15,781,946 | 17,430,577 | 15,781,946 | - | - |
| ජංගම මූල්‍ය වත්කම් | 13 | 17,704,811,447 | 23,127,984,014 | 1,274,983,147 | 7,137,661,975 | 16,429,828,300 | 15,990,322,039 |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 118,444,876 | 106,368,866 | 118,444,876 | 106,368,866 | - | - |
| ලැබිය යුතු සුභසාධන අරමුදල | | - | - | 2,906,376,070 | 1,512,657,528 | - | - |
| පෙර ගෙවුම් සහ වෙනත් ලැබිය යුතු දේ | 15 | 2,759,375,261 | 1,088,416,478 | 232,294,053 | 139,883,629 | 2,527,081,208 | 948,532,849 |
| විවිධ අත්තිකාරම් | | 18,252,967 | 16,481,983 | 3,145,991 | 3,014,198 | 15,106,976 | 13,467,785 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 16 | 2,486,126,028 | 812,244,924 | 722,869,364 | 335,673,243 | 1,763,256,663 | 476,571,680 |
| | | **23,104,441,156** | **25,167,278,212** | **5,275,544,078** | **9,251,041,385** | **20,735,273,147** | **17,428,894,354** |
| **මුලු වත්කම්** | | **27,045,091,738** | **27,030,548,313** | **8,896,708,223** | **10,730,824,188** | **21,054,759,585** | **17,812,381,652** |
| **හිමිකම් සහ වගකීම්** | | | | | | | |
| **හිමිකම්** | | | | | | | |
| ප්‍රාග්ධනය | | 691,161,789 | 691,161,789 | 691,161,789 | 691,161,789 | - | - |
| සමුච්චිත අරමුදල | | 15,063,935,460 | 16,904,500,172 | 2,330,958,887 | 7,399,311,563 | 12,732,976,573 | 9,505,188,609 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 3,142,116,891 | 41,713,346 | 3,212,912,871 | 41,713,346 | (70,795,980) | - |
| **සම්පූර්ණ හිමිකම්** | | **18,897,214,140** | **17,637,375,307** | **6,235,033,547** | **8,132,186,698** | **12,662,180,593** | **9,505,188,609** |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 3.11 | 359,049,935 | 270,845,610 | 359,049,935 | 270,845,610 | - | - |
| කුවේට් වන්දි සංචිතය | 20 | 5,189,259,131 | 5,212,391,154 | - | - | 5,189,259,131 | 5,212,391,154 |
| ප්‍රදාන | 24 | 819,353 | - | 819,353 | - | - | - |
| බදු වගකීම් | | - | 54,803,487 | - | 54,803,487 | - | - |
| | | **5,549,128,419** | **5,538,040,251** | **359,869,288** | **325,649,097** | **5,189,259,131** | **5,212,391,154** |
| **ජංගම වගකීම්** | | | | | | | |
| බදු | 18.2 | 1,201,858,089 | 1,138,149,275 | 1,201,858,089 | 1,138,149,275 | - | - |
| නියෝජිතායතන ණය හිමියෝ | | 373,132,589.87 | 376,748,580.05 | 373,132,590 | 376,748,580 | - | - |
| කාර්යාංශයට ගෙවිය යුතු මුදල | | - | - | - | - | 2,906,376,070 | 1,512,657,528 |
| උපචිත වියදම් | | 176,382,319.38 | 309,653,297.00 | 176,382,319 | 235,140,899 | - | 74,512,398 |
| විවිධ ණය හිමියෝ සහ ණය ගැනීම් | 19 | 780,453,989.99 | 1,964,642,766.37 | 495,628,901 | 467,608,507 | 284,825,089 | 1,497,034,259 |
| බදු වගකීම් | | 54,803,487.69 | 55,341,132.54 | 54,803,488 | 55,341,133 | - | - |
| සංක්‍රමණික සේවකයින්ගේ දායකත්වය | | 12,118,702.38 | 10,597,704.35 | - | - | 12,118,702 | 10,597,704 |
| | | **2,598,749,179** | **3,855,132,756** | **2,301,805,387** | **2,272,988,393** | **3,203,319,861** | **3,094,801,889** |
| **සම්පූර්ණ හිමිකම් සහ වගකීම්** | | **27,045,091,738** | **27,030,548,313** | **8,896,708,223** | **10,730,824,188** | **21,054,759,585** | **17,812,381,652** |

පිටුව 09 සිට 57 පිටුවදක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන 2024.05.27 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

…………………………..

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)
ඩබ්. ඒ. කේ. කුමාරි

…………………………

සභාපති
ඒ. ඒ. එම්. හිල්මි

…………………………

අධ්‍යක්ෂ
සමින්ද ජයසේකර

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | | සමූහය 2023 රු. | සමූහය 2022 රු. | ශ්‍රී. වි.සේ. නි. කා 2023 රු. | ශ්‍රී. වි.සේ. නි. කා 2022 රු. |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | |
| **බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය** | | **8,002,195,014** | **7,835,726,697** | **7,783,933,513** | **7,790,334,318** |
| **ගැලපීම් :** | | | | | |
| ක්ෂය වීම | | 235,772,091 | 226,567,296 | 228,894,253 | 221,306,601 |
| පොලී ආදායම | | (2,869,317,181) | (1,901,017,641) | (2,815,501,918) | (1,888,162,823) |
| මූල්‍ය වියදම් | | 28,900,059 | 24,897,211 | 18,167,656 | 24,761,025 |
| බදු කුලී වියදම | | 3,080 | 1,820,318 | 3,080 | 1,820,318 |
| දේ. පි.උ බැහැර කිරීම මත ලාභ /අලාභ | | (5,243,743) | 342,949 | (5,243,743) | 342,949 |
| විනිමය හුවමාරු ලාභය | | 676,240,170 | (1,607,036,283) | 676,240,170 | (1,606,547,459) |
| ප්‍රදාන ආදායම් | | (150,686) | (44,760) | (150,686) | (44,760) |
| වර්ෂය සඳහා ගැලපීම | | 132,502,610 | - | 132,814,814 | - |
| වෙන්කිරීම වියදම් ඌණ/ අධි | | | (187,186) | - | - |
| ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම | | (7,000,000,000) | - | (7,000,000,000) | - |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | | 62,725,180 | 69,527,296 | 61,507,738 | 68,960,908 |
| | | **(736,373,407)** | **4,650,595,897** | **(919,335,123)** | **4,612,771,076** |
| බදු ගෙවීම | | (1,737,776,587) | (551,663,573) | (1,732,042,234) | (551,663,573) |
| පාරිතෝෂික ගෙවීම | | (36,541,224) | (18,621,043) | (35,794,114) | (18,621,043) |
| | | **(1,774,317,811)** | **(570,284,616)** | **(1,767,836,349)** | **(570,284,616)** |
| **කාරක ප්‍රාග්ධන ගැලපීම්වලට පෙර මෙහෙයුම් කටයුතු මඟින් වූ ශුද්ධ මුදල් ගලා ඒම්/ගලා යෑම්** | | **(2,510,691,218)** | **4,080,311,281** | **(2,687,171,472)** | **4,042,486,460** |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම** | | | | | |
| ලැබිය යුතු දෑ අඩු වීම /වැඩි වීම | **i** | 260,292,944 | 195,515,343 | 284,776,593 | 205,074,556 |
| වර්ෂය සඳහා වෙන් කිරීම (කුවේට් අරමුදල) | | 23,823 | 32,674 | 23,823 | 32,674 |
| ණය හිමියන්ගේ වැඩි වීම /අඩු වීම | **ii** | (1,979,627,283) | 2,058,665,570 | (2,019,366,675) | 2,039,967,517 |
| | | **(1,719,310,515)** | **2,254,213,587** | **(1,734,566,259)** | **2,245,074,747** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ශුද්ධ මුදල් ගලා ඒම් /ගලා යෑම්** | | **(4,230,001,733)** | **6,334,524,868** | **(4,421,737,731)** | **6,287,561,207** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | | |
| දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (90,705,142) | (88,335,772) | (81,327,303) | (86,193,742) |
| දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් ලද මුදල් ප්‍රවාහය | | 5,613,958 | 417,365 | 5,613,958 | 417,365 |
| පොලී ආදායම | | 931,762,550 | 19,946,128 | 877,947,287 | 7,091,311 |
| මූල්‍ය වත්කම්වල ආයෝජනය | **iii** | 5,184,410,444 | (8,992,740,930) | 5,365,312,975 | (8,972,668,067) |
| **ආයෝජන ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල් ගලා ඒම් /ගලා යෑම්** | | **6,031,081,810** | **(9,060,713,209)** | **6,167,546,916** | **(9,051,353,134)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ලද මුදල් ප්‍රවාහය** | | | | | |
| මූල්‍ය වියදම් | | (27,319,353) | (23,514,896) | (16,586,950) | (23,378,709) |
| භාවිත අයිතිය ඇති වත්කම් | | (55,341,132) | (49,002,040) | (55,341,132) | (49,002,040) |
| ණය ලබා ගැනීමෙන් ලද ආදායම | | - | (1,650,000) | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් ලද ශුද්ධ මුදල් ගලා ඒම් /ගලා යෑම්** | | **(82,660,485)** | **(74,166,935)** | **(71,928,082)** | **(72,380,749)** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස** | | **1,718,419,593** | **(2,800,355,277)** | **1,673,881,103** | **(2,836,172,676)** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | **850,363,625** | **3,650,718,902** | **812,244,925** | **3,648,417,601** |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | **2,568,783,218** | **850,363,625** | **2,486,126,028** | **812,244,925** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සමූහය (රු.) | කාර්යාංශය (රු.) |
|---|---|---|
| සටහන i | | |
| **ලැබිය යුතු මුදල් වැඩි වීම /අඩු වීම** | | |
| පරිභෝජන ද්‍රව්‍ය වල වැඩි වීම /අඩු වීම | (1,648,631) | (1,648,631) |
| ගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ වල වැඩි වීම /අඩු වීම | 267,652,958 | 292,206,413 |
| විලම්භිත බදු වත්කම් වල වැඩි වීම /අඩු වීම (ආරම්භක ශේෂ ගැලපීම) | (4,010,206) | (4,010,206) |
| වෙනත් අත්තිකාරම් වැඩි වීම /අඩු වීම | (1,701,178) | (1,770,984) |
| | **260,292,944** | **284,776,593** |
| සටහන ii | | |
| **ණය හිමියෝ වැඩි වීම /අඩු වීම** | | |
| නියෝජිතායතන ණය හිමියෝ වැඩි වීම /අඩු වීම | (2,767,565) | (3,615,990) |
| උපචිත වියදම් වැඩි වීම /අඩු වීම | (139,220,243) | (133,270,978) |
| ප්‍රදාන | (819,353) | (819,353) |
| සංක්‍රමණික සේවකයින්ගේ දායකත්වය වැඩි වීම /අඩු වීම | 1,520,998 | 1,520,998 |
| කුවේට් වන්දි සංචිතය | (23,132,023) | (23,132,023) |
| වෙනත් ණයහිමි වැඩි වීම /අඩු වීම | (1,815,209,097) | (1,860,049,329) |
| | **(1,979,627,283)** | **(2,019,366,675)** |
| සටහන iii | | |
| **මූල්‍ය වත්කම් වල ආයෝජනය** | | |
| කාර්යය මණ්ඩල ණය වැඩි වීම /අඩු වීම | (59,831,705) | (57,859,592) |
| ස්ථාවර තැන්පතු වැඩි වීම /අඩු වීම | 5,244,242,148 | 5,423,172,567 |
| | **5,184,410,444** | **5,365,312,975** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**හිමිකම් වෙනස්වීමේ ඒකාබද්ධ ප්‍රකාශය**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සමූහය | | | | ශ්‍රී. ල. වි. සේ. නි. කා | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාග්ධනය | සමුච්චිත අරමුදල | ප්‍රත්‍යාගණන අතිරික්තය | එකතුව | ප්‍රාග්ධනය | කාර්යාංශය | සුභ සාධන අරමුදල | එකතුව | ප්‍රත්‍යාගණන අතිරික්තය | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | 691,161,789 | 10,914,681,441 | 66,167,346 | 11,672,010,576 | 691,161,789 | 5,830,350,186 | 4,979,228,057 | 10,809,578,243 | 41,713,346 | **11,542,453,378** |
| වර්ෂය සඳහා ලාභය | - | 6,123,303,917 | - | 6,123,303,917 | - | 1,559,651,752 | 4,525,960,552 | 6,085,612,304 | | **6,085,612,304** |
| වෙනත් විස්තීරණ ආදායම් | - | 7,012,500 | - | 7,012,500 | | 7,156,619 | | 7,156,619 | | **7,156,619** |
| වර්ෂය සඳහා ගැලපීම් | - | 1,965,820 | - | 1,965,820 | - | 2,153,006 | - | 2,153,006 | | **2,153,006** |
| **එකතුව** | **-** | **6,132,282,237** | **-** | **6,132,282,237** | **-** | **1,568,961,377** | **4,525,960,552** | **6,094,921,929** | **-** | **6,094,921,929** |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **691,161,789** | **17,046,963,678** | **66,167,346** | **17,804,292,813** | **691,161,789** | **7,399,311,563** | **9,505,188,609** | **16,904,500,172** | **41,713,346** | **17,637,375,307** |
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | 691,161,789 | 17,046,963,678 | 66,167,346 | 17,804,292,813 | 691,161,789 | 7,399,311,563 | 9,505,188,609 | 16,904,500,172 | 41,713,346 | 17,637,375,307 |
| වර්ෂය සඳහා ලාභය | - | 5,079,664,974 | - | 5,079,664,974 | - | 1,728,856,544 | 3,198,723,085 | 4,927,579,629 | | 4,927,579,629 |
| වෙනත් විස්තීරණ ආදායම් | - | 98,109,526 | - | 98,109,526 | | 99,040,845 | | 99,040,845 | | 99,040,845 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | 3,100,403,545 | 3,100,403,545 | | - | - | - | 3,100,403,545 | 3,100,403,545 |
| වර්ෂය සඳහා ගැලපීම් | - | 132,502,610 | - | 132,502,610 | - | 103,749,935 | 29,064,879 | 132,814,814 | | 132,814,814 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම | - | (7,000,000,000) | | (7,000,000,000) | - | (7,000,000,000) | | (7,000,000,000) | | (7,000,000,000) |
| **එකතුව** | **-** | **(1,689,722,890)** | **3,100,403,545** | **1,410,680,655** | **-** | **(5,068,352,676)** | **3,227,787,964** | **(1,840,564,712)** | **3,100,403,545** | **1,259,838,833** |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **691,161,789** | **15,357,240,788** | **3,166,570,891** | **19,214,973,468** | **691,161,789** | **2,330,958,887** | **12,732,976,573** | **15,063,935,460** | **3,142,116,891** | **18,897,214,140** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශණය සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 අවසන් වූ වසර සඳහා**

**කාර්යංශයේ අරමුදල හා සුබසාධන අරමුදල අතර ආදායම් සහ වියදම් වෙන් කිරීම**

| විස්තරය | 2023 | | | 2022 |
|---|---|---|---|---|
| | කාර්යංශය රු. | සේ.සු.අ. රු. | එකතුව රු. | රු. |
| **ආදායම** | | | | |
| බඳවා ගැනීමේ ගාස්තු - නියෝජිතායතන | 566,277,724 | 145,160,460 | 711,438,184 | 555,720,001 |
| බඳවා ගැනීමේ ගාස්තු - පුද්ගල | 1,598,233,670 | 176,249,907 | 1,774,483,577 | 1,757,910,502 |
| කොරියානු බඳවා ගැනීමේ ප්‍රවර්ධන ගාස්තු | - | 279,138,716 | 279,138,716 | 230,730,797 |
| පහසුකම් ගාස්තු | 59,549,881 | - | 59,549,881 | 61,705,919 |
| බලපත්‍ර ගාස්තු | 114,383,047 | - | 114,383,047 | 93,970,173 |
| සෙස් ආදයම | 986,018,458 | - | 986,018,458 | 943,245,661 |
| කොරියානු පරිපාලන ගාස්තු | 26,794,756 | - | 26,794,756 | 26,080,484 |
| නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තුව | 25,520,361 | - | 25,520,361 | 23,271,992 |
| කොරියානු පුහුණු ගාස්තු | - | 118,896,424 | 118,896,424 | 54,679,103 |
| පුහුණු ආදායම | - | 248,113,646 | 248,113,646 | 521,323,621 |
| විදේශ මෙහෙවරින් ලැබෙන ආදායම | 79,833,418 | 3,543,134,059 | 3,622,967,476 | 3,599,158,926 |
| | **3,456,611,313** | **4,510,693,212** | **7,967,304,526** | **7,867,797,179** |
| **වෙනත් මෙහෙයුම් ආදායම** | | | | |
| රක්ෂණ කොමිස් (දේශීය සහ විදේශීය) | - | 72,091,357 | 72,091,357 | 5,444,905 |
| විදේශ විනිමය හුවමාරු ලාභය | (34,427,065) | (646,387,001) | (680,814,066) | 1,606,547,459 |
| විවිධ ආදායම් (උප සටහන්-05.1) | 899,155,370 | 1,149,354,902 | 2,048,510,273 | 102,896,981 |
| | **864,728,305** | **575,059,258** | **1,439,787,563** | **1,714,889,345** |
| **අඩුකළා:** | | | | |
| කාර්යය මණ්ඩල පිරිවැය | 1,438,491,048 | 437,182,991 | 1,875,674,039 | 1,893,353,426 |
| ආයතනික වියදම් | 341,151,710 | 440,915,208 | 782,066,919 | 581,282,404 |
| මෙහෙයුම් වියදම් | 439,268,947 | 89,627,993 | 528,896,940 | 402,426,195 |
| වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණ වියදම් | 107,968,535 | 7,459,731 | 115,428,265 | 20,606,606 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 73,129,442 | 9,047,949 | 82,177,391 | 93,087,645 |
| සුභසාධන හා වෙනත් වියදම් | - | 1,036,249,283 | 1,036,249,283 | 664,997,730 |
| මූල්‍ය වියදම් | 11,322,465 | 6,845,191 | 18,167,656 | 24,761,025 |
| | **2,411,332,147** | **2,027,328,346** | **4,438,660,493** | **3,680,515,030** |
| මූල්‍ය ආදායම සටහන-7 | 981,392,363 | 1,834,109,555 | 2,815,501,918 | 1,888,162,823 |
| | **981,392,363** | **1,834,109,555** | **2,815,501,918** | **1,888,162,823** |
| බදුවලට පෙර ලාභය/(අලාභය). | **2,891,399,834** | **4,892,533,679** | **7,783,933,513** | **7,790,334,318** |
| අඩු කලා: ආදායම් බදු | (1,162,543,290) | (1,693,810,594) | (2,856,353,884) | (1,704,722,014) |
| බදුවලට පසු ලාභය | **1,728,856,544** | **3,198,723,085** | **4,927,579,629** | **6,085,612,304** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| පශ්චාත් රැකියා ප්‍රතිලාභ මත වු ආයු ගණක ලාභ/(අලාභ) | (62,490,701) | - | (62,490,701) | 9,803,587 |
| ආයුගණක ලාභ/ (අලාභ) මත වූ කල්දැමූ බදු | (18,747,210) | - | (18,747,210) | (2,646,968) |
| ප්‍රත්‍යාගණන ලාභ මත වූ කල්දැමූ බදු | 180,278,756 | - | 180,278,756 | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 3,171,199,525 | (70,795,980) | 3,100,403,545 | - |
| **වෙනත් විස්තීර්ණ ආදායම් වල එකතුව** | **3,270,240,370** | **(70,795,980)** | **3,199,444,390** | **7,156,619** |
| **මුළු විස්තරණ ආදායම** | **4,999,096,915** | **3,127,927,105** | **8,127,024,019** | **6,092,768,923** |

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

# 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 1. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) යනු 1985 අංක 21 දරන පනත (1994 අංක 04 සහ 2009 අංක 56 දරන පසුකාලීන සංශෝධන පනත) යටතේ ස්ථාපිත කරන ලද රාජ්‍ය සංස්ථාවක් වන අතර වර්තමානයේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යංශයේ අධීක්ෂණය යටතේ පවතී. ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරයේ ප්‍රධාන ස්ථානය අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

#### 1.2.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලාංකිකයින් සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන අතර, රටින් පිටත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා විදේශ රැකියා ව්‍යාපාරවලට සහාය වීම සහ නියාමනය කිරීමයි.

#### 1.2.2 පරිපාලිත කොටස් හිමිකම

2023 දෙසැම්බර් 31 සහ 2022 දෙසැම්බර් 31 දිනට පරිපාලිත ආයතන සහ එහි හිමිකාරිත්වය පහත පරිදි වේ.

| අනුබද්ධිත ආයතනය | ප්‍රධාන ක්‍රියාකාරකම් | අයෝජන වර්ගය | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|
| | | | 2023 | 2022 |
| ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත (පුද්) සමාගම | කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබාදීම. විදේශ රැකියා සඳහා බඳවා ගැනීම. | පරිපාලිත ආයතන | 100% | 100% |

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සඳහා දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත. 2023 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශය සහ එහි අනුබද්ධිත ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත (පුද්ගලික) සමාගම (ශ්‍රී.ල.වි.රැ.නි) සමන්විත වේ.

## 2. සැකසීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය, අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ('මූල්‍ය ප්‍රකාශන') සමඟින් ඇතුළත් වන මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ('SLFRS's), ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ('LKAS's), ස්ථාවර අර්ථකථන

කමිටුවේ ('SIC's) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථකථන කමිටුවේ ('IFRIC') අදාළ අර්ථකථන ඇතුළත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කරන ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් සඳහන් නොකළහොත්, මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කරන ලද සියලුම වර්ෂ සඳහා අඛණ්ඩව භාවිතා කෙරේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුව කාර්යාංශයේ සහ එහි පරිපාලිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

"මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" ප්‍රකාශයේ (පිටු 65 සහ 66 බලන්න), "අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව" (පිටුව 53 බලන්න) සහ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සමඟ දැක්වෙන ප්‍රකාශයේ (පිටු 65 සහ 66 බලන්න) දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වගකීම පිළිගනී.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, 2024.05.27 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී.

### 2.3 මිනුම් පදනම

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමක් මත සහ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් විනිමය වේ.

### 2.4 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, කළමනාකරණය විසින් වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් ප්‍රමාණයන්ට සහ ඒ සමඟ ඇති හෙළිදරව් කිරීම් සහ අවිනිශ්චිත වගකීම් හෙළිදරව් කිරීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකරණයට අවශ්‍ය වේ. මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවයේ ප්‍රතිඵලයක් ලෙස අනාගත කාල පරිච්ඡේදවල බලපෑමට ලක් වූ වත්කම් හෝ වගකීම් දරා ගැනීමේ ප්‍රමාණයට ප්‍රමාණවත් ගැලපීමක් අවශ්‍ය විය හැකිය.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී, කළමනාකරණය විවිධ විනිශ්චයන් ලබා දී ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් හි කළමනාකරණය විසින් හඳුනාගෙන තක්සේරු කර ඇති ප්‍රමාණාත්මක බලපෑම් සිදුකිරීමට හැකි වටිනාකම් සහිත රේඛීය අයිතමයන් පිළිබඳව වෙන් වශයෙන් තනි සටහන් මගින් දක්වා ඇත.

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ප්‍රමාණයට ප්‍රමාණාත්මක ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, වාර්තාකරණ දිනයේදී අනාගතය පිළිබඳ මූලික උපකල්පන සහ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍රවල ඇස්තමේන්තුගත අවිනිශ්චිතතාවයන්, අදාළ මූල්‍ය ප්‍රකාශන රේඛීය අයිතමවල තනි සටහන් වල පහත විස්තර කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට අදාළ කර ඇති ප්‍රමිතීන් මත සමූහය සිය උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කරගෙන ඇත. කෙසේ වෙතත්, අනාගත වර්ධනයන් පිළිබඳ පවතින තත්වයන් සහ උපකල්පන, වෙළඳපල වෙනස්කම් හෝ සමූහයේ පාලනයෙන් පරිබාහිරව පැන නගින තත්වයන් හේතුවෙන් වෙනස් විය හැකිය. එවැනි වෙනස්කම් සිදු වූ විට උපකල්පනවලින් පිළිබිඹු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කර ඇති පහත සඳහන් අයිතම කළමනාකරණය විසින් සලකා බලන ලදී.

**අඛණ්ඩ පැවැත්ම**

අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව කළමනාකාරිත්වය තක්සේරුවක් කර ඇති අතර, අනාගතයක් සඳහා ව්‍යාපාරයේ කටයුතු ඉදිරියට කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමූහයේ/කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළ කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් නොවේ. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව ඉදිරියට ගෙනයාමේ පදනම මත සකස් කරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපීමක් ඇති කිරීමේ ප්‍රමාණාත්මක අවදානමක් ඇති උපකල්පන සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිතතා පිළිබඳ තොරතුරු පහත සටහන් වල ඇතුළත් කර ඇතඃ

- දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය (සටහන 3.1)
- ආදායම් බදු (ප්‍රවර්තන වර්ෂයේ බදු සහ කල් දැමූ බදු) (සටහන 3.6)
- මූල්‍ය වත්කම් හානියඃ ආපසු අයකර ගත හැකි මුදලට පාදක වන ප්‍රධාන උපකල්පනය (සටහන 3.7.5)
- හඳුනාගැනීම් සහ වෙන්කිරීම් මැනීම් සහ අසම්භව්‍යය ඃ සම්පත් පිටතට ගලා යාමේ සම්භාවිතාව සහ විශාලත්වය පිළිබඳ ප්‍රධාන උපකල්පනය (සටහන 3.10.1.2)
- සේවක ප්‍රතිලාභ වගකීම් මැනීමඃ ප්‍රධාන ආයුගණක උපකල්පන (සටහන 3.11)

## 2.5 සංසන්දනාත්මක තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල සඳහන් කර ඇති ස්ථානවල ප්‍රතිස්ථාපනය  කර ඇත. වෙනත් ආකාරයකින් සඳහන් නොකළහොත්, LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අනුකූලව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුගිය මූල්‍ය වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. එසේම, ප්‍රවර්තන  ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය ඕනෑම තැනක සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.

# 3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ඇති සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් මිස, පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත.

**ජංගම හා ජංගම නොවන වර්ගීකරණය.**

සමූහය ජංගම හා ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරයි.

**වත්කමක් ජංගම වත්කම් වනුයේ ඃ**

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කෙරේ.
- මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින්පවත්වනු ලැබේ.
- වාර්තාකරණ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ;

හෝ

- මුදල් හෝ මුදල් සමාන දේ වාර්තාකරණ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීමක් හුවමාරු කිරීම හෝ වගකීමකින් නිදහස් විමකට භාවිතා කිරීම සීමා කර නොමැති විටක.

අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

**වගකිමක් ජංගම වගකීමක් වන්නේ නම් එය .**

- එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ නිරාකරණය කිරිමට අපේක්ෂා කෙරේ.
- එය මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වනු ලැබේ.
- වාර්තාකරණ කාලයෙන් පසු මාස දොළහක් ඇතුළත එය පියවීමට නියමිතය; නැතහොත්
- වාර්තාකරණ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීම පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැති වීම.

කල්දැමූ බදු වගකීම් ඇතුළුව අනෙකුත් සියලුම වගකීම් සමූහය ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

## වත්කම් සහ ලැබිය යුතු දේ

## 3.1 දේපල පිරියත හා උපකරණ.

### 3.1.1 මූලික හඳුනාගැනීම සහ මිනුම්

දේපල පිරියත හා උපකරණ වල අගය සමුච්චිත ක්ෂය වීම් හා සමුච්චිත හානි අලාභ තිබේ නම් අඩු කිරීම මගින් ගණනය කරනු ලබයි. දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය යනු අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීම් පිරිවැය සහ වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේදී දරන ලද ඕනෑම වියදම් වේ.

වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම දරනු ලැබූ වියදම් පිරිවැයට ඇතුළත් වේ. කාර්යාංශය විසින් ඉදිකරනු ලබන වත්කම්වල පිරිවැයට පහත සඳහන් දේ අන්තර්ගත වේඃ

- අමුද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය
- අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක්

වත්කම් බැහැර කිරීම මගින් ලැබෙන ඕනෑම ලාභයක් හෝ අලාභයක් වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගනු ලබයි.

### 3.1.2 පසුකාලීන වියදම් සහ ප්‍රතිස්ථාපනය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට ඉඩ තිබේ නම්, එම අයිතමයේ ධාරණ අගය මුදලින් හඳුනා ගනු ලබන අතර, එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ අගය හඳුනා ගනු නොලබයි. දේපල, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා සැපයීමේ පිරිවැය ලාභ හෝ අලාභයෙන් දැරූ ලෙස හඳුනා ගනු ලැබේ.

### 3.1.3 වත්කම් ප්‍රත්‍යාගණනය

වත්කමක් ලෙස හඳුනා ගැනීමෙන් පසු, විශ්වාසදායක ලෙස සාධාරණ වටිනාකම මැනිය හැකි ඉඩම් සහ ගොඩනැගිලි, ප්‍රත්‍යාගණනය කළ දිනයේ දී ප්‍රත්‍යාගණනය කරන ලද මුදලට, පසුව සිදු වූ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි අලාභ අඩු කර ඇත. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ වටිනාකම වාර්තා

කරන දිනට එහි ධාරණ වටිනාකමට වඩා සැලකිය යුතු ලෙස වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කිරීම් සිදු කරනු ලැබේ.

ඉඩම් සහ ගොඩනැගිලි සහ අනෙකුත් වත්කම් තක්සේරු කිරීම අවම වශයෙන් වසර තුනක කාලයක් තුළ වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් වටිනාකම් අනුව සිදු කරනු ලබන අතර සාධාරණ වටිනාකමේ වෙනස්වීම් හේතුවෙන් පැන නගින ඕනෑම ලාභයක් හෝ අලාභයක් ඒවා පැන නගින වර්ෂයේ අනෙකුත් විස්තීර්ණ ආදායමට ඇතුළත් වේ.

ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ධාරණ අගය වැඩිවීම අනෙකුත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගෙන ප්‍රත්‍යාගණන සංචිත ලෙස ස්කන්ධ ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වෙතත්, අතීතයේ ලාභය හෝ අලාභය තුළ හඳුනාගත් එකම වත්කම නැවත ප්‍රත්‍යාගණනය කිරීම මගින් අඩුවීමේ වටිනාකම පමණක් නැවත ගැලපීම මගින් ලාභය හෝ අලාභය වැඩිවීමක් හඳුනාගනු ලබයි.

ප්‍රත්‍යාගණනය නිසා ධාරණ අගයේ සිදුවූ අවප්‍රමාණය ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගනී. කෙසේ වුවද, එම වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තයේ පවතින ඕනෑම බැර ශේෂයක ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් අඩුවීම හඳුනා ගැනේ.

ඊට අමතරව, ප්‍රත්‍යාගණනය කිරීමේ දිනයේ දී සමුච්චිත ක්ෂයවීම් වත්කමේ දළ ධාරණ මුදලට එරෙහිව ඉවත් කරනු ලබන අතර ශුද්ධ මුදල වත්කමේ ප්‍රත්‍යාගණනය කරන ලද මුදලට ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. බැහැර කිරීමෙන් පසු, විකුණනු ලබන වත්කමට අදාළ ප්‍රත්‍යාගණන සංචිතයේ පවතින වටිනාකම රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

### 3.1.4 ක්ෂය වීම

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ දේපල, කම්හල් සහ උපකරණ අයිතමවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් ඒවායේ ඇස්තමේන්තුගත අවශේෂ අගයන් අඩු කිරීමෙන් වන අතර එය සාමාන්‍යයෙන් ලාභය හෝ අලාභයේ දී හඳුනා ගනු ලබයි. මෙය වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත භාවිතයේ රටාව වඩාත් සමීපව පිළිබිඹු කරයි.

වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ වටිනාකම සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම තක්සේරු කරනු ලැබේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහා ප්‍රවර්තන සහ සංසන්දනාත්මක වර්ෂ සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත දැක්වේ;

| | |
|---|---|
| ගොඩනැගිලි සහ වෙන් කිරීම් | අවුරුදු 13 1/3 |
| මෝටර් වාහන | අවුරුදු 5 |
| වෙනත් කාර්යාල උපකරණ | අවුරුදු 5 |
| පරිගණක | අවුරුදු 4 |
| විදුලි භාණ්ඩ සහ උපාංග | අවුරුදු 5 |
| විවිධ උපකරණ | අවුරුදු 2 |
| පුස්තකාල පොත් | අවුරුදු 2 |
| ගෘහ භාණ්ඩ සහ උපාංග - ලී | අවුරුදු 13 1/3 |
| සවිකිරීම් - වානේ | අවුරුදු 13 1/3 |
| පුහුණු උපකරණ | අවුරුදු 5 |
| බදු වත්කම් | බදු කාලය ඉක්මවා |

සෑම වාර්තාකරණ දිනකම ක්ෂයවීම් ක්‍රම, සඵල ආයු කාලය සහ අවශේෂ අගයන් සමාලෝචනය කර සුදුසු පරිදි ගැලපීම සිදුකරනු ලබයි.

### 3.1.4. හඳුනා නොගැනීම්

දේපල පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය බැහැර කිරීමේදී හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනු ලැබේ. දේපල පිරියත හා

උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය එම අයිතමය හඳුනා නොගත් විට ලාභය හෝ අලාභයට ඇතුළත් වේ.

වාණිජ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට කිසිදු බලපෑමක් නොමැති බැවින් ව්‍යාපාර මෙහෙයුම් වලට සෘජුවම ආරෝපණය කළ හැකි ආර්ථික ප්‍රතිලාභ නොමැති බැවින් පුස්තකාල පොත් දේපල පිරියත උපකරණ ලැයිස්තුවෙන් ඉවත් කර ඇත. පුස්තකාල පොත් සුභසාධන සේවාවක් ලෙස සැලකේ.

### 3.1.4 හානිකරණය

ආර්ථික අර්බුදයේ බලපෑම ද සලකා බැලීමෙන් 2023 දෙසැම්බර් 31 වන විට දේපල පිරියත උපකරණ හි හානිකරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

තක්සේරුව මත පදනම්ව, දේපල පිරියත උපකරණ සම්බන්ධයෙන් වාර්තා කරන දිනට මූල්‍ය ප්‍රකාශනවල හායනය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් අවශ්‍ය වී නොතිබුණි

**කෙරී ගෙන යන වැඩ- ප්‍රාග්ධනය**

ප්‍රාග්ධනය කෙරී ගෙන යන වැඩ පිරිවැයට දක්වා ඇත. මේවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීමේදී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

### 3.1.5. අස්පෘශ්‍ය වත්කම්

වත්කමකින් ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට අත්වේයැයි අපේක්ෂා කළ හැකි වන්නේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කළ හැකි නම් පමණක් අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගනු ලබයි.

### 3.1.6 මෘදුකාංග

ආයතනය විසින් අත්පත් කරගත් සහ සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇති අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි අලාභ අඩු කිරීමෙන් මනිනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වලට හානිකරණයක් සිදුවිය හැකි බවට ඇඟවීමක් ඇති විට, සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ.

වාර්තා කරන දිනට ආයතනය විසින් අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් ලෙස මෘදුකාංග වෙන වෙනම අත්පත් කරගෙන ඇත.

**පසුකාලීන වියදම්**

මෘදුකාංග සඳහා වන පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය අදාළ නිශ්චිත වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කළ විට පමණි. අනෙකුත් සියලුම වියදම් ලාභ හෝ අලාභයෙන් සිදු වූ ලෙස හඳුනා ගැනීම සිදු කරයි.

### 3.1.7 ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත සඵල ආයු කාලය මත සරල රේඛීය පදනම භාවිතා කරමින් සහ ඇස්තමේන්තුගත අවශේෂ අගයන් අඩු කිරීමෙන් ඒවායේ පිරිවැය කපා හැරීම සඳහා ක්‍රමක්ෂය ගණනය කරනු ලබන අතර එය ලාභ හෝ අලාභයෙන් හඳුනා ගැනීම සිදු කරයි. මෘදුකාංග වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු තුනකි.

### 3.1.8 හඳුනා නොගැනීම්

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමේදී හෝ එය භාවිතයෙන් ඉවත් කිරීමේදී අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගැනීම් සිදුවේ. එවැනි අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීමෙන් ලැබෙන ලාභය හෝ අලාභය, ලාභ හෝ අලාභ ගිණුමට ඇතුළත් වේ.

2023 දෙසැම්බර් 31 වන දිනට ආර්ථික අර්බුදයේ බලපෑම ඇතුළුව අස්පෘශ්‍ය වත්කම්වල හානිකරණ දර්ශක ආයතනය විසින් තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව, කිසිදු හානිකරණ දර්ශකයක් හඳුනාගෙන නොමැත.

## 3.2 භාවිතයට අයිතිය ඇති වත්කම්

කල්බදු LKAS 17 වෙනුවට SLFRS 16 ආදේශ කර ඇත. IFRIC 4 මගින් ගිවිසුමක කල් බදු පහසුකම තිබේද යන්න සහ දිරි දීමනා සම්බන්ධයෙන් SIC15 මෙහෙයුම් කල්බදු සහ SIC 27 මගින් කල්බදු සම්බන්ධ ගනුදෙනු වල නෛතික ස්වරූපය ඇගයීම සිදු කරනු ලබයි.

මෙම ප්‍රමිතිය මගින් කල්බදු හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා මූලධර්ම දක්වා ඇති අතර තනි ශේෂ පත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු සඳහා ගිණුම්ගත කිරීමට කල්බදු කරුවන්ට දන්වා ඇත. ප්‍රමිතියේ නිශ්චිත සංක්‍රාන්ති විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි, 2018 වාර්තාකරණ කාලය සඳහා සංසන්දනාත්මක කරුණු නැවත සඳහන් නොකර, ආයතනය 2019 ජනවාරි 01 වන දින සිට සම්පූර්ණ අතීතාවර්ජන ක්‍රමය භාවිතා කරමින් බ්‍ක්‍ෂ් 16 අනුගමනය කර ඇත. මෙම ප්‍රමිතිය මඟින් නිශ්චිත සංක්‍රාන්ති විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි, 2018 වාර්තාකරණ කාලය සඳහා සංසන්දනාත්මක කරුණු නැවත සඳහන් නොකර, ආයතනය විසින් 2019 ජනවාරි 01 වන දින සිට සම්පූර්ණ අතීතාවර්ජන ක්‍රමය භාවිතා කරමින් SLFRS 16 අනුගමනය කර ඇත.

කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී, ආයතනය විසින් කොන්ත්‍රාත්තුව කල්බදු අඩංගු කොන්ත්‍රාත්තුවක්ද යන්න තක්සේරු කරයි. කල්බදු කොන්ත්‍රාත්තුවක් යනු වටිනාකමක් සඳහා හුවමාරුවක් ලෙස හඳුනාගත් වත්කමක් යම් කාලයක් සඳහා භාවිතා කිරීම සහ පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවෙන් ප්‍රකාශ කරන්නේ නම්, එය කල්බදු කොන්ත්‍රාත්තුවක් වේ. හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවක් මගින් ලබා දෙන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, ආයතනයේ පහත සඳහන් දෑ තක්සේරු කරයිඃ

**කොන්ත්‍රාත්තුවට හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම ඇතුළත් වීම**

වත්කම භාවිතා කරන කාලය පුරාම එහි භාවිතය තුළින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සියල්ල සැලකිය යුතු ලෙස ලබා ගැනීමට ආයතනයට අයිතියක් ඇත වීම; සහ

වත්කම භාවිතා කිරීම මෙහෙයවීමේ අයිතිය ආයතනය සතු වීම.

ආයතනය භාවිතයේ අයිතිය සහිත වත්කමක සහ කල්බදු වගකීමක කල්බදු ආරම්භක දිනයේදී හඳුනා ගනී. ආයතනයේ භාවිත අයිතිය-වත්කම් යනු LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස පෙර හඳුනාගෙන තිබූ කුලියට ගත් ශාඛා පරිශ්‍රයන්ගෙන් සමන්විත වේ.

### 3.2.1 මූලික මිනුම්

ආයතනය විසින් බදු වගකීම ආරම්භක දිනයේදී භාවිත අයිතිය පිළිබඳ වත්කමක් සහ බදු වගකීමක් හඳුනා ගනී. භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම ප්‍රථමයෙන් පිරිවැය අනුව මනිනු ලබන අතර, එයට ආරම්භක දිනයේදී හෝ ඊට පෙර සිදු කරන ලද ඕනෑම බදු ගෙවීමක් සඳහා සකස් කරන ලද බදු වගකීමේ ආරම්භක මුදල, දරන ලද ඕනෑම මූලික සෘජු පිරිවැයක් සහ අදාළ වත්කම විසුරුවා හැරීමට සහ ඉවත් කිරීමට හෝ අදාළ වත්කම හෝ එය පිහිටා ඇති ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ඇස්තමේන්තුගත පිරිවැයෙන්, ලැබුණු ඕනෑම බදු සහනයක් අඩු කිරීම මගින් මනිනු ලැබේ.

ආරම්භක දිනයේදී නොගෙවන ලද බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව බදු වගකීම ආරම්භයේදී මනිනු ලබන අතර, ගම්‍ය පොලී අනුපාතය භාවිතා කර බදු වට්ටම් කරනු ලැබේ, නැතහොත් එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, ආයතනයේ වර්ධක ණය ගැනීමේ අනුපාතය භාවිතා කරනු ලබයි. සාමාන්‍යයෙන්, ආයතනය එහි වර්ධක ණය ගැනීමේ අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

ආයතනය විසින් අනුබද්ධිත ආයතනයට කුලියට දී ඇති දේපළක ප්‍රතිඵලයක් ලෙස අනුබද්ධිත ආයතනයකට භාවිත කිරීමේ අයිතිය පිළිබඳ වත්කම් සහ බදු වගකීම් ඇති විට, එවැනි භාවිත කිරීමේ අයිතිය පිළිබඳ වත්කම් සහ බදු වගකීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මගින් ඉවත් කරනු ලැබේ.

### 3.2.2 පසුකාලීන මිනුම්

භාවිතයේ අයිතිය සහිත වත්කම, ආරම්භක දිනයේ සිට භාවිතයේ අයිතිය සහිත වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය අවසන් වන දිනය හෝ බදු කාල සීමාව අවසන් වන දිනය දක්වා සරල රේඛා ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. භාවිතයේ අයිතිය සහිත වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය දේපල සහ උපකරණවල මෙන් තීරණය කරනු ලබයි. ඊට අමතරව, භාවිතයේ අයිතිය සහිත වත්කම, හානිකරන අලාභයක් සිදුවුවහොත්, එය වරින් වර අඩු කරනු ලබන අතර, ඒ අනුව බදු වගකීම ගලපනු ලබයි.

බදු වගකීම ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලැබේ. දර්ශකයක හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් අනාගත බදු ගෙවීම්වල වෙනසක් ඇති වූ විට හෝ අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල පිළිබඳ ආයතනයේ ඇස්තමේන්තුවේ වෙනසක් ඇති වූ විට හෝ ආයතනයේ මිලදී ගැනීමක්, දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ විකල්පයක් ක්‍රියාත්මක කරන්නේද යන්න පිළිබඳ තක්සේරුව වෙනස් කළ විට එය පූර්ව ලෙස මනිනු ලැබේ.

### 3.2.3 භාවිතයේ අයිතිය සහිත වත්කම් හානිකරණය

වාර්තා කරන දින වන විට, ආර්ථික අර්බුදය හේතුවෙන් වත්කම් භාවිතයේ අයිතියට හානි වීම සම්බන්ධයෙන් ආයතනය විසින් කිසිදු හානි කිරීමේ අලාභයක් හඳුනාගෙන නොමැත, මන්ද සෑම ව්‍යාපාර ඒකකයක්ම ආයතනයේ අවදානම් කළමනාකරණ උපාය මාර්ගයට අනුව ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් යටතේ ක්‍රියාත්මක වන අතර, හැකි තාක් දුරට රජයේ නියෝග දැඩි ලෙස පිළිපදින අතර සහයෝගය දක්වනු ලබයි.

### 3.2.4 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ සමූහය බදුකරු ලෙස බදු සඳහා ගිණුම් තැබීම.

බදු වත්කම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ සමූහය විසින් භාවිතය සඳහා ලබා ගත හැකි දිනයේ (එනම් ආරම්භක දිනය) සිට, බදු වත්කම් භාවිතයේ අයිතිය ('ඍධඔ') වත්කමක් සහ ඊට අනුරූප වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ.

(අ) භාවිතයේ අයිති වත්කම් (ROU)

මූලික වශයෙන් ROU වත්කම් පහත සඳහන් පිරිවැයන් ඇතුළත්ව මනිනු ලබයි.

- බදු වගකීමේ මූලික මිනුම් ප්‍රමාණය;
- ආරම්භක දිනයේදී හෝ ඊට පෙර කරන ලද ඕනෑම බදු ගෙවීමක් හෝ ලැබුණු ඕනෑම බදු සහනයක් අඩු කිරීම;
- ඕනෑම මූලික සෘජු පිරිවැයක්;

ROU වත්කම්, පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණ අලාභ අඩුකිරීමෙන් පසුව මනිනු ලැබේ.

(ආ) බදු වගකීම්

මූලික වශයෙන් බදු වගකීම් එම දිනයේ දී නොගෙවන ලද බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව මනිනු ලැබේ. බදු ගෙවීම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- ස්ථාවර ගෙවීම් (ප්‍රමාණාත්මක ස්ථාවර ගෙවීම් ඇතුළුව), ලැබිය යුතු වෙනත් දිරි දීමනා අඩු කළ වටිනාකම.
- බදු ගිවිසුමේ අන්තර්ගත පොලී අනුපාතය භාවිතා කරමින් බදු ගෙවීම් වට්ටම් කරනු ලැබේ. එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, සාමාන්‍යයෙන් ශ්‍රී.ල.වි.සේ.නි.කා සහ සමූහයේ බදු සඳහා අදාළ වන පරිදි, බදුකරුගේ වර්ධක ණය ගැනීම භාවිතා කරනු ලැබේ.
- සමාන කාලීන, ආරක්ෂාව සහ කොන්දේසි සහිත සමාන ආර්ථික පරිසරයක් තුළ ඍධඔ හා සමාන වටිනාකමක් ඇති වත්කමක් ලබා ගැනීමට අවශ්‍ය අරමුදල් ණයට ගැනීම සඳහා බදු කරුවෙකු විසින් ගෙවිය යුතු අනුපාතය මෙයයි. බදු ගෙවීම් මූලික පිරිවැය සහ මූල්‍ය පිරිවැය අතර වෙන් කරනු ලැබේ.

එක් එක් කාලපරිච්ඡේදය සඳහා වගකීමේ ඉතිරි ශේෂය මත ස්ථාවර කාලීන පොලී අනුපාතයක් ඇති කිරීම සඳහා බදු කාලය තුළ ලාභ හෝ අලාභයට මූල්‍ය පිරිවැය අය කරනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ සමූහය බදු වගකීම් වෙනම රේඛීය අයිතමයක් ලෙස ඉදිරිපත් කරයි. බදු වගකීම සඳහා වන පොලී වියදම, විස්තීර්ණ ආදායමේ මූල්‍ය පිරිවැය තුළ ඉදිරිපත් කරනු ලබයි.

(ඇ) කෙටි කාලීන බදු

කෙටි කාලීන බදු යනු මාස 12ක් හෝ ඊට අඩු බදු කාල සීමාවක් සහිත බදු වන අතර එය විස්තීර්ණ ආදායමේ වියදමක් ලෙස සරල රේඛීය පදනමක් මත හඳුනාගනු ලැබේ.

## 3.3 අස්පෘශ්‍ය වත්කම්

### 3.3.1 හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ අපේක්ෂාවක් තිබේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 3.3.5 පසුකාලීන වියදම්

අදාළ නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කළ විට පමණක් පසුකාලීන වියදම් ප්‍රාග්ධනය කරනු ලැබේ. අභ්‍යන්තරව ජනනය වන කීර්තිනාමය සහ වෙළඳ නාම සඳහා වන වියදම් ඇතුළුව අනෙකුත් සියලුම වියදම් ලාභ හා අලාභ වශයෙන් හඳුනාගනු ලැබේ.

## 3.4 මූල්‍ය නොවන වත්කම්වල හානිකරනය

වත්කමක් හානිකරනය විය හැකි බවට ඇඟවීමක් තිබේද යන්න වාර්තා කරන සෑම දිනකම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අදාළ වත්කම තක්සේරු කරනු ලැබේ. කිසියම් ඇඟවීමක් තිබේ නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරන පරීක්ෂාවක් අවශ්‍ය වූ විට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් වත්කමේ අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කරයි. වත්කමක අයකර ගත හැකි මුදල යනු වත්කමක සාධාරණ වටිනාකමට වඩා වැඩි අගයක් වන අතර එහි විකිණීමේ පිරිවැය සහ භාවිතයේ ඇති වටිනාකම අඩුකිරීමෙන් ගණනය කරනු ලබන අතර වත්කම වෙනත් වත්කම් හෝ වත්කම් කණ්ඩායම් වලින් බොහෝ දුරට ස්වාධීන මුදල් ගලා ඒම් ජනනය නොකරන්නේ නම් පමණක් තනි වත්කමක් ලෙස සලකනු ලැබේ.

වත්කමක දරාගත හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවා ගිය විට, වත්කමේ හානිකරනය සිදු වූ ලෙස සලකනු ලබන අතර එහි අයකර ගත හැකි මුදලට ලියා හරිනු ලබයි. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ මුදල්වල කාලීන වටිනාකම සහ වත්කමට විශේෂිත අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමිනි. සාධාරණ වටිනාකම අඩු කර විකිණීමේ පිරිවැය තීරණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපල ගනුදෙනු තිබේ නම් ඒවා සැලකිල්ලට ගනී. එවැනි ගනුදෙනු හඳුනාගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලබයි.

## 3.5 විදේශ විනිමය

(අ) ක්‍රියාකාරී සහ වටිනාකම් ඉදිරිපත් කිරීමේ විනිමය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය (ක්‍රියාකාරී මුදල් ඒකකය) භාවිතා කරමිනි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හි ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වේ.

(ආ) විදේශ විනිමය ගනුදෙනු

විදේශ මුදල් වලින් කරන ගනුදෙනුවලදී, ගනුදෙනුව සිදු වූ දිනට අදාළ වන විනිමය අනුපාතවලට අනුව SLBFE හි අදාළ ක්‍රියාකාරී මුදල් වර්ග වලට පරිවර්තනය කරනු ලැබේ.

වාර්තාකරණ දිනයේ දී විදේශ මුදල් වලින් නම් කරන ලද මුදල් වත්කම් සහ වගකීම්, වාර්තාකරණ දිනට පවතින ස්ථානීය අනුපාතයට නැවත පරිවර්තනය කරනු ලැබේ. නැවත පරිවර්තනය කිරීමේදී පැන නගින විදේශ මුදල් වෙනස්කම් ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. මුදල් අයිතමයන් පියවීමේදී හෝ පරිවර්තනය කිරීමේදී පැන නගින සියලුම වෙනස්කම් ආදායම් ප්‍රකාශනයට ගෙන යනු ලැබේ. විදේශ මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැය අනුව ගෙන යනු ලබන මුදල් නොවන වත්කම් සහ වගකීම්, මූලික ගනුදෙනු දිනයේ පැවති විනිමය අනුපාතය අනුව පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදල් ඒකකයක සාධාරණ වටිනාකමට මනිනු ලබන මුදල් නොවන අයිතම, සාධාරණ වටිනාකම තීරණය කරන දිනයේ පැවති විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ.

මූල්‍යමය නොවන අයිතම නැවත පරිවර්තනය කිරීමේදී ඇතිවන ලාභය හෝ අලාභය, අයිතමයේ සාධාරණ වටිනාකම වෙනස් වීමේදී ලාභය හෝ අලාභය හඳුනා ගැනීමට අනුකූලව සලකනු ලැබේ. (එනම්, අනෙකුත් විස්තීර්ණ ආදායම් හෝ ආදායම් ප්‍රකාශනයේ සාධාරණ වටිනාකම් ඇති ලාභ හෝ අලාභ හඳුනාගෙන ඇති අයිතමවල පරිවර්තන වෙනස්කම් හෝ පිළිවෙලින් අනෙකුත් විස්තීර්ණ ආදායම් හෝ ආදායම් ප්‍රකාශනයේ ද පිළිගෙන ඇත.)

## 3.6 බදුකරණය

### 3.6.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බද්ද යනු වාර්තාකරණ දිනයේ දී පනවන ලද බදු අනුපාත සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු බදු ගැලපීම් භාවිතා කරමින්, වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු අපේක්ෂිත බද්ද ලෙස දැක්වීමට හැක. අනෙකුත් විස්තීර්ණ ආදායමේ ඍජුවම හඳුනාගෙන ඇති අයිතමවලට අදාළ ප්‍රවර්තන බද්ද, ආදායම් ප්‍රකාශනයේ නොව අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන ඇත. අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට අනුකූල වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල ගනු ලබන ස්ථාවරයන් කළමනාකරණය විසින් වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවලදී ප්‍රතිපාදන ස්ථාපිත කරනු ලබයි.

### 3.6.2 විලම්බිත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ වටිනාකම අතර වාර්තාකරණ දිනයේ තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බද්ද සපයනු ලැබේ.

බදු අය කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වගකීම් හඳුනා ගෙන ඇත.

අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම්, භාවිතයට නොගත් බදු බැර ඉදිරියට ගෙන යාම සහ භාවිතයට නොගත් බදු පාඩු සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගෙන ඇත. බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සහ භාවිතයට නොගත් බදු බැර ඉදිරියට ගෙන යාම සහ භාවිතයට නොගත් බදු පාඩු භාවිතා කළ හැකි ප්‍රමාණයට අදාළව විලම්බිත බදු වත්කම් හඳුනා ගෙන ඇත.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරනු ලබන අතර, විලම්බිත බදු වත්කම් සියල්ලම හෝ කොටසක් භාවිතා කිරීමට ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් ඇති නොවීම දක්වා අඩු කරනු ලබයි. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභ මගින් විලම්බිත බදු වත්කම් අයකර ගැනීමට ඉඩ සැලසෙන මට්ටම දක්වා හඳුනාගනු ලබයි.

විලම්බිත බදු වත්කම් සහ වගකීම්, වත්කම සාක්ෂාත් කරගත් හෝ වගකීම පියවූ වර්ෂය තුළ යොදාගැනීම අපේක්ෂිත බදු අනුපාත අනුව මනිනු ලබන අතර, වාර්තාකරණ දිනයේදී පනවා ඇති හෝ සැලකිය යුතු දිනයේදී පනවන ලද ඇති බදු අනුපාත මත පදනම් වේ.

## 3.7 මූල්‍ය වත්කම්

### 3.7.1 ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම

මූල්‍ය වත්කම් SLFRS 9, 'මූල්‍ය උපකරණ' ට අනුකූලව ඉදිරිපත් කර හෙළිදරව් කර ඇත,

මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ 13 වන සටහනෙහි මූල්‍ය වත්කම් හෙළිදරව් කර ඇත.

### 3.7.2 මූලික හඳුනාගැනීම සහ මැනිම

SLFRS 9 හි විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය කළ පිරිවැය, අනෙකුත් විස්තීර්ණ ආදායම් (OCI) හරහා සාධාරණ වටිනාකම සහ ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකම ලෙස වර්ගීකරණය කර ඇත.

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය, වත්කමේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීම සඳහා වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හි ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී. මෙම තක්සේරුව මූලික ගෙවීම සහ පොලී ගෙවීම් (SPPI) පරීක්ෂණය ලෙස හඳුන්වනු ලබන අතර එය මූල්‍ය  උපකරණ මට්ටමින් සිදු කරනු ලැබේ. මෙම ව්‍යාපාර ආකෘතිය තීරණය කරන්නේ මුදල් ප්‍රවාහයන් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමෙන්ද, මූල්‍ය වත්කම් විකිණීමෙන්ද, නැතහොත් මෙම ආකාර දෙක මගින්ද යන්න තීරණය කරනු ලැබේ.

ප්‍රමාණාත්මක මූල්‍යකරණ සංරචකයක් අඩංගු නොවන වෙළඳ ලැබිය යුතු දේ හැර හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ප්‍රායෝගික උපයෝගීතාව යොදවා ඇති  දේ, ගනුදෙනු මිලට මනිනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මූල්‍ය වත්කමක් එහි සාධාරණ වටිනාකමට අනුව මනිනු ලබන අතර සාධාරණ වටිනාකමක් නොමැති මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් ලාභය හෝ අලාභය (FVPL) මගින් ද, මූල්‍ය වත්කම අත්පත් කර ගැනීමට සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව ද මූලිකව හඳුනා ගනී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය වත්කම් අතරට මුදල් හා කෙටිකාලීන තැන්පතු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ, ණය හා අනෙකුත් ලැබිය යුතු දේ සහ මිල ගණන් ඉදිරිපත් නොකළ මූල්‍ය උපකරණ ඇතුළත් වේ.

### 3.7.3 පසුකාලීන මිනුම්

පසුකාලීන මිනුම් කටයුතු සඳහා, මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කර ඇත

- ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මූල්‍ය වත්කම්
- සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිචක්‍රීකරණය සමඟ OCI හරහා සාධාරණ වටිනාකමින් වටිනාකම සහිත මූල්‍ය වත්කම්.
- හඳුනාගැනීම අවලංගු කිරීමෙන් පසු සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිචක්‍රීකරණය නොකර ධක් හරහා සාධාරණ වටිනාකමින් නම් කරන ලද වත්කම්
- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම්

#### 3.7.3.1 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ යනු ක්‍රියාකාරී වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් නොකරන ලද ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික මිනුම් කිරීමෙන් පසුව, එවැනි මූල්‍ය වත්කම් හානිකරන අලාභය අඩු කිරීමෙන් පසුව ඵලදායී පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු  ලැබේ. ක්‍රමක්ෂය කළ පිරිවැය අත්පත් කර ගැනීම් සඳහා වන යම් වට්ටමක් හෝ වාරිකයක් EIR හි අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලැබේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් වේ. මෙම හානිකරනය මගින් සිදුවන පාඩු ආදායම් ප්‍රකාශනයෙන් මූල්‍ය පිරිවැය ලෙස හඳුනා ගෙන ඇත.

3.7.3.2 කල්පිරෙන තුරු රඳවා ගන්නා ආයෝජන

ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්, කල්පිරීම දක්වා රඳවා ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හට ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ඇති විට, කල්පිරීම දක්වා රඳවා තබා ගත් වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මූලික මැනීමෙන් පසුව, කල්පිරීම දක්වා රඳවා ගත් ආයෝජන ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් සහ හානිකරනය අඩු කිරීමෙන් පසුව ක්‍රමක්ෂය වියදම් අනුව මනිනු ලැබේ.

### 3.7.4 හඳුනා නොගැනීම්

මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිවාසිකම් අවලංගු වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ ආයතනය හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනාගැනීම අවලංගු කිරීම සිදුවේ.

### 3.7.5 මූල්‍ය වත්කම් හානිකරණය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රමක්ෂ පිරිවැය යටතේ ගෙන යන ලද ඵහි ණය උපකරණ හා සම්බන්ධ අපේක්ෂිත ණය පාඩු ක්‍රමක්ෂය පිරිවැයට සහ FVOCI අනුව 2018 අප්‍රේල් 1 වන දින සිට ඉදිරියට ගෙන යනු ලබයි. භාවිතා කරන ලද අපහායන ක්‍රමවේදය ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් සිදුවී තිබේද යන්න මත රඳා පවතී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් SLFRS 9 මගින් අවසර දී ඇති සරල කළ ප්‍රවේශය වෙළඳ ලැබිය යුතු දේ සඳහා අදාළ කර ගන්නා අතර, ලැබිය යුතු දේවල මූලික හඳුනාගැනීමෙන් අපේක්ෂිත ජීවිත කාලය පුරාම සිදුවන පාඩු හඳුනා ගැනීමේ අවශ්‍යතාවයක් පවතී.

3.7.5.1 ක්‍රමක්ෂය පිරිවැයට ගනු ලබන මූල්‍ය වත්කම්

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා තබා ඇති වත්කම්, එම මුදල් ප්‍රවාහයන් මූලික සහ පොලී ගෙවීම් පමණක් නියෝජනය කරන අතර, ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ:

- මූල්‍ය වත්කම ව්‍යාපාර ආකෘතියක් තුළ පවත්වාගෙන යනු ලබන අතර, ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණින් සහ
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනවලදී මුදල් ප්‍රවාහයන් ඇති කරයි අතර එමගින් ගෙවිය යුතු ප්‍රාග්ධන මුදල මත මූලික සහ පොලිය පමණක් ගෙවීම සිදු කරයි.

ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාත (EIR) ක්‍රමය භාවිතයෙන් මනිනු ලබන අතර ඒවා හානි වීමට යටත් වේ. වත්කම හඳුනා නොගත් විට, වෙනස් කළ විට හෝ හානි වූ විට ලාභ හෝ අලාභ ලෙස ලාභය හෝ අලාභය මගින් හඳුනා ගැනේ.

3.7.6.1. OCI මගින් සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම්

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති වත්කම් මගින් වත්කම්වල මුදල් ප්‍රවාහයන් SPPI නියෝජනය කරන, අතර FVOCI අගයට මනිනු ලබයි.

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ආයතනය OCI හරහා සාධාරණ වටිනාකමකින් ණය උපකරණ මනිනු ලබයි:

- මූල්‍ය වත්කම ව්‍යාපාර ආකෘතියක් තුළ පවත්වාගෙන යනු ලබන අතර ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ විකිණීම යන දෙකම අත්පත් කර ගැනීමේ අරමුණින් සහ
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනවලදී මුදල් ප්‍රවාහයන් ඇති කරන අතර, ඒවා හිඟ මූලික මුදල මත වූ SPPI ලෙස සැලකේ.

ධාරණ අගයේ චලනයන් OCI මගින් සිදුවන අතර ලාභ හෝ අලාභයෙන් හඳුනාගෙන හානිකරනයේ ලාභ හෝ අලාභ, පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ හඳුනා ගැනීම හැර, ධාරණ අගයේ චලනයන් OCI මගින් සලකා බලනු ලැබේ. මූල්‍ය වත්කම හඳුනා නොගත් විට, OCI හි කලින් හඳුනාගත් සමුච්චිත ලාභය හෝ අලාභය කොටස් වලින් ලාභය හෝ අලාභය ලෙස නැවත වර්ගීකරණය කර අනෙකුත් ලාභ/ (අලාභ) ලෙස හඳුනා ගනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් වේ. විදේශ විනිමය ලාභ සහ අලාභ අනෙකුත් ලාභ/(අලාභ) ලෙස ඉදිරිපත් කර ඇති අතර හානිකරනයේ වියදම් ආදායම් ප්‍රකාශයේ වෙනම රේඛීය අයිතම ලෙස ඉදිරිපත් කෙරේ.

### 3.7.6.2. ලාභය හෝ අලාභය මගින් වූ සාධාරණ අගය මත මූල්‍ය වත්කම්

ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් අතරට වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්, ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකමින් මූලිකව හඳුනාගැනීමෙන් පසු නම් කරන ලද මූල්‍ය වත්කම් හෝ සාධාරණ වටිනාකමින් අනිවාර්ය මැනිය යුතු මූල්‍ය වත්කම් ඇතුළත් වේ. කෙටි කාලීනව විකිණීම හෝ නැවත මිලදී ගැනීම සඳහා අත්පත් කර ගත් මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා රඳවා තබා ගත් ඒවා ලෙස වර්ගීකරණය කෙරේ. ව්‍යාපාර ආකෘතිය කුමක් වුවත්, මූලික මුදල හා පොලිය ගෙවීම් පමණක් නොවන මුදල් ප්‍රවාහයන් සහිත මූල්‍ය වත්කම් වර්ගීකරණය කර ලාභ හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනිනු ලැබේ. ඉහත විස්තර කර ඇති පරිදි, ණය උපකරණ ක්‍රමක්ෂ පිරිවැයට හෝ ධක් හරහා සාධාරණ වටිනාකමට වර්ගීකරණය කිරීම සඳහා වන නිර්ණායක තිබියදීත්, එසේ කිරීමෙන් ගිණුම්කරණ නොගැලපීමක් ඉවත් කරන්නේ නම් හෝ සැලකිය යුතු ලෙස අඩු කරන්නේ නම්, මූලික පිළිගැනීම මත ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ණය උපකරණ නම් කිරීමට හැකියාව පවතී.

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගන්නා සාධාරණ වටිනාකමෙහි ශුද්ධ වෙනස්කම් සහිත සාධාරණ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත.

## 3.8 පරිභෝජන භාණ්ඩ

යල් පැන ගිය සහ සෙමින් චලනය වන අයිතම සඳහා වෙන් කිරීමෙන් පසු පරිභෝජන ද්‍රව්‍ය පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු අගයට මනිනු ලැබේ.

## 3.9 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවේ මුදල්, අත්පත් කරගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් තුළ කල්පිරිමක් සහිත අනෙකුත් කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයකින් යුතු කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ.

### වගකීම් සහ ප්‍රතිපාදන

## 3.10 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමින් ගනුදෙනු පිරිවැය අඩු කිරීමෙන් හඳුනා ගන්නා අතර පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලැබේ.

වාර්තාකරණ දිනය අවසන් වීමෙන් පසු මාස 12 කට වඩා වැඩි කල් පිරීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් දෑ ජංගම වගකීම්වලට ඇතුළත් කර ඇත.

### හඳුනා නොගැනීම

### 3.10.1 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මැනීම පහත පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී;

**3.10.1.1 අනෙකුත් මූල්‍ය වගකීම්**

මූලික හඳුනාගැනීමෙන් පසුව, පොලී සහිත ණය සහ ණය ගැනීම් ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයට අනුව මනිනු ලැබේ. වගකීම් හඳුනා නොගත් විට මෙන්ම ඵලදායී පොලී අනුපාත ක්‍රමය (EIR) ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා ආදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ ලෙස හඳුනා ගැනේ.

අත්පත් කර ගැනීම් සඳහා වන ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ EIR හි අනිවාර්ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට ඇතුළත් කර ඇත.

**3.10.1.2 ප්‍රතිපාදන, බැඳීම් සහ අසම්භාව්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තිය**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයකට වර්තමාන වගකීමක් (නීතිමය හෝ නිර්මාණාත්මක) ඇති විට, වගකිම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වීමට ඉඩ ඇති අතර බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගැනේ.

මුදලේ කාල වටිනාකමෙහි බලපෑම ප්‍රමාණාත්මක නම්, සුදුසු විටෙක වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන වත්මන් බදු පෙර අනුපාතයක් භාවිතා කරමින් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් භාවිතා කරන විට, කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිපාදන වැඩිවීම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

ඓතිහාසික අත්දැකීම් සහ එක් එක් අවස්ථාවන්හි නිශ්චිත නියමයන් මත පදනම්ව ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. බොහෝ දුරට ඉඩ ඇති ප්‍රතිඵලය ඇගයීමේ පදනම මත සමූහය ඇස්තමේන්තුවකට පැමිණේ.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියලුම ප්‍රතිපාදන ගිණුම්ගත කර ඇත.

අසම්භාව්‍ය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන විය හැකි බැඳීම් වන අතර එහිදී ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදුවිය නොහැකි හෝ පහසුවෙන් මැනිය නොහැකි විය හැක. සියලුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනක් ලෙස හෙළිදරව් කෙරේ.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව සේවකයින් සහ බාහිර පුද්ගලයින් විසින් ගොනු කරන ලද පහත සඳහන් අධිකරණ නඩු විභාග වෙමින් පවතින අතර රු.37,606,760.00ක මුළු අසම්භාව්‍ය වගකීමක් ඇත.

| නඩු අංකය | ශ්‍රී.ල.වි.සේ.නි.කා වෙතින් අපේක්ෂා කරන වන්දි (ශ්‍රී.ල.රු.) |
|---|---|
| SC/FR/39/17 | - |
| DC/1852/13 | 10,000,000/- |
| DC 3895 | 10,000,000/- |
| SC/FR/153/2023 | - |
| CA/WRIT/235/23 | - |
| LT 6R/7015 | 2,216,760/- |
| SC/FR/66/19 | 10,000,000/- |
| SC/FR/72/19 | 5,000,000/- |
| CA/WRIT/295/22 | - |
| CA/WRIT/263/21 | - |
| CA/WRIT/824/23 | - |
| අභි/25/20 | - |
| අභි/27/20 | - |
| අභි/23/20 | - |
| අභි/26/20 | - |
| A/70/2023 | 390,000/- |
| A/58/2023 | - |
| SCFR/82/21 | - |
| SC/SPL/LA/61/20 | - |
| DMR/2165/2011 | - |

**ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත ආයතනය**

ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත ආයතනය එරෙහිව නඩු 3ක් විභාග වෙමින් පවතී, වත්මන් තත්ත්වය හේතුවෙන් පහත සඳහන් නඩු සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

- ශ්‍රියානි මාදම්පගේ මහත්මිය - කළමනාකරණ සහකාර - කම්කරු දෙපාර්තමේන්තුව - CW/Com/02L/201805/328
- එල්.කේ.නජිත් දර්ශන මහතා - (හිටපු කළමනාකරු- ව්‍යාපාර ප්‍රවර්ධන ) - මහාධිකරණය - HCALT79/19
- එම්/එස් ඉන්සිලාබ් වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල - දිස්ත්‍රික් උසාවි CMB - DRE/45/2019

## 3.11 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### 3.11.1 විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂිකය

විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වගකීම, වාර්තාකරණ දිනයේදී විශ්‍රාම අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම වේ. LKAS 19 - "සේවක ප්‍රතිලාභ" මගින් නිර්දේශ කර ඇති පරිදි, ප්‍රතික්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ගණක විශේෂඥයන් විසින් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ආයුග

ණක ලාභ සහ අලාභ වලින් සමන්විත ප්‍රති මිනුම්, ඒවා සිදුවන කාල සීමාව තුළ OCI හරහා රඳවා ගත් ඉපැයීම් වලට අනුරූප හර හෝ බැර කිරීම සමඟ මූල්‍ය තත්ව ප්‍රකාශනයේදී වහාම හඳුනා ගෙන ඇත. ප්‍රති මිනුම් පසු කාලපරිච්ඡේදවල ලාභය හෝ අලාභය ලෙස නැවත වර්ගීකරණය නොකෙරේ.

සේවා පිරිවැය (වත්මන් සේවා පිරිවැය සහ ඕනෑම අතීත සේවා පිරිවැයක්) සහ ලාභයේ හෝ අලාභයේ පොලී වියදමට ආරෝපණය කළ හැකි සහ අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමෙහි වෙනස්කම් සමූහය හඳුනා ගනී. අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 3.11.4 හි දක්වා ඇත.

විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් වගකීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙන්ම සමූහයේ අනුබද්ධිත ආයතනය විසින් බාහිරව අරමුදල් සපයා නොමැත. කෙසේ වෙතත්, වගකීම් පියවීම සඳහා ආයෝජන වෙන් කරනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව, සේවකයෙකුට පාරිතෝෂික ගෙවීමේ වගකීම පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

### 3.11.2 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා ආරම්භක ශේෂයන්හි සිට අවසාන ශේෂයන් දක්වා සැසඳීම පහත වගුවේ දැක්වේ:

| දෙසැම්බර් 31 වන දිනට | සමූහය 2023 ශ්‍රී ලංකා රු. | සමූහය 2022 ශ්‍රී ලංකා රු. | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2023 ශ්‍රී ලංකා රු. | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2022 ශ්‍රී ලංකා රු. |
|---|---|---|---|---|
| වසර ආරම්භයේදී ශේෂය | 275,722,863 | 234,358,404 | 270,845,609 | 230,309,332 |
| වර්තමාන සේවා පිරිවැය | 13,095,064 | 14,363,603 | 12,755,528 | 14,064,305 |
| අතීත සේවා පිරිවැය | - | 28,411,030 | - | 28,411,030 |
| පොලී පිරිවැය | 49,630,116 | 26,752,664 | 48,752,210 | 26,485,573 |
| ආයුගණක (ලාභ)/අලාභ | 63,422,020 | (9,659,468) | 62,490,701 | (9,803,587) |
| | **401,870,063** | **294,226,233** | **394,844,048** | **289,466,653** |

### 3.11.3 ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වියදම

| දෙසැම්බර් 31 වන දිනට | සමූහය 2023 ශ්‍රී ලංකා රු. | සමූහය 2022 ශ්‍රී ලංකා රු. | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2023 ශ්‍රී ලංකා රු. | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2022 ශ්‍රී ලංකා රු. |
|---|---|---|---|---|
| වර්තමාන සේවා පිරිවැය | 13,095,064 | 14,363,603 | 12,755,528 | 14,064,305 |
| පොලී පිරිවැය | 49,630,116 | 26,752,659 | 48,752,210 | 26,485,573 |
| අතීත සේවා පිරිවැය | - | 28,411,030 | - | 28,411,030 |
| අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් හඳුනාගෙන ඇති ආයුගණක (ලාභ)/අලාභ | 63,422,020 | (9,659,468) | 62,490,701 | (9,803,587) |
| ආදායම් ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති වියදම් | **126,147,200** | **59,579,586** | **123,998,439** | **59,157,321** |

### 3.11.4 ප්‍රධාන උපකල්පන සහ ප්‍රමාණාත්මක සංවේදීතා විශ්ලේෂණය

විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මේ පිරිවැය තීරණය කරනු ලබන්නේ ආයුගණක තක්සේරු කිරීම් මඟින් වන අතර එයට විවිධ උපකල්පන ඇතුළත් වේ. වට්ටම් අනුපාතය තීරණය කිරීම, අනාගත වැටුප් වැඩිවීම්, කාර්ය මණ්ඩල පිරිවැටුම සහ විශ්‍රාම යන වයස (සේවක මරණ අනුපාතය) මෙයට ඇතුළත් වේ. තක්සේරුකරණයට සම්බන්ධ ඇති සංකීර්ණතා සහ එහි දිගුකාලීන ස්වභාවය නිසා, විශ්‍රාම ප්‍රතිලාභ වගකීමක් මෙම උපකල්පනවල වෙනස්කම් වලට ඉතා සංවේදී වේ. සෑම වාර්තාකරණ දිනයකදීම සියලුම උපකල්පන සමාලෝචනය කෙරේ.

ප්‍රධාන උපකල්පන සහ ඒවායේ සංවේදීතා විශ්ලේෂණයන් පහතින් සාකච්ඡා කෙරේ:

3.11.4.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

2023 දෙසැම්බර් 31 වන දිනට වෘත්තීය ආයුගණකවරුන් වන මෙසස් ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කනසල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම විසින් විශ්‍රාම ප්‍රතිලාභ වගකීම පිළිබඳ ස්වාධීන ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් තක්සේරු කිරීම සඳහා ආයුගණකවරුන් විසින් භාවිතා කරන තක්සේරු ක්‍රමය වන්නේ "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය" වේ. LKAS 19 මගින් නිර්දේශ කරන ලද ක්‍රමය - "සේවක ප්‍රතිලාභ" වේ.

සේවක ප්‍රතිලාභවල පිරිවැය තීරණය කිරීමේදී භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන වූයේ:

| විස්තර | 2023 | 2022 |
|---|---|---|
| වට්ටම් අනුපාතය (%) | 13 (වසරකට) | 18 (වසරකට) |
| අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප් වර්ධක අනුපාතය (%) | 10 | 10 |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය (%) | 3 | 1 |
| විශ්‍රාම යන වයස (අවුරුදු) | 60 | 60 |

3.11.4.2 සමූහය

ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතනය (පුද්) සමාගම

2023 දෙසැම්බර් 31 වන දිනට ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්ගලික) සමාගම විසින් සේවක ප්‍රතිලාභ සඳහා වන ප්‍රතිපාදන පිළිබඳ ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. සේවක ප්‍රතිලාභ වගකීම තක්සේරු කිරීම සඳහා ගණක විශේෂඥයින් විසින් භාවිතා කරන තක්සේරු ක්‍රමය "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය " වේ. LKAS 19 මගින් නිර්දේශ කරන ලද ක්‍රමය - "සේවක ප්‍රතිලාභ " ක්‍රමය වේ.

සේවක ප්‍රතිලාභ වගකීම තීරණය කිරීමේදී භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන වූයේ:

| විස්තර | 2023 | 2022 |
|---|---|---|
| වට්ටම් අනුපාතය (%) | 18 | 11.5 |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය (%) | 3 | 8 |
| විශ්‍රාම යන වයස (අවුරුදු) | 60 | 60 |

3.11.4.3 භාවිතා කරන ලද උපකල්පනවල සංවේදීතාව

දෙසැම්බර් 31 වන දිනට සැලකිය යුතු උපකල්පන සඳහා ප්‍රමාණාත්මක සංවේදීතා විශ්ලේෂණයක් පහත පරිදි වේ:

**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් වගකීමට ඇති බලපෑම**

| විස්තර | ශ්‍රී.ල.වි.සේ.නි.කා | |
|---|---|---|
| | 2023 (ශ්‍රී ලංකා රු.) | 2022 (ශ්‍රී ලංකා රු.) |
| වට්ටම් අනුපාතය 1(%)වැඩි වීම | 337,085,710 | 255,342,002 |
| වට්ටම් අනුපාතය 1(%)අඩුවීම | 383,668,142 | 288,111,579 |

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ සිදුවන ප්‍රධාන උපකල්පනවල සාධාරණ වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමට ඇති බලපෑම නිස්සාරනය කරන ක්‍රමයක් මත පදනම්ව ඉහත සංවේදීතා විශ්ලේෂණයන් තීරණය කර ඇත. සංවේදීතා විශ්ලේෂණයන් පදනම් වී ඇත්තේ සැලකිය යුතු උපකල්පනයක වෙනසක් මත වන අතර, අනෙකුත් සියලුම උපකල්පන නියතව තබා ගනී. උපකල්පනවල වෙනස්කම් එකිනෙක හුදකලාව සිදුවීමට ඇති ඉඩකඩ අඩු බැවින් සංවේදීතා විශ්ලේෂණයන් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමෙහි සැබෑ වෙනසක් නියෝජනය කළ නො හැකි ය.

### 3.11.5 විශ්‍රාම දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

| ලැබිය යුතු සෙස් කොමිස් මුදල් | - | 192,500 | - | 192,500 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 9,316,472 | 11,199,570 | 9,017,422 | 10,644,361 |
| වෙනත් ලැබිය යුතු දෑ | 16,452,912 | 118,856,824 | 8,185,968 | 105,629,068 |
| පෙර ගෙවුම් | 4,879,264 | 2,900,970 | 4,879,264 | 2,900,970 |
| වැටුප් අත්තිකාරම් | 10,971 | 51,971 | 10,971 | 39,971 |
| කහගොල්ල ඉඩම සඳහා අත්තිකාරම් ගෙවීම | 46,034,475 | 20,034,475 | 46,034,475 | 20,034,475 |
| ලැබිය යුතු ලියාපදිංචි ගාස්තු | 438,628 | 442,284 | 438,628 | 442,284 |
| වැට් බදු අයකර ගැනීම | 2,459,015 | 2,459,015 | - | - |
| කාර්ය මණ්ඩල සෞඛ්‍ය රක්ෂණය | 2,951,341 | 1,248,450 | - | - |
| රඳවා ගැනීමේ බදු | 1,720,588 | - | - | - |
| රක්ෂණ සඳහා අත්තිකාරම් | 103,865 | 95,209 | - | - |
| **උප එකතුව** | **274,445,137** | **157,481,268** | **232,294,053** | **139,883,629** |
| **ලැබිය යුතු සුභ සාධන අරමුදල** | - | | | |
| ආයෝජන මත ලැබිය යුතු පොලිය | 1,490,385,082 | - | 1,490,385,082 | - |
| කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු L/M | 869,955,801 | 869,955,801 | 869,955,801 | 869,955,801 |
| ලැබිය යුතු අරමුදල් (Kwt.com.case no. 28912) | 156,000 | 156,000 | 156,000 | 156,000 |
| පෙර ගෙවුම් | 34,328,707 | 54,710,384 | 34,328,707 | 54,710,384 |
| ඉතාලියේ රෝම දූත මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල | 887,610 | 887,610 | 887,610 | 887,610 |
| වෙනත් ලැබිය යුතු දෑ | 100,595,673 | - | 100,595,673 | - |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු කොමිස් මුදල් | 22,487,304 | 18,300,801 | 22,487,304 | 18,300,801 |
| කුලී ආරක්ෂක තැන්පතු - දූත මණ්ඩල | 9,730,381 | 4,462,686 | 9,730,381 | 4,462,686 |
| අබුඩාබි ශ්‍රී ලංකා දූත මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් | 1,149,258 | 1,149,258 | 1,149,258 | 1,149,258 |
| කුවේට් ශ්‍රී ලංකා දූත මණ්ඩලයෙන් ලැබිය යුතු අරමුදල් | 258,108 | 258,108 | 258,108 | 258,108 |
| ඊශ්‍රායල් ශ්‍රී ලංකා දූත මණ්ඩලයෙන් ලැබිය යුතු අරමුදල් | (659,848) | 845,070 | (659,848) | 845,070 |
| **උප එකතුව** | **2,529,274,076** | **950,725,717** | **2,529,274,076** | **950,725,717** |
| අඩුකලා : විශේෂිත වූ හානිකරණය සඳහා ප්‍රතිපාදන | (2,192,868) | (2,192,868) | (2,192,868) | (2,192,868) |
| | **2,527,081,208** | **948,532,849** | **2,527,081,208** | **948,532,849** |
| **සම්පූර්ණ පෙර ගෙවුම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ** | **2,801,526,345** | **1,106,014,117** | **2,759,375,261** | **1,088,416,478** |

**ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

**16 මුදල් හා මුදල් සමාන දෑ**

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| **කාර්යාංශය** | සමූහය | සමූහය | ශ්‍රී. ල. වි.සේ. නි. කා | ශ්‍රී. ල. වි.සේ. නි. කා |
| **ජංගම ගිණුම්** | රු. | රු. | රු. | රු. |
| ලංකා බැංකුව ආයතනික ශාඛාව - 0000001650 (සටහන -16.1) | 225,108,067 | 202,962,688 | 225,108,067 | 202,962,688 |
| මහජන බැංකුව බත්තරමුල්ල - 2081001151791068 (සටහන -16.2) | 106,282,522 | 49,683,005 | 106,282,522 | 49,683,005 |
| මහජන බැංකුව - 20810024179101068- මාර්ගගත (සටහන -16.3) | 35,172,036 | - | 35,172,036 | - |
| මහජන බැංකුව 119200163694176 (නාරාහේන්පිට ) | 2,560 | 2,512 | - | - |
| මහජන බැංකුව 119100363694176 (නාරාහේන්පිට ) | 24,982 | 25,032 | - | - |
| මහජන බැංකුව ගිණුම් අංක -100183694176 | 3,523,488 | 650,332 | - | - |
| මහජන බැංකුව ගිණුම් අංක -100103694830(නාරාහේන්පිට ) | 376,787 | 23,080,553 | - | - |
| මහජන බැංකුව රැජිණ ශාඛාව -ගිණුම් අංක -033402102466473 | 4,304,346 | 3,087,797 | | |
| ලංකා බැංකු ගිණුම් අංක -9099724 | 53,441 | 53,441 | - | - |
| ලංකා බැංකු ගිණුම් අංක -76882603 | 73,990,897 | 10,848,851 | - | - |
| | **448,839,127** | **290,394,212** | **366,562,626** | **252,645,694** |

**16.1 2023.12.31 දිනට සත්‍ය බැංකු ශේෂය**

| **BOC ගිණුම් අංක -0000001650** | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| 2023.12.31 දිනට මුදල් පොත් ශේෂය -1650 | (23,569,818) | (25,932,669) |
| 2023.12.31 දිනට අරමුදල් කළමනාකරණය ලංකා බැංකුව -0088358459 | 248,677,884 | 228,895,357 |
| **2023.12.31 දිනට සත්‍ය බැංකු ශේෂය** | **225,108,067** | **202,962,688** |

**16.2**

| **මහජන බැංකුව - ගිණුම් අංක -2081001151791068** | 2023 |
|---|---|
| | රු. |
| 2023.12.31 දිනට මුදල් පොත් ශේෂය 2081001151791068- | (73,622,247) |
| 2023.12.31 දිනට අරමුදල් කළමනාකරණය - මහජන බැංකුව | 179,904,769 |
| **2023.12.31 දිනට සත්‍ය බැංකු ශේෂය** | **106,282,522** |

**16.3**

| **මහජන බැංකුව- ගිණුම් අංක (මාර්ග ගත)-20810024179101068** | 2023 |
|---|---|
| | රු. |
| 2023.12.31 දිනට මුදල් පොත් ශේෂය 20810024179101068- මාර්ගගත | 5,000,000 |
| 2023.12.31 දිනට අරමුදල් කළමනාකරණය - මහජන බැංකුව | 30,172,036 |
| **2023.12.31 දිනට සත්‍ය බැංකු ශේෂය** | **35,172,036** |

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | ශ්‍රී. ල. වි.සේ. නි. කා | ශ්‍රී. ල. වි.සේ. නි. කා |
| **ඉතිරි කිරීමේ ගිණුම්** | රු. | රු. | රු. | රු. |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව - බත්තරමුල්ල - 100800442461 | 72,099,313 | 83,027,550 | 72,099,313 | 83,027,550 |
| ඉතිරි කිරීමේ ගිණුම් - මහජන බැංකුව | 167,088 | 162,399 | - | - |
| ඉතිරි කිරීමේ ගිණුම් - මහජන බැංකුව | 6,375 | 6,221 | - | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව 02-40494 | 202,225 | 196,563 | - | - |
| | **72,475,002** | **83,392,733** | **72,099,313** | **83,027,550** |
| **ඉතිරි කිරීමේ ගිණුම් - විදේශීය විනිමය** | | | | |
| ඉතිරි කිරීමේ ගිණුම් P/B -USD-208402151791068 | 919,016 | - | 919,016 | - |
| | **919,016** | **-** | **919,016** | **-** |
| අතැති මුදල් | 5,040 | 5,000 | 40 | - |
| | **5,040** | **5,000** | **40** | **-** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| **සුභ සාධක අරමුදල** | සමූහය | සමූහය | ශ්‍රී. ල. වි.සේ. නි. කා | ශ්‍රී. ල. වි.සේ. නි. කා |
| **ජංගම ගිණුම්** | රු. | රු. | රු. | රු. |
| ලංකා බැංකුව ආයතනික ශාඛාව - 0000001672 (සටහන -16.4) | 115,062,407 | 19,228,682 | 115,062,407 | 19,228,682 |
| | **115,062,407** | **19,228,682** | **115,062,407** | **19,228,682** |

16.4

| ලංකා බැංකු -0000001672-A/ගිණුම් අංක | 2023 |
|---|---|
| | රු. |
| 2023.12.31 දිනට මුදල් පොත් ශේෂය -A/A-1672 | (150,766,527) |
| 2023.12.31 දිනට අරමුදල් කළමනාකරණය - (0090854045) | 265,828,934 |
| **2023.12.31 දිනට සත්‍ය බැංකු ශේෂය** | **115,062,407** |

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | ශ්‍රී. ල. වි.සේ. නි. කා | ශ්‍රී. ල. වි.සේ. නි. කා |
| **ජංගම ගිණුම් - විදේශීය විනිමය** | රු. | රු. | රු. | රු. |
| ලංකා බැංකුව අක්වෙරල බැංකු ඒකකය - 0000002305 | 59,815,657 | 55,999,739 | 59,815,657 | 55,999,739 |
| | **59,815,657** | **55,999,739** | **59,815,657** | **55,999,739** |
| **ඉතිරි කිරීමේ ගිණුම් - විදේශීය විනිමය** | | | | |
| A/C BOCA/C DFCA/USD/(73-394)-832 | 4,895,113 | 5,446,338 | 4,895,113 | 5,446,338 |
| | **4,895,113** | **5,446,338** | **4,895,113** | **5,446,338** |
| අතැති මුදල් සේ.සු.අ. - දේශීය | 152,572 | 467,969 | 152,572 | 467,969 |
| අතැති මුදල් සේ.සු.අ.- විදේශීය | 364,443 | - | 364,443 | - |
| | **517,015** | **467,969** | **517,015** | **467,969** |

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | ශ්‍රී. ල. වි.සේ. නි. කා | ශ්‍රී. ල. වි.සේ. නි. කා |
| | රු. | රු. | රු. | රු. |
| මාර්ගස්ථ මුදල් | 296,589 | - | 296,589.0 | - |
| | **296,589** | **-** | **296,589.0** | **-** |
| මුදල් සහ බැංකු ශේෂය විදේශීය - දූත මණ්ඩල | 682,669,882 | 395,428,953 | 682,669,882 | 395,428,953 |
| | **682,669,882** | **395,428,953** | **682,669,882** | **395,428,953** |
| මුදල් එකතුව සහ බැංකු ශේෂය | **1,385,494,848** | **850,363,625** | **1,302,837,658** | **812,244,924** |
| මාස තුනක් ඇතුළත කල් පිරෙන ආයෝජන | 1,183,288,370 | - | 1,183,288,370 | - |
| | **2,568,783,218** | **850,363,625** | **2,486,126,028** | **812,244,924** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**2023 දෙසැම්බර් 31 දිනට**

අබුඩාබි දූත මණ්ඩලයේ කම්කරු අංශය භාර නිලධාරියා විසින් එකතු කිරීම් බැංකු ගත නොකිරීම හේතුවෙන් රු. 1,149,258 ක මුදල් හිගයක් වාර්තා විය. මේ සම්බන්ධයෙන් විමර්ශනය කර නීතිමය පියවර ගන්නා ලෙස CID වෙත පැමිණිල්ලක් කරන ලදී.

**17 පෙර වර්ෂ ගැලපීම්**

| දෝෂයේ ස්වභාවය | සමූහය 2022-රු. | කාර්යාංශය 2022-රු. | බලපෑමට ලක්වූ ලේඛීය අයිතම |
|---|---|---|---|
| ගිය වර්ෂයට අදාළ රක්ෂණ ගෙවීම් | 1,387,000 | 1,387,000 | සමුච්චිත අරමුදල සහ ගෙවිය යුතු රක්ෂණය |
| බැංකු ශේෂය ඌණ ගණනය | 766,006 | 766,006 | සමුච්චිත අරමුදල සහ බැංකු ගිණුම |
| ඌණ වියදම් ප්‍රතිපාදන සඳහා ගැලපීම | 187,186 | - | |
| **2023.12.31 දිනට ශේෂය** | **2,340,192** | **2,153,006** | |

| දෝෂයේ ස්වභාවය | සමූහය 2023-රු. | කාර්යාංශය 2023 -රු. | බලපෑමට ලක්වූ ලේඛීය අයිතම |
|---|---|---|---|
| පෙර වර්ෂයේ ගෙවිය යුතු මුදලකට අදාළ රිසිට්පතක් | (920,358) | (920,358) | සමුච්චිත අරමුදල හා ලැබිය යුතු කුලී |
| පෙර වර්ෂයේ ආරක්ෂිත ගිණුමට අදාළ ගෙවීම් | 1,231,873 | 1,231,873 | සමුච්චිත අරමුදල සහ ගෙවිය යුතු ආරක්ෂණ ගිණුම් |
| පෙර වර්ෂයේ ආරක්ෂිත ගිණුමට අදාළ ගෙවීම් | 2,951,092 | 2,951,092 | සමුච්චිත අරමුදල සහ ගෙවිය යුතු ආරක්ෂණ ගිණුම් |
| පෙර වර්ෂයේ හඳුනා නොගත් වට්නාකම් | (1,000,000) | (1,000,000) | සමුච්චිත අරමුදල සහ විවිධ තැන්පතු |
| ආදායම් බදු සහ විලම්බිත බදු සඳහා අධි ප්‍රතිපාදන ගැලපීම | 101,798,843 | 101,798,843 | සමුච්චිත අරමුදල සහ බදු ප්‍රතිපාදන |
| ඌණ ප්‍රතිපාදන වියදම් ගැලපීම | (312,204) | | |
| පෙර වර්ෂයේ හඳුනා නොගත් ආදායම් නිවැරදි කිරීම | 28,753,364 | 28,753,364 | සමුච්චිත අරමුදල සහ විලම්බිත බදු |
| | | | |
| **2023.12.31 දිනට ශේෂය** | **132,502,610** | **132,814,814** | |

**18 බදු ප්‍රතිපාදන**

**18.1 කල්බදු බදු ප්‍රතිපාදන**

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | ශ්‍රී. ල. වි. සේ. නි. කා | ශ්‍රී. ල. වි. සේ. නි. කා |
| | රු. | රු. | රු. | රු. |
| ජනවාරි 01 වැනි දිනට ආරම්භක ශේෂය | (36,356,505) | (16,081,210) | (36,091,852) | (15,816,557) |
| ආරම්භක ශේෂය ගැලපීම | (4,010,206) | - | (4,010,206) | - |
| එකතු කලා : ප්‍රවර්තන වර්ෂය සඳහා ප්‍රතිපාදන | 900,788,604 | (20,275,295) | 899,095,114 | (20,275,295) |
| | **860,421,893** | **(36,356,505)** | **858,993,057** | **(36,091,852)** |
| | **860,421,893** | **(36,356,505)** | **858,993,057** | **(36,091,852)** |

**18.2 ආදායම් බදු ප්‍රතිපාදන**

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | ශ්‍රී. ල. වි. රැ. නි. කා | ශ්‍රී. ල. වි. රැ. නි. කා |
| | රු. | රු. | රු. | රු. |
| ජනවාරි 01 වැනි දිනට ආරම්භක ශේෂය | 1,143,883,629 | (39,830,516) | 1,138,149,275 | (37,864,104) |
| එකතු කලා :ප්‍රවර්තන වර්ෂය සඳහා වෙන්කිරීම් (කුවේට් අරමුදල) | 23,824 | 32,674 | 23,824 | 32,674 |
| එකතු කලා : ප්‍රවර්තන වර්ෂය සඳහා ප්‍රතිපාදන | 1,860,209,884 | 1,735,345,044 | 1,795,727,224 | 1,727,644,278 |
| | **3,004,117,337** | **1,695,547,202** | **2,933,900,323** | **1,689,812,848** |
| අඩුකලා :ප්‍රවර්තන වර්ෂය සඳහා බදු ගෙවීම | (1,737,776,587) | (551,663,573) | (1,732,042,234) | (551,663,573) |
| | **1,266,340,750** | **1,143,883,629** | **1,201,858,089** | **1,138,149,275** |

**18.3**

| | සමූහය 2023 | සමූහය 2022 | කාර්යාංශය 2023 | කාර්යාංශය 2022 |
|---|---|---|---|---|
| බදුවලට පෙර ලාභය | 8,002,195,014 | 7,835,726,697 | 7,783,933,513 | 7,790,334,318 |
| ගලපන ලද ලාභය | **8,002,195,014** | **7,835,726,697** | **7,783,933,513** | **7,790,334,318** |
| ආයෝජන ආදායම ලෙස සලකනු ලැබූ වටිනාකම | (2,869,244,140) | (1,901,027,014) | (2,815,501,918) | (1,888,162,823) |
| ඉඩ නොදෙන ලද වියදම් | 2,638,165,368 | 297,456,643 | 2,628,838,056 | 291,561,484 |
| ප්‍රාග්ධන දීමනා | (127,747,245) | (141,346,734) | (124,958,490) | (140,416,506) |
| උපලබ්ධි නොවූ විනිමය ලාභය | (1,560,950,783) | - | (1,560,950,783) | - |
| පාරිතෝෂික ගෙවීම් | (36,188,704) | (18,621,043) | (35,794,114) | (18,621,043) |
| ස්ථාවර වත්කම් විකිණීමේ ගිණුම්කරණ ලාභය | (5,486,461) | (214,987) | (5,486,461) | (214,987) |
| තක්සේරු කළ හැකි ගාස්තු /තුලනය කිරීමේ දීමනා | 5,495,951 | 87,877 | 5,495,951 | 87,877 |
| බදු අයනොවන ලාභය | (1,894,120,949) | - | (1,894,120,949) | - |
| **ව්‍යාපාරයෙන් ලද තක්සේරු කරන ලද ආදායම** | **4,152,118,052** | **6,072,061,439** | **3,981,454,805** | **6,034,568,321** |
| පොලී ආදායම | 2,158,146,216 | 1,577,079,108 | 2,104,382,686 | 1,564,235,207 |
| අලාභ ඉ/ගෙ | - | (15,333,539) | - | |
| ආයෝජන ආදායම | **2,158,146,216** | **249,578,583** | **2,104,382,686** | **249,153,103** |
| සුදුසුකම් ලත් ගෙවීම් | (100,000,000) | (1,200,000,000) | (100,000,000) | (1,200,000,000) |
| **බදු අයවිය යුතු ලාභය /අලාභය** | **6,210,264,268** | **6,433,718,728** | **5,985,837,491** | **6,398,803,528** |
| **බදු අයවිය යුතු ලාභය මත ආදායම් බද්ද** | **1,863,049,063** | **1,735,345,044** | **1,795,727,424** | **1,727,644,278** |
| **බදු අයවිය යුතු ලාභය මත ආදායම් බද්ද (කුවේට් අරමුදල)** | **23,824** | **32,674** | **23,824** | **32,674** |

**කල්බදු වියදම /ආදායම**

| | සමූහය 2023 | සමූහය 2022 | ශ්‍රී. ල. වි. රැ. නි. කා 2023 | ශ්‍රී. ල. වි. රැ. නි. කා 2022 |
|---|---|---|---|---|
| තාවකාලික වෙනස්කම් ආරම්භය /ආපසු හැරීම දේපල පිරියත සහ උපකරණ මගින් ජනනය වූ | 3,072,396,257 | 978,944,211 | 3,050,951,776 | 978,945,211 |
| බදු ලියා හරින ලද වටිනාකම | (808,280,064) | (841,773,124) | (799,111,976) | (841,773,124) |
| ප්‍රත්‍යාගණන සංචිතය | 600,929,186 | - | 600,929,186 | - |
| අස්පෘශ්‍ය වත්කම් ලියා හැරි වටිනාකම ගිණුම් ගත කිරීම | 13,719,623 | - | 13,719,623 | - |
| භාවිත අයිතිය ඇති වත්කම් | 355,871,512 | - | 355,871,512 | - |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | (365,681,360) | (270,845,610) | (359,049,935) | (270,845,610) |
| **ශුද්ධ වෙනස්කම්** | **2,868,955,155** | **(133,674,523)** | **2,863,310,187** | **(133,673,523)** |
| අයකල බදු 30% ක සම්මත බදු අනුපාතය | 860,686,546 | (40,102,057) | 858,993,056 | (40,102,057) |
| කල්බදු සඳහා වෙන්කිරීම් | **860,686,546** | **(40,102,057)** | **858,993,056** | **(40,102,057)** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

**19 උපචිත සහ වෙනත් ගෙවිය යුතු දෑ**

| | 2023 | 2022 | 2023 | 2022 |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | කාර්යාංශය | කාර්යාංශය |
| | රු. | රු. | රු. | රු. |
| **කාර්යාංශය** | | | | |
| වැටුප් සඳහා තැන්පතු සහ පැමිණිලි විසඳීම | 14,503,584 | 27,193,276 | 14,503,584 | 27,193,276 |
| ගෙවිය යුතු රඳවාගත් මුදල් | 3,632,505 | 44,490,054 | 3,632,505 | 44,490,054 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් | 4,463,788 | 5,641,059 | 4,463,788 | 5,641,059 |
| මුදල් අයකැමිගේ මුදල් ආරක්ෂණ | 25,000 | 25,000 | 25,000 | 25,000 |
| කොරියානු වීසා ගාස්තු සඳහා තැන්පත් කිරීම | 24,312,991 | 24,608,119 | 24,312,991 | 24,608,119 |
| එකතු කල අගය මත බදු | 90,670,313 | 63,443,694 | 90,670,313 | 63,443,694 |
| විවිධ ණයහිමියන් | 64,105,426 | 44,709,154 | 6,489,224 | 10,584,959 |
| ටෙන්ඩර් ණයහිමියන් | 163,493,774 | 142,868,453 | 163,493,774 | 142,868,453 |
| මුද්දර ගාස්තු | 140,375 | 142,825 | 140,375 | 142,825 |
| ඉඩම් සඳහා බදු වගකීම් | 38,441,075 | 38,437,995 | 38,441,075 | 38,437,995 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 18,174,765 | 45,122,287 | 18,174,765 | 45,122,287 |
| උපයනවිට ගෙවන බදු | 460,424 | 504,697 | 460,424 | 504,697 |
| නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තු | - | 3,204,125 | - | 3,204,125 |
| ගුවන් බලපත්‍ර එකතුව | 33,409,525 | 6,167,799 | 4,518,363 | 6,167,799 |
| ඊශ්‍රායල් ස්ථානගත කිරීමේ කාර්යාංශයේ තැන්පතු | 8,637,760 | 3,528,288 | 8,637,760 | 3,528,288 |
| සාත්තු සේවය සඳහා වූ ඊශ්‍රායල පුහුණු වැඩසටහන | 5,605,289 | 74,750 | 5,605,289 | 74,750 |
| අඩුකල රඳවා ගත් බදු (WHT) | 5,089,965 | - | 5,089,965 | - |
| පිලිකා රෝහල සඳහා පරිත්‍යාග | 125,000 | - | 125,000 | |
| PIBA වෙත සේවා සඳහා ගාස්තු | 106,844,706 | - | 106,844,706 | |
| ඉදිරිපත් නොකල චෙක්පත් | 83,310.30 | 83,310 | - | - |
| ගෙවිය යුතු මරණ හිමිකම් පෑම් | (88) | 6,289,993 | - | - |
| කොරියානු ගිවිසුම් | 15,265,000 | 15,440,000 | - | - |
| ඊශ්‍රායල් තැන්පතු | 15,100,000 | 15,100,000 | - | - |
| ගෙවිය යුතු රක්ෂණය | 160 | 160 | - | - |
| බඳවා ගැනීමේ අත්තිකාරම් ගාස්තු | 1,543,200 | 2,621,056 | | |
| **උප එකතුව** | **614,127,848** | **489,696,092** | **495,628,901** | **416,037,378** |
| | | | | |
| **සුභ සාධන අරමුදල** | | | | |
| ලැබූ රක්ෂණ හිමිකම් සහ හිමිකම් ලාභීන්ට ගෙවිය යුතු මුදල | 45,944,417 | 46,708,098 | 45,944,417 | 46,708,098 |
| ගෙවිය යුතු රක්ෂණ හිමිකම් (යුනියන් ඉන්ෂුවරන්ස්) | 5,540,658 | 5,100,937 | 5,540,658 | 5,100,937 |
| ගෙවිය යුතු තැන්පත් - කාන්තා ගෘහ සේවිකාවන් | 149,463,782 | 1,306,502,858 | 149,463,782 | 1,306,502,858 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් | 10,376,797 | 10,376,797 | 10,376,797 | 10,376,797 |
| ජපන් වැඩසටහන් සඳහා දිරි දීමනා | 23,155,680 | 51,571,130 | 23,155,680 | 51,571,130 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් - සයිප්‍රස් | - | 9,300,000 | - | 9,300,000 |
| ආරක්ෂක ගිණුම් - විදේශීය | 26,752,790 | 81,728,897 | 26,752,790 | 81,728,897 |
| නැවත ගෙන්වා ගැනීමේ පිරිවැය සඳහා තැන්පතු | 23,575,506 | 37,301,213 | 23,575,506 | 37,301,213 |
| කුවේට් රක්ෂණය සඳහා තැන්පතු | 15,460 | 15,460 | 15,460 | 15,460 |
| **උප එකතුව** | **284,825,089** | **1,548,605,389** | **284,825,089** | **1,548,605,389** |
| | | | | |
| **උපචිත සහ වෙනත් ගෙවිය යුතු එකතුව** | **898,952,937** | **2,038,301,480** | **780,453,990** | **1,964,642,766** |

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

**20 කුවේට් වන්දි ගිණුම**

මෙම මුදල 1990-1991 කාලය තුළ කුවේට් හි සේවය කරමින් සිටි හා කුවේට් යුද්ධය හේතුවෙන් හදිසියේම ශ්‍රී ලංකාවට පැමිණි පුද්ගලයින්ගේ අරමුදල් සඳහා සමුච්චිත පොලිය සමග නොවිසඳුණු වන්දි හිමිකම් නියෝජනය කරයි. කුවේට් වන්දි අරමුදලින් රු. මිලියන 5,000 ක මූලික ප්‍රාග්ධනයක් භාවිතා කරමින් සංක්‍රමණික සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් රජය යෝජනා කර ඇත.

**21 සම්බන්ධිත පාර්ශව අනාවරණය**

සම්බන්ධිත පාර්ශවයන්ගේ සැලකිය යුතු හෙළිදරව් කිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**21.1** සම්බන්ධිත ආයතන සමග ගනුදෙනු
**(ශ්‍රී. ල. වි. සේ. නි. කා)**

| | **2023.12.31** දිනට<br>රු. | **2022.12.31** දිනට<br>රු. |
|---|---|---|
| (ii) ශ්‍රී.ල.වි.ර.නි. වෙත ගෙවූ 70% ක ඒජන්සි කොමිස් | 9,425,958 | 2,152,500 |

(iii) පහත සඳහන් විදේශ රැකියා ඒජන්සිවල බලපත්‍රලාභීන් 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස සේවය කලහ. ඔවුන්ට ආපසු ගෙවා ඇති බඳවා ගැනීමේ ගාස්තුවෙන් 70%ක කොටස පහත පරිදි දැක්වේ.

| **අධ්‍යක්ෂකගේ නම සහ නියෝජිත ආයතනය** | **ආපසු ගෙවිය යුතු සම්පූර්ණ මුදල** | **70 % ක ආපසු ගෙවීම්** | **සෙස්** | |
|---|---|---|---|---|
| | | | **2023 අයකරගත්** | **2023.12.31 දිනට ලැබිය යුතු** |
| මාතා විදේශ රැකියා නියෝජිත ආයතනය | 207,606 | 3,522,921 | 14,642,437 | 2,458,623 |
| එම්.එෆ්.එම්. ආෂඩ් මහතා - ඉබ්‍රාහීම් එන්ටප්‍රයිසස් | 163,800 | 7,608,300 | 949,657 | 1,833,567 |
| ඒ.එල්.ඒ.හසාම් මහතා -අල් අකීම් එන්ටප්‍රයිසස් | 104,323 | 12,398,400 | 9,188,725 | 21,251 |
| එම්.ආර්.එම්.ෆස්ලි -එමිරේට්ස් ට්‍රැවල්ස් | 12,600.0 | 354,900 | 147,479 | 108,951 |

**ශ්‍රී.ල.වි.ර.නි.**

**21.2** කළමනාකරණයේ ප්‍රධාන නිලධාරීන් සමග ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සාමාජිකයන් වේ.

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සම්බන්ධ සැලකිය යුතු ගනුදෙනු කිසිවක් සිදු වී නොමැත

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනට**

**22 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති**

මූල්‍ය වත්කම් වලින් පහත අවදානම් සමූහයට නිරාවරණය වී ඇත;

1. ණය අවදානම
2. ද්‍රවශීලතා අවදානම
3. වෙළඳපල අවදානම

**අවදානම් කළමනාකරණ රාමුව**

සමූහයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඇතුළුව සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

ආයතනය මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම, ප්‍රමාණනය කිරීම සහ විශ්ලේෂණය කිරීම, සුදුසු අවදානම් සීමාවන් සහ පාලනයන් සැකසීම සහ අවදානම් සහ සීමාවන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී.ල.වි.සේ.සේ.නි. හි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත. වෙළඳපල තත්ත්වයන් සහ සමූහයේ ක්‍රියාකාරකම්වල වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිතිපතා සමාලෝචනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය SLBFE හි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම නිරීක්ෂණය කරන ආකාරය අධීක්ෂණය කරන අතර සමූහය මුහුණ දෙන අවදානම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත් බව සමාලෝචනය කරයි.

**ණය අවදානම**

ණය අවදානම යනු ප්‍රතිවිරුද්ධ පාර්ශවය මූල්‍ය උපකරණ සහ අනෙකුත් ලැබිය යුතු දේ යටතේ ඇති බැඳීම් ඉටු නොකිරීමේ අවදානම වන අතර එමඟින් මූල්‍යමය අලාභයක් සිදු වේ.

වර්තමානයේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය රජයේ භාණ්ඩාගාර බැඳුම්කර සහ රජයේ බැංකුවල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. එබැවින්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ණය අවදානම නොසැලකිය යුතු බව කළමනාකාරිත්වයේ අදහසයි.

**ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු සමූහයට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා දීමෙන් පියවනු ලබන එහි මූල්‍ය වගකීම් හා සම්බන්ධ බැඳීම් සපුරාලීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවන අවදානමයි. ද්‍රවශීලතා කළමනාකරණය සඳහා සමූහයේ ප්‍රවේශය වන්නේ, හැකිතාක් දුරට, සාමාන්‍ය සහ පීඩන තත්ත්වයන් යටතේ, පිළිගත නොහැකි පාඩු සිදු නොවී හෝ සමූහයේ කීර්ති නාමයට හානි

ශේෂ පත්‍ර දිනයේ සිට ගිවිසුම්ගත කල්පිරීමේ දිනය දක්වා ඉතිරි කාල සීමාව මත පදනම්ව පහත වගු මඟින්, අදාළ සමූහයේ සහ භාර අරමුදලේ කල්පිරීමේ කාණ්ඩයන්හි මූල්‍ය වගකීම් විශ්ලේෂණය කරනු ලබයි.

**වෙළඳපල අවදානම**

වෙළඳපල අවදානම යනු වෙළඳපල මිලෙහි වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණවල අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල මිලට අවදානම් වර්ග හතරක් ඇතුළත් වේ; පොලී අනුපාත අවදානම, මුදල් අවදානම, භාණ්ඩ මිල අවදානම සහ කොටස් මිල අවදානම වැනි අනෙකුත් මිල අවදානම. වෙළඳපල අවදානමෙන් බලපෑමට ලක් වූ මූල්‍ය උපකරණ අතර ණය සහ ණය ගැනීම්, තැන්පතු, විකිණීමට ඇති ආයෝජන සහ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ඇතුළත් වේ. වෙළඳපල අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වනුයේ ප්‍රතිලාභය ප්‍රශස්ත කරන අතරම පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළඳපල අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි.

**පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොලී අනුපාතවල සිදුවන වෙනස්කම් හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහයන් උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපොළ පොලී අනුපාතවල සිදුවන වෙනස්කම් වලට සමූහය නිරාවරණය වීම ප්‍රධාන වශයෙන් පාවෙන පොලී අනුපාත සහිත සමූහයේ දිගුකාලීන ණය බැඳීම් සමඟ සම්බන්ධ වේ.

**කොටස් මිල**

ආයෝජන සුරැකුම්පත්වල අනාගත වටිනාකම් පිළිබඳ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් පැන නගින වෙළඳපල මිල අවදානමට සමූහයේ ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ කොටස් සුරැකුම්පත් සංවේදී වේ. විවිධාංගීකරණය සහ තනි සහ මුළු කොටස් සඳහා සීමාවන් පැනවීම හරහා සමූහය කොටස් මිල අවදානම කළමනාකරණය කරයි.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**23 වෙනත් ගනුදෙනු**

විදේශ රැකියා ලොතරැයි ජයග්‍රාහකයන් සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විවෘත කර ඇති ස්ථාවර තැන්පතු ගිණුම් 07 ක් ස්ථාවර තැන්පතුවල දක්වා ඇත.

| ස්ථාවර තැන්පතු ගිණුම් අංක | බැංකුව |
|---|---|
| 20001-90-14730 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 20001-90-14985 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 20001-90-15027 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 20001-90-15051 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 20001-90-15078 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 20001-90-15094 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 20001-90-15892 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |

දූත මණ්ඩලවල මූල්‍ය ගනුදෙනු හසුරුවන ගෘහස්ත නිලධාරීන් සඳහා පහත සඳහන් ස්ථාවර තැන්පතු 03ක් විවෘත කර අවසන් ගිණුම්වල ආයෝජන යටතේ ඇතුලත් කර ඇත.

| ස්ථාවර තැන්පතු ගිණුම් අංක | **වටිනාකම (රු.)** |
|---|---:|
| 92236472 | 653,853.16 |
| 92236482 | 531,341.01 |
| 92236489 | 618,362.16 |
| | **1,803,556.33** |

# විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } VOT/C/SLBFE/FA/01/23/01 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 නොවැම්බර් 12 දින

සභාපති,

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිතයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (" කාර්යාංශය") සහ එහි පරිපාලිතයේ ("සමූහයේ") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාංශයේ සහ සමූහයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී කාර්යංශයේ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර තිබුණද විදේශ දූත මණ්ඩල කාර්යාලවල පවතින පිරිවැය රු.447,392,585ක් වූ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) කාර්යාංශය සතු දඹුල්ල ඉඩම සහ වර්ෂ 50 ක බදු පදනම මත ලබාගෙන තිබූ හෝමාගම ඉඩම ප්‍රත්‍යාගණනය කර නොතිබියදී, එම ඉඩම්වල පිරිවැය වූ රු.68,000,000 ක් හා සමුච්චිත ක්ෂය රු.18,029,749ක් ප්‍රත්‍යාගණනය සංචිත ගිණුමට පිළිවෙලින් හර හා බැර කර තිබීම හේතුවෙන් ප්‍රත්‍යාගණනය සංචිත ගිණුමේ ශේෂය හා ඉඩම්වල වටිනාකම රු.49,970,251ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 15 වන පරිච්ඡේදය අනුව ආදායම් බදු ගණනයේදී බදු සඳහා තාවකාලික වෙනසක් නිර්මාණය නොවන (ස්ථාවර වෙනසක් ) මෝටර් වාහන 25 ක භාවිත අයිතිය වත්කම් ලෙස හඳුනාගෙන ඊට අදාලව වත්කමේ ධාරණ අගය හා කල්බදු වගකීම අතර වෙනස විලම්භිත බදු වගකීම් ලෙස රු.106,761,454 ක් ගණනය කිරීම හා 2016/17 කාල පරිච්ඡේදයට අදාළව අත්පත් කරගෙන තිබූ අස්පෘශ්‍ය වත්කම් වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී විලම්භිත බදු වගකීම ලෙස රු.4,115,886 ක් ගණනය කිරීම හේතුවෙන් එකතුව රු.110,877,340 කින් විලම්භිත බදු වගකීම අධි තක්සේරු වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 80 (බී) වගන්තිය අනුව 2022/23 තක්සේරු වර්ෂයට අදාළව රු.286,520,680ක් වූ බදු අධි වෙන්කිරීම ප්‍රවර්තන වර්ෂයේ බදු වියදමින් අඩුකළ යුතු වුවත් ප්‍රවර්තන වර්ෂයේ බදු ගෙවීම් වලට එම අගය එකතු කිරීම හේතුවෙන් වර්ෂයේ බදු වියදම එම අගයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඉ) උක්ත ප්‍රමිතයේ 88 වන වගන්තිය අනුව , බදු අධිකාරීන් සමග පවතින නොවිසඳුනු ආරවුල් (unresolved dispute) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 20 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන අයිතමයන් බදු පෙර ලාභයට ගැලපිය යුතු වුවත්, කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබූ පෙර වර්ෂයන්ට අදාළ ගෙවිය යුතු රු.1,388,788,991 ක් බදු පෙර ලාභයට ගලපා නොතිබීම හා වර්ෂයේ ආදායම් බදු සඳහා වූ තත්‍ය වියදම රු.226,778,807ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,615,567,798ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට සිදුකරන ලද එකතුව රු.132,814,814 ක ගැලපීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ලාභයට එකතු කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ රු.1,670,958,783 ක් වූ වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම මුදල් ගලා යාමක් ලෙස හඳුනා ගත යුතු වුවත් කාර්යාංශය විසින් මුදල් ගලා ඒමක් ලෙස රු.292,206,413 ක් හඳුනා ගැනීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,963,165,196 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ විවිධ ණය හිමියන්ගේ රු.1,184,188,776 ක අඩුවීම රු.1,860,049,996 ක් ලෙස ගැලපීම හේතුවෙන් හා විලම්භිත බදු ගැලපීම් රු.4,010,206 ක් මුදල් ගලායෑමක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 679,871,426 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කුවේට් වන්දි අරමුදලේ ස්ථාවර තැන්පත්වලට අදාල විදේශ මුදල් හුවමාරු අලාභය විගණනයේ ගණනය කිරීම අනුව රු.513,141,327ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනයේ එය රු.511,622,072 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් කුවේට් වන්දි අරමුදලේ ශේෂය හා කුවේට් වන්දි ස්ථාවර තැන්පතුවල ශේෂය රු.1,519,255 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 නොවැම්බර් 24 දින සිට 2021 මාර්තු 09 දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් කුවේට්හි කම්කරු සුභසාධන අංශයට අදාළව ගෙවිය යුතු (කුවේට් ඩිනාර් 41,130.373 ක්) රු.43,310,283ක ජල බිල්පත් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතු වටිනාකම රු.373,132,590 ක් වූ විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ණයහිමි ශේෂ හා 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.869,955,802ක් වූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු සනාථ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සමූහයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයට අදාලව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමූහය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමූහයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සිත්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 21 යටතේ දක්වා ඇති හෙලිදරව් කිරීම් හැර පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාංශය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාපාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ V වැනි පරිච්ඡේදයේ 4.3 හා 7.1 වගන්ති | 2019 සිට 2023 මාර්තු 10 දින දක්වා කම්කරු ලිපිකරුවෙකු ලෙස කුවේට් තානාපති කාර්යාලයහි කම්කරු සුභසාධන අංශයේ සේවය කරන ලද නිලධාරියෙකු 2023 මාර්තු 09 දින සේවය අවසන් කර නැවත මාර්තු 15 දින කාර්යාංශයේ සේවයට වාර්තා කර තිබුණි. ඔහු වෙත දූත මණ්ඩල සේවය සඳහා ලබාදී තිබූ කාර්යාලීය ගුවන් ගමන් බලපත්‍රය හා එරට තානාපති කාර්යාලය මගින් නිකුත් කර තිබූ හැඳුනුම්පත නැවත භාර දීමකින් තොරව හා විධිමත් අනුමැතියකින් තොරව මාර්තු 16 දින සිට නැවත සේවයට වාර්තා කර නොතිබුණු අතර 2023 මාර්තු 29 දින විදේශගත වී තිබුණි. ඒ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව පාරිතෝෂික ලෙස රු.514,055ක් 2023 අප්‍රේල් 06 දින ගෙවීම් කර තිබුණි. විදේශගතවී මාස 05 කට පසු එනම් 2023 සැප්තැම්බර් 21 දින සිට ස්ව කැමැත්තෙන් සේවය හැර ගියාසේ සලකා කටයුතු කරන බවට සාමාන්‍යාධිකාරී විසින් ලිපියක් නිකුත් කර තිබීමත්, පාරිතෝෂික මුදල් ගෙවීම් කිරීමත් විගණනයේදී ගැටළු සහගත විය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 135 හා138 | 2022 ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ රු.4,176,085 ක් වටිනා ගෙවීම් වවුචර් පත් 21 ක් මුදල් රෙගුලාසි වලට පටහැනිව අනුමත කිරීම, නිර්දේශ කිරීම හා සහතික කිරීම යන සියළු කාර්යයන් ඕමාන් තානාපති කාර්යලයේ කම්කරු සුභසාධන අංශයේ තුන්වන ලේකම් විසින් සිදුකර තිබුණි. |
| (ඇ) 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයෙහි ක්‍රියාකාරී අත්පොතේ 6.6 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, කාර්යාංශය විසින් දින 100 ක් ප්‍රමාද වී 2023 ජූනි 10 දින මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2023 අප්‍රේල් 6 දිනැති අංක 01/2023 දරන සභාපතිගේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2023 වර්ෂයේදී දූත මණ්ඩල සේවය සඳහා පෙර දූත මණ්ඩල සේවයේ නිරතව සිටි කාර්යාංශයේ නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන තිබූ අතර, ඉන් දෙදෙනෙකු 3 වන හා 4 වන වතාවට දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණි නිලධාරීන් විය. තවද දූත මණ්ඩල සේවය අවසන් කර වසර 3 ක් කාර්යාංශයේ සේවය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙකුද බඳවාගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| **කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ | |
| i. 24(1) වගන්තිය | කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රලාභීන් නොවන පුද්ගලයින් විසින් ශ්‍රමිකයින් විදේශගත කරන බව පවසා මුදල් එක්රැස් කර කටාර් රාජ්‍ය වෙත ශ්‍රමිකයින් විදේශගත කිරීම සම්බන්ධයෙන් පැමිණිළි 11 කට ආසන්න ප්‍රමාණයක් විශේෂ විමර්ශන අංශය වෙත ලැබී තිබුණද එම පුද්ගලයින් සම්බන්ධයෙන් පනතේ 62 හා 63 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| ii 28(1) (අ) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලාභීන් හතර දෙනෙකු විසින් ව්‍යාජ ලිපිලේඛන මගින් රැකියා ඇණවුම් සකස් කර කටාර් රාජ්‍ය වෙත ශ්‍රමිකයින් විදේශගත කර තිබූ බවට 2023 අප්‍රේල් 17 දින සිට 2023 නොවැම්බර් 20 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී එහි හිමිකරුගෙන් හා තානාපතිතුමන්ගෙන් පැමිණිලි ලැබී ඇති බවත් එලෙස විදේශ ගත කරනු ලැබූ ශ්‍රමිකයෙකු 2024 මැයි 16 දින මිය ගොස් තිබූ බවත්, එහි වගකීම කිසිවකු භාර නොගත් බවත් කාර්යාංශයේ සභාපති වෙත තානාපති විසින් දන්වා තිබුණි. තවද ඉහත කරුණු පිළිබඳව විමර්ශනයක් කර, ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගෙන තානාපති කාර්යාලය දැනුවත් |

කරන ලෙස ලිපි 7ක් තානාපති විසින් යොමුකර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර 2024 ඔක්තෝබර් 29 දින දක්වා වාර්තාවක් යොමු කර නොතිබුණි.

**iii** 44 වගන්තිය

ලියාපදිංචි බලපත්‍රලාභියකු විසින් කාර්යාංශය වෙත ඉදිරිපත් කර තිබූ රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයින්ගෙන් මුදල් අය කිරීමකින් තොරව විදේශගත කරන ලෙස කාර්යාංශය විසින් ලබා 'දී තිබූ අනුමැතිය අවභාවිතා කර 2022 වර්ෂයේ සිට බලපත්‍රලාභීන් නොවන පුද්ගලයින් විසින් ශ්‍රමිකයින් විදේශගත කිරීමට මුදල් අයකර ලියාපදිංචි බලපත්‍රලාභියාගේ රැකියා ඇණවුම් මඟින් ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම සඳහා ව්‍යාජ තොරතුරු ඇතුලත්කර විදේශගත කර තිබුණි. ඉන් රැකියාවන් නොමැතිව 50 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් නැවත ලංකාවට පැමිණ කාර්යාංශය වෙත පැමිණිලි කර තිබූ බව විගණනය විසින් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදි නිරීක්ෂණය විය. එහෙත් කාර්යාංශය විසින් අදාළ බලපත්‍රලාභියාට හා මුදල් අයකරගත් පුද්ගලයින්ට එරෙහිව ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අගතියටපත් පාර්ශවයන් වෙත සාධාරණ විසඳුමක් ලබාදී නොතිබුණි.

**iv** 48(2) වගන්තිය

කාර්යාංශයේ විදේශීය සුභසාධන අරමුදල් කමිටු අනුමැතියකින් තොරව ඕමාන් දූත මණ්ඩල කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ උපදේශක විසින් ගෘහසේවිකාවකගේ රෝහල් බිලක් පියවීම සඳහා 2023 ඔක්තෝම්බර් 22 දින රු.2,549,640 ක් ගෙවීම් කර තිබුණි.

**v** 53(3) වගන්තිය

පනතේ විධිවිධාන වලට පටහැනිව ඇමෙරිකානු ඩොලර් 100ක් කාර්යාංශය වෙත තැන්පත් කිරිමෙන් අනතුරුව එක්සත් අරාබි එමිර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට රැකියා ගිවිසුමක් නොමැතිව සංචාරක වීසා මත ගෘහ සේවිකාවන් විදේශගත කිරිමට 2023 මාර්තු 20 දිනැති අංක 07/2023 දරන සභාපති චක්‍රලේඛය මඟින් කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රලාභින්ට අනුමැතිය ලබාදි තිබුණි. එදින සිට 2024 ජූනි 6 දින වන විට රාජ්‍යයන් දෙකක් වෙත සංචාරක වීසා මත ගෘහ සේවිකාවන් 4,942 ක් විදේශගත කර තිබූ අතර ඉන් 3,954ක් වෙත චක්‍රලේඛය ප්‍රකාරව දින 30ක් ඉක්මයාමට පෙර

රැකියාවක් ලබාදුන් බවට අදාළ ලියකියවිලි තානාපති කාර්යාලයේ තොරතුරු පරීක්‍ෂක පද්ධතියට උඩුගත කර නොතිබුණි.

**2.2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂමලෙසසහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3. වෙනත් කරුණු

(අ) 2023 ජූලි 25 දින දකුණු කොරියාව බලා පිටත්ව යාමට නියමිතව සිටි ශ්‍රමිකයින් 6 දෙනෙකු විසින් එදිනට නියමිත ගුවන්යානයේ ටිකට්පතක් රු.272,000කට හා ටිකට්පත් 5ක් රු.279,000 කට සෘජුවම ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් මිලදී ගෙන තිබුණු අතර විදේශ රැකියා ඒජන්සි සමාගමෙන් එම ටිකට්පත් රු.319,522 ක මිලකට මිලදී නොගැනීම හේතුවෙන් ඔවුන්ව එදින කොරියාව බලා පිටත් කර යැවීම අත්හිටුවා තිබුණි. ඉන් එක් ශ්‍රමිකයෙකු පමණක් නැවත රු.319,522 ක් ගෙවීමෙන් පසු එම ගුවන් යානයේම ද අනෙකුත් ශ්‍රමිකයින් 5 දෙනා ඉන් මාසයකට පසුව රු.329,291ක් බැගින් ගෙවා නැවත වරක් ටිකට්පත් මිලදී ගෙන යැවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව කාර්යාංශයේ ඉහළ කළමණාකාරිත්වය විසින් මෙම ශ්‍රමිකයින් 6දෙනා සඳහා ටිකට්පත් වෙනුවෙන් රු.1,961,225 ක් වැඩියෙන් වැය කිරීමට කටයුතු සලස්වා තිබුණි.

(ආ) කුවේට් දූත මණ්ඩල කාර්යාලයේ පිහිටි සුරක්ෂා නිවාසය 2021 මාර්තු 09 දින සිට මෙම ගොඩනැගිල්ලෙන් ඉවත් කර නිවාස පාදක නිලධාරියකුගේ නිවසක් ලෙස භාවිතා කිරීම හේතුවෙන් තානාපති සේවය අපේක්ෂාවෙන් පැමිණෙන ගෘහසේවිකාවන්ට රාත්‍රී කාලයේදී හා සති අන්තයේදී අදාළ ගැටළු විසඳා ගන්නා තෙක් නවාතැන් ගැනීමට සුදුසු ස්ථානයක් නොතිබුණි. තවද 2023 වර්ෂය සඳහා නිවාස පාදක නිලධාරීන් දෙදෙනාගේ නිළ නිවාස සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමත කුලී ගාස්තු සීමාව ඉක්මවා රු.21,330,047 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කාර්යාංශයට අයත් ඕමාන් තානාපති කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ සුරක්ෂා නිවාසයක් පවත්වාගෙන යෑමේ හැකියාව පැවතියදී 2019 ඔක්තෝබර් 01 දින සිට 2024 ජූලි දක්වා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණු අතර 2024 ජනවාරි දක්වා දළ වශයෙන් (ඕමාන් රියාල් 34,000 ක් ) රු.28,561,112 ක් ගෙවා තිබුණි. තවද 2022 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී නවාතැන් ගෙන සිටි රැඳවියන් විසින් සුරක්ෂා නිවාසයට සිදුකරන ලද අලාභහානි අලුත්වැඩියාකර හිමිකරු වෙත භාරදීම ප්‍රමාද වූ 2023 පෙබරවාරි සිට අගෝස්තු දක්වා වූ මාස 7ක කාලපරිච්ඡේදය වෙනුවෙන් කුලී ගාස්තු, ජලබිල්පත් , විදුලි බිල්පත් හා අලාභහානි සඳහා රු.19,130,480 ක් ගෙවා තිබුණි.

(ඇ) ඕමාන් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සුරක්ෂා නිවාසයක් ලෙස භාවිතා කිරීමට අනුමැතිය ලබාදී නොතිබුණු ගොඩනැගිල්ලක් 2023 වර්ෂය සඳහා කුලී පදන්ම මත ලබාගෙන ගිවිසුම් ගත වීමකින් තොරව ඕමාන් රියාල් 7200 ක් හෙවත් රු.6,872,544 ක් ගෙවා තිබුණි.

(ඉ) ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා ප්‍රථමවරට විදේශගත වන ගෘහසේවිකාවන්ට බෙදා දීම සඳහා රු.5,000 ක් හා රු.2,500 ක් වටිනා සතොස තෑගි වවුචර්පත් පිළිවෙලින් 14,000 ක් හා 28,000 ක් සියයට 1ක වට්ටමක් යටතේ රු.138,600,000 කට 2023 ඔක්තෝබර් 13 දින මිලදී ගෙන තිබුණි. 2024 අගෝස්තු 14 දින වන විට ඉන් රු.128,229,300 ක් වටිනා වවුචර් පත් 13,005ක් ඉතිරිවී තිබුණි. ප්‍රථම වතාවට විදේශ ගත වන කාන්තාවන් පෙර විදේශ ගතව සිටි බවට ලියකියවිලි ඉදිරිපත් කර පුහුණුවෙන් නිදහස් කර තිබීම හා උත්සවය පැවැත්වීම ප්‍රමාදවීම මේ සඳහා හේතු වී තිබුණි.

(ඊ) 2022 ජුනි 07 දිනැති කාර්යාංශයේ සභාපතිගේ ලිපියට හා 2023 ජනවාරි 09 දිනැති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු) ලිපියට පටහැනිව පළමු වතාවට විදේශ ගතවන ගෘහ සේවිකාවන් සඳහා රු.22,410 ක් ගාස්තුවක් අය කර දින 28 ක (NVQ Level 3) නේවාසික පුහුණුවක් ලබා නොදී 2023 ජනවාරි සිට 2024 මැයි 29 දින දක්වා කාල පරිච්ඡේදය තුළදී ගෘහ සේවිකාවන් 28,165 දෙනෙක් පළමු වතාවට විදේශ ගත කර තිබීම හේතුවෙන් රු.631,177,650ක පුහුණු ආදායමක් කාර්යාංශයට අහිමි වී තිබුණි.

(උ) 2022 ඔක්තෝම්බර් 15 හා 16 දෙදින, ගාල්ල සමනළ උයනේදී පැවති වැඩසටහන සඳහා වෙළඳ කුටියක් රු.170,000 බැගින් හා 2023 ජූලි 15 හා 16 දිනයන්හි යාපනය දිස්ත්‍රික්කයේ පැවති වැඩසටහන සඳහා කුටියක් රු.500,000 බැගින් පිළිවෙලින් කුටි 30ක් හා කුටි 25ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පුද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණි. ඒ අනුව කුටියක මිල රු.330.000කින් වැඩිවීම පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව 2023 මැයි 29 දිනැති කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන කුටි 25 වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.12,500,000ක් ගෙවීම් කර තිබුණි.

(ඌ) දකුණු කොරියාවේ ධීවර අංශයේ රැකියාවක නියුතුව සිටි ශ්‍රමිකයෙකු 2019 ඔක්තෝබර් 08 දින අනතුරකට පත්වීම හේතුවෙන් ඔහු මෙරටට ගෙන්වා ගැනීම සඳහා සහෝදරයා විසින් රු.1,564,546ක් කාර්යාංශයේ තැන්පත් කර තිබියදී, මොහු ශ්‍රී ලංකාවට නැවත එවීමට හා රෝහල් බිල පියවීම සඳහා කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකු විසින් ඔහුගේ එරට බැංකු ගිණුම්හි තැන්පත් මුදල් භාවිතා කර තිබුණි. තවද, කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකුගේ ණය කාඩ්පත භාවිතා කර ගුවන් ටිකට්පත මිලදී ගෙන තිබුණි. එම දරන ලද වියදම පිළිබඳව පරීක්ෂා කිරීමකින් තොරව සහෝදරයා විසින් තැන්පත් කර තිබූ මුදලින් ඉතිරිව තිබූ රු.98,786ක් පමණක් 2023 අගෝස්තු මාසයේදී ඔහු වෙත ගෙවා තිබුණි.

(එ) 2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින රු.100,000,000 ක මුදලක් සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේ කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත්, එම මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු විවිධ තැන්පතු යටතේ පැවති රු.1,000,000 ක ශේෂය හා 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල එකතුව රු.1,388,788,991ක් වූ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමකින් හා විධිමත් අනුමැතියකින් තොරව පිළිවෙලින් සමුච්චිත අරමුදලට හා වර්ෂයේදී ආදායමට හර හා බැර කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ පරිපාලිතයේ 2023දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව. (අවසන් වාර්තාව)

| විගණකාධිපතිගේ වාර්තාව | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| 1. **මූල්‍ය ප්‍රකාශන**<br>1.1 **තත්තවාගණනය කළ මතය**<br>1.2 **තත්තවාගණනය කළ මතය සඳහා පදනම**<br>(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 36 ඡේදය සමාලෝචිත වර්ෂය තුළදී කාර්යාංශයේ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර තිබුණද දූත මණ්ඩලවල පවතින පිරිවැය රු.447,392,585ක් වූ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2023.12.31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල,දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන හා ගුවන් තොටුපළ ඒකකයන්හි වත්කම් 24398ක ප්‍රමාණයක් ප්‍රත්‍යාගණනය සිදු කර ඇත.<br>එහෙත් විදේශ දූත මණ්ඩල සතු පිරිවැය රු. 447,392,585 ක් වු දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර අවසන් කිරිමට නොහැකි වුයේ එම කටයුතු නව අත්දැකිමක් වශයෙන් අදාළ රටවල සේවා සපයන්නන් වෙතින් සිදු කිරිමට උත්සහ කිරිමේදී එය අසාර්ථක වු බැවිනි. එබැවින් ඒ සඳහා නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සිදු කරමින් පවතී. |
| (ආ) කාර්යාංශය සතු දඹුල්ල ඉඩම සහ වර්ෂ 50කබදු පදනම මත ලබාගෙන තිබූ හෝමාගම ඉඩම ප්‍රත්‍යාග ණනය කර නොතිබියදී, එම ඉඩම්වල පිරිවැය වූ රු. 68,000,000 ක් හා සමුච්චිත ක්ෂය රු.18,029,749ක් ප්‍රත්‍යාගණනය සංචිත ගිණුමට පිළිවෙලින් හර හා බැර කර තිබිම හේතුවෙන් ප්‍රත්‍යාගණනය සංචිත ගිණුමේ ශේෂය හා ඉඩම්වල වටිනාකම රු. 49,970,251 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දඹුල්ල විගමණික මධ්‍යස්ථානයට අයත් ඉඩමේ ඔප්පුවේ සහ පිඹුරු පතෙහි පැවැති දෝෂයක් හේතුවෙන් මේ සඳහා ප්‍රත්‍යාගණනය සිදු නොකල අතර නීති උපදෙස් ලබාගැනිමෙන් අනතුරුව අදාළ නිරාකරණයන් සිදුකිරිමෙන් පසුව ප්‍රත්‍යාග ණනය සිදුකරනු ලැබේ.<br>හෝමාගම ඉඩමෙහි කොටසක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් පවතින අතර ඒ වෙනුවට වෙනත් ඉඩමක් කාර්යාංශය වෙත ලබා දීමට කටයුතු කරමින් පවතී.අදාළ තත්ත්වය සැලකිල්ලට ගෙන ප්‍රත්‍යාගණනයක් සිදු නොකල අතර අදාළ ඉඩම සඳහා ගෙවූ මුදල සහ තව දුරටත් ගෙවිය යුතු මුදල කාර්යාංශයේ ගිණුම් වල පෙන්වා ඇත.නමුත් මෙහි ගෙවිය යුතු මුදල ලෙස දක්වා ඇති වටිනාකම සඳහා ගිණුම් ගැලපුම් සිදු කල යුතු අතර ඉන් අනතුරුව නව අගයන් සඳහා ගිණුම් පිළියෙල කල යුතු වේ.<br>2024 වර්ෂයේ දී නිවැරදි කරනු ලබයි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණප්‍රමිත අංක 12-1 5වන පරිච්ඡේදය අනුව බදු ගණනයේදී බදු සදහා තාවකාලික වෙනසක් නිර්මාණය නොවන (ස්ථාවර වෙනසක්) මෝටර් වාහන 25 ක භාවිත අයිතිය වත්කම් ලෙස හඳුනාගෙන ඊට අදාළව වත්කමේ ධාරණ අගය හා කල්බදු වගකීම අතර වෙනස විලම්භිත බදු වගකීම ලෙස රු.106,761,454 ක් ගණනය කිරීම හා 2016/17 කාල පරිච්ඡේදයට අදාළව අත්පත් කරගෙන තිබූ අස්පෘශ්‍ය වත්කම් වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී විලම්භිත බදු වගකීම ලෙස රු. 4,115,886 ක් ගණනය කිරීම හේතුවෙන් එකතුව රු. 110,877,340 කින් විලම්භිත බදු වගකීම අධි තක්සේරු වී ඇත. | විගණනයෙන් පෙන්වා දෙන කරුණු නිවැරදි වේ. ඉදිරියේදී නිවැරදි ගැලපීම් සිදු කරනු ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 අංක හි 80 (බී) වගන්තිය අනුව 2022/23 තක්සේරු වර්ෂයට අදාළව රු. 286,520,680 ක්වූ බදු අධි වෙන්කිරීම ප්‍රවර්තන වර්ෂයේ බදු වියදමින් අඩු කළයුතු වුවත් ප්‍රවර්තන වර්ෂයේ බදු ගෙවීම් වලට එම අගය එකතු කිරීම හේතුවෙන් වර්ෂයේ බදු වියදම එම අගයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වාදෙන කරුණු නිවැරදිවේ. 2022 වර්ෂයට අදාළ ආදායම් බදු අධි වෙන් කිරීම නිවැරදි කිරීමේදී පෙර වර්ෂයේ රඳවාගැනීමේ ලාභයෙන් ගැලපීම සිදු කොට ඇති අතර නිවැරදි ලෙස ආදායම් බදු වාර්තාවන්, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත අදාළ වර්ෂයේදී යොමු කොට ඇත. ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු අධි තක්සේරුවක් පැවතියද එමගින් සමස්ථයක් වශයෙන් ගත් විට බදු සඳහා බලපෑමක් සිදු වී නොමැත. මෙවැනි වර්ගයේ ගැලපීම් ඉදිරියේදී නිවැරදි කරනු ඇත. |
| (ඉ) උක්ත ප්‍රමිතයේ 88 වන වගන්තිය අනුව, බදු අධිකාරීන් සමග පවතින නොවිසදුනු ආරවුල් (unresolved dispute) සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණබ ප්‍රමිත අංක 37 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම බදු වගකිම වන රු.91,164,396.30ක මුදල 2021 වර්ෂයේ අවසන් ගිණුම්වල බදුවෙන් කිරීම් වල පෙන්වා ඇත. 2022 වර්ෂයේ දි මේ සම්බන්ධයෙන් අවසන් ගිණුම් වල හෙළිදරව් කොට ඇත.මෙය ඉදිරියේ දි නිවැරදිකරනු ඇත. |
| (ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 20 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන අයිතමයන් බදු පෙර ලාභයට ගැලපිය යුතු වුවත්, කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගෙන තිබූ පෙර වර්ෂයන්ට අදාළ ගෙවිය යුතු රු.1,388,788,991 ක්බදු පෙර ලාභයට ගලපා නොතිබිම හා වර්ෂයේ ආදායම් බදු සඳහා වූ තත්‍ය වියදම රු. 226,778,807 ක් වැඩියෙන් දක්වා තිබිම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 1,615,656,798 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට සිදු කරන ලද එකතුව රු. 132,814,814 ක ගැලපීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ලාභයට එකතු කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි. | කාර්යාංශය විසින් සමාලෝචිත වසරේදි මුදල් නොවන ආදායම රුපියල් 1,388,788,991ක බදු පෙර ලාභයට ගලපා නොතිබීම හේතුවෙන් මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයම වැඩි වී ඇත.නමුත් කාරක ප්‍රාග්ධනය වෙනස්වීමද එම ප්‍රමාණයෙන්ම අඩුවී ඇත. මෙමගින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසාන ශේෂයට බලපෑමක් සිදුවී නොමැත. ඉදිරි වර්ෂයේ සිට නිවැරදිව ගැලපුම් කිරීමට කටයුතු කරනු ඇත. |

| | |
|---|---|
| (උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධනය ගැලපීම් යටතේ රු.1,670,958,783 ක වූ වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම මුදල් ගලා යාමක් ලෙස හඳුනා ගත යුතු වුවත් කාර්යාංශය විසින් මුදල් ගලා ඒමක් ලෙස රු.292,206,413 ක් හඳුනා ගැනීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.1,963,165,196 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දෙන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ රුපියල් 1,670,958,783 ක මුදල් ගලායාමක් ලෙස සඳහන් කල ද, එය රුපියල් 292,206,413 ක මුදල් ගලා ඒමක් ලෙස නිවැරදි විය යුතුය. ඊට හේතුව වනුයේ ඉහත සඳහන් වටිනාකමින් රුපියල් මිලියන 26ක හෝමාගම ඉඩමට අදාළ ගැලපීමක් ඇති අතර එය කාර්යාංශයෙන් මුදල් ගලා නොයෑමකි. රුපියල් 1,937,544,813ක ලැබිය යුතු පොලී ආදායම ගැලපීමත්, උපලබ්ධි නොවූ විදේශ විනිමය ලාභය රුපියල් 379,617ක වටිනාකමක් ගැළපීම තුළින් රුපියල් 292,206,413ක වටිනාකම නිරූපණය වී ඇත. |
| (ඌ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ විවිධ ණය හිමියන්ගේ රු.1,184,188,776ක අඩුවීම රු.1,860,049,996 ක් ලෙස ගැලපීම හේතුවෙන් හා විලම්භිත බදු ගැලපීම් රු. 4,010,206 ක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු. 679,871,426 ක් අඩුවෙන් දක්වා තිබුණි. | කාරක ප්‍රාග්ධනය ගැලපීම් යටතේ විවිධ ණය හිමියන්ගේ රුපියල් 1,844,776 අඩු වීම මූල්‍ය ප්‍රකාශන තුළ රුපියල් 1,860,049,996 මුදල් ගලා යාමක් ලෙස හඳුනා ගැනීමට හේතුව වූයේ විවිධ ණය හිමියන් තුළ උපලබ්ධි නොවූ විදේශ හුවමාරු අවාසි රුපියල් 675,861,220 ක් ගිණුම්ගත වී ඇති බැවිනි. එය මුදල් ගලා යාමක් නොවන බැවින් කාරක ප්‍රාග්ධනය ගැලපීම් යටතේ විවිධ ණය හිමියන්ගේ මුදල් ගලායාම වෙනස් වීමට බලපා ඇත. |
| (එ) කුවෙට් වන්දි අරමුදලේ ස්ථාවර තැන්පත් වලට අදාළ විදේශ මුදල් හුවමාරු අලාභය විගණනයේ ගණනය කිරීම අනුව රු. 513,141,327 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනයේ එය රු. 511,622,072 ක් ලෙස ගිණුගත කර තිබීම හේතුවෙන් කුවෙට් වන්දි අරමුදලේ ශේෂය හා කුවෙට් වන්දි ස්ථාවර තැන්පතුවල ශේෂය රු. 1,519,255 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදි නොවන අතර කාර්යාංශය විසින් කුවේට් අරමුදලට අදාළව ගණනය කරන ලද විදේශ විනිමය හුවමාරු අලාභය රුපියල් 526,054,566කි. |

| | |
|---|---|
| (ඒ) 2014 නොවැම්බර් 24 දින සිට 2021 මාර්තු 09 දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් කුවේට්හි කම්කරු සුභසාධන අංශට අදාළව ගෙවිය යුතු (කුවේට් ඩිනාර් 41,130.373 ක්) රු. 43,310,283 ක ජල බිල්පත් ගිණුම්ගත කර නොතිබුණි. | තානාපති කාර්යාලයේ පරිපාලන කටයුතු සිදුකරනු ලබන්නේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන කොන්සියුලර් අංශය මගිනි. ජල හා විදුලි බිල්පත් ලැබෙනුයේ තානාපති කාර්යාලයේ කොන්සියුලර් අංශය වෙතය. කාර්යාංශය මගින් ගෙවනු ලබන්නේ කොන්සියුලර් අංශය මගින් කම්කරු හා සුභසාධන අංශය වෙත දන්වනු ලබන ප්‍රමාණය අනුවය. මෙම තත්ත්වය උද්ගතව ඇත්තේ මාසිකව/ තෛමාසිකව/ අර්ධ වාර්ෂිකව හෝ වාර්ෂිකව බිල්පත් ලබාදීම එරට අදාළ ආයතන විසින් කටයුතු නොකිරීම හේතුවෙනි. ඒ පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවධානයට අවස්ථා ගණනාවකදී යොමුකොට ඇත. මෙම බිල්පත් ලබා ගැනිමට අදාළ කටයුතු සිදු කරනු ලබන්නේ තානාපති කාර්යාලයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරින් විසින් වන අතර තානාපති කාර්යාලය කිහිප අවස්ථාවකදීම මෙම බිල්පත් ලබා ගැනිමට උත්සාහ කළද සාර්ථක වී නොමැත. එය තානාපති කාර්යාලයේ පාලනයෙන් බැහැර ක්‍රියාවලියක් වේ.<br><br>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී අදාළ බැරකම පිළිබඳ නිශ්චිත අගයක් හඳුනා ගෙන නොතිබුන බැවින් ගිණුම්ගත කිරීමක් සිදු කර නොමැත. |
| (ඔ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතු වටිනාකම රු. 373,132,590 ක් වූ විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ණයහිමි ශේෂ හා 2003 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 869,955,802 ක් වූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු සනාථ කිරිමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ශේෂයන් ලෙජරයේ ගිණුම්ගත වී ඇත.<br><br>විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල කාර්යාංශය වෙත ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | |
|---|---|---|
| (අ) ශ්‍රීලංකාප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ v වැනි පරිච්ඡේදයේ4.3 හා 7.1 වගන්ති | 2019 සිට 2023 මාර්තු 10 දින දක්වා කම්කරු ලිපිකරුවෙකු ලෙස කුවේට් කම්කරු සුභසාධන අංශයේ සේවය කරන ලද නිලධාරියෙකු 2023 මාර්තු 09 දින සේවය අවසන් කර නැවත මාර්තු15 දින කාර්යාංශයේ සේවයට වාර්තා කර තිබුණි. ඔහු වෙත දූත මණ්ඩල සේවය සඳහා ලබාදී තිබූ කාර්යාලීය ගුවන් ගමන් බලපත්‍රය හා එරට තානාපති කාර්යාලයමගින් නිකුත් කර තිබූ හැඳුනුම්පත නැවත භාර දීමකින් තොරව හා විධිමත් අනුමැතියකින් තොරව මාර්තු 16 දිනසිට නැවත සේවයට වාර්තා කර නොතිබුණු අතර 2023 මාර්තු 29 දින විදේශ ගත වී තිබුණි. ඒ සම්බන්ධයෙන් ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව පාරිතෝෂික ලෙස රු. 514,055 ක් 2023 අප්‍රේල් 06 දින ගෙවීම් කර තිබුණි. විදේශගතවී මාස 05 කට පසු එනම් 2023 සැප්තැම්බර් 21 දින සිට ස්ව කැමැත්තෙන් සේවය හැර ගියාසේ සලකා කටයුතු කරන බවට සාමාන්‍යාධිකාරි විසින් ලිපියක් නිකුත් කර තිබීමත්, පාරිතෝෂික මුදල් ගෙවීම් කිරීමත් විගණනයේදී ගැටළු සහගත විය. | (අ) කම්කරු ලිපිකරුවෙකු ලෙස සේවය කළ එන්.පී.එම්. අන්වර් මහතා දූත මණ්ඩල සේවය අවසන් කොට 2023.03.13 දින නැවත ලංකාවට පැමිණ ඇත. නමුත්, ඔහු වෙත නිකුත් කොට ඇති රාජකාරි ගමන් බලපත්‍රය කාර්යාංශය වෙත භාරදී නොමැති බැවින්, එය කඩිනමින් කාර්යාංශය වෙත භාර දෙන මෙන් ඔහු වෙත ලිඛිතව දන්වා ඇත. මේ අතරතුර ඔහු විසින් කාර්යාංශය සේවයෙන් ඉල්ලා අස්වීමට ඉල්ලුම් කළද කාර්යාංශය විසින් එය පිළිනොගන්නා ලදි. නමුත් ඔහු සේවයට වාර්තා නොකිරිම හේතුවෙන්ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ජේදයේ 7:1 උප වගන්තිය අනුව, 2023.03.29 දින සිට බලපැවැත්වෙන පරිදි ඔහු ස්ව කැමැත්තෙන් සේවය හැර ගියා සේ සලකා කාර්යාංශය කටයුතු කරන ලද අතර එය ඔහු සම්බන්ධයෙන් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගය වේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 13 වන වගන්ති යට අනුව, පාරිතෝෂික අහිමි කළ හැක්කේ, වංචා කිරීමේ, සේවායෝජකගේ අරමුදල් ව්‍යපහරණය කිරීමේ, සේවායෝජකගේ බඩුවලට හෝ දේපළ වලට පාඩු සිදු කිරීමේ හේතු නිසා සේවාවන් අවසන් කරනු ලැබුවා වූ අවස්ථාවක ඔහු විසින් සිදු කරනු ලබන අලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණයටය. එසේ නොවන අවස්ථාවක පාරිතෝෂික මුදල නියමිත දින ගෙවිය යුතු වේ. මොනයම් කරුණක් නිසාවත් හෝ පාරිතෝෂික මුදල රඳවා තබා ගැනීමට හෝ පාරිතෝෂික මුදලින් වෙනත් අය කිරීම් සිදු කිරිමට පාරිතෝෂික ගෙවීම් පනත අනුව සේව්‍යයා හට නීතිමය හැකියාවක් නොමැති අතර, පාරිතෝෂික මුදල් නියමිත දින ගෙවීමට ප්‍රමාද වුවහොත් එම මුදල සමඟ අධිභාරයද ගෙවීමට සිදු වේ.<br><br>එබැවින්, එන්.පී.එම්. අන්වර් මහතා සේවා කාලය අවසන් කර ඇති බැවින්, පාරිතෝෂික පනතට අනුව එම මහතාගේ පාරිතෝෂික ගෙවීම් සිදු කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල්රෙගුලාසි 135 හා138 | 2022 ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ රු. 4,176,085 ක් වටිනා ගෙවීම් වවුචර් පත් 21 ක් මුදල් රෙගුලාසි වලට පටහැනිව අනුමත කිරීම, නිර්දේශ කිරීම හා සහතික කිරිම යන සියළු කාර්යයන් ඕමාන් තානාපති කාර්යලයේ කම්කරු සුභසාධන අංශයේ තුන්වන ලේකම් විසින් සිදුකර තිබුණි. | (ආ) 2020 හා 2021 වර්ෂයන් හිදී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත කාර්යාංශයේ අහිතකර මූල්‍ය තත්ත්වයන් යටතේ හා අමාත්‍ය මණ්ඩල තීරණය මත දූත මණ්ඩලයන්හි සේවය කල කාර්යාංශ නිලධාරින් බහුතරයක් මෙරටට කැඳවන ලදී.බොහෝ රැකියා හා සුභසාධන අංශ වල සේවය කරනු ලැබුවේ සීමිත සේවක සංඛ්‍යාවක් වන බැවින් ගෙවීම් වවුචරයක් පිළියෙල කිරීම, පරික්ෂා කිරීම, නිර්දේශ කිරීම, අනුමත කිරීම හා සහතික කිරීම යන අංශ 05 ම ආවරණය කිරීම සඳහා නිලධාරීන් නොමැත. කෙසේ වුවද අදාළ ගෙවීම් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය තහවුරු කිරීම සඳහා ඒ වන විට රැකියා හා සුභසාධන අංශයේ නිලධාරීන් සිටින ප්‍රමාණය හා එයට අමතර වන විදේශ අමාත්‍යාංශය යටතේ පත් කරන ලද නිලධාරියෙකු හෝ තානාපතිතුමා මෙම ගෙවීම් වවුචර් අත්සන් කිරිමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම තුළින් මූල්‍ය පාලන ක්‍රමය සිදු කර ඇත. |
| (ඇ)2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2021නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයෙහි ක්‍රියාකාරී අත්පොතෙහි 6.6 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, කාර්යාංශය විසින් දින 100 ක් ප්‍රමාද වී 2023 ජූනි 10 දින මූල්‍ය ප්‍රකාශන විගණනය වෙතඉදිරිපත් කර තිබුණි. | (ඇ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය වෙත ලබා දීමට නොහැකි වූයේ ප්‍රධාන කාර්යාලය, පුහුණු මධ්‍යස්ථාන, පළාත් කාර්යාල හා ගුවන් තොටුපල ඒකකයෙහි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර අවසන් වී නොතිබුන බැවින් වන අතර ඉදිරි වර්ෂයේදී නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. |

| | | |
|---|---|---|
| (ඇ)2023 අප්‍රේල් 6 දිනැති අංක 01/2023 දරන සභාපතිගේ චක්‍රලේඛ | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව 2023 වර්ෂයේදී දූත මණ්ඩල සේවයේ නිරතව සිටි කාර්යාංශයේ නිලධාරින් 07 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, ඉන් දෙදෙනෙකු 3 වන හා 4 වන වතාවට දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණි නිලධාරින් විය.තවදදූත මණ්ඩල සේවය අවසන් කර වසර 3ක් කාර්යාංශයේ සේවය සම්පූර්ණ නොකරන ලද නිලධාරියෙකු ද බඳවා ගෙන තිබුණි. | (ඇ) 2023 අප්‍රේල් මස 06 දිනැති සභාපතිගේ චක්‍රලේඛ අංක 01/2023 ට අනුව විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී මින් පෙර විදේශ දූත මණ්ඩලවල සේවය කර නොමැති නිලධාරීන් හට ප්‍රමුඛතාවය ලබාදෙන බව සඳහන් කර ඇති අතර, එමඟින් මීට පෙර විදේශ දූත මණ්ඩලවල සේවය කර ඇති නිලධාරීන් නැවත තෝරා නොගන්නා බව ගම්‍ය නොවේ. තවද, බඳවා ගැනීමේ පටිපාටිය අනුව පෙර විදේශ දූත මණ්ඩලවල සේවය කළ නිලධාරීන් නැවත දූත මණ්ඩල සේවය සඳහා නුසුදුස්සන් ලෙස සඳහන් කර නොමැත.<br><br>එසේම රාජ්‍ය තාන්ත්‍රික තනතුරු සඳහා තෝරාගත් කාර්යාංශ නිලධාරින් අතර මීට පෙර විදේශ දූත මණ්ඩලවල සේවයේ නිරතව සිටි නිලධාරින් ගණන හය දෙනෙකු (06) වන අතර, විගණන විමසුමෙහි සඳහන් පරිදි හත්දෙනෙකු (07) නොවේ. ඉහත නිලධාරීන් හයදෙනා (06) පෙර විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණ කාර්යාංශයේ වසර 03 ක සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් වේ. එසේම රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු අනුපිළිවෙල මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදුන් අනුමැතිය ප්‍රකාරව එවකට කාර්යාංශ සභාපතිතුමා විසින් අදාළ නිලධාරීන් විදේශ දූත මණ්ඩල සේවය සඳහා තෝරා පත් කර ඇත. ඒ අනුව විගණන විමසුමෙහි සඳහන් කර ඇති පරිදි 89/2023 (එ-05) අංක දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර පැමිණ වසර 3 ක් කාර්යාංශයේ සේවය සම්පූර්ණ නොකරන ලද කිසිඳු නිලධාරියෙකු මෙම සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගෙන නොමැත. |

2.2.3

| කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව | අනුකූල නොවීම | පැමිණිලි අංකය | ගෙන ඇති පියවර |
|---|---|---|---|
| 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ<br>i. 24(1) වගන්තිය | කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රලාභීන් නොවන පුද්ගලයින් විසින් ශ්‍රමිකයින් විදේශගත කරන බව පවසා මුදල් එක්රැස් කර කාටර් රාජ්‍ය වෙත ශ්‍රමිකයින් විදේශගත කිරීම සම්බන්ධයෙන් පැමිණිලි 11 කට ආසන්න ප්‍රමාණයක් විශේෂ විමර්ශන අංශය වෙත ලැබී තිබුණද එම පුද්ගලයින් සම්බන්ධයෙන් පනතේ 62 හා 63 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | INV/299/2311<br>INV/238/2311 | අදාළ විගමණික ශ්‍රමිකයා ලියාපදිංචි කරන ලද බලපත්‍රලාභි මෙම පැමිණිල්ලට සම්බන්ධතාවයක් නැත. එසේ වුවද මුදල් ලබාගත් බාහිර පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට කටයුතු කරමින් සිටි. |
| | | INV/356/2306 | අදාළ පැමිණිල්ල සමථයකට පැමිණ ඇත. වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත මුදල් ගෙවා අවසන් කර ඇති බැවින්, පැමිණිලිකරු පැමිණිල්ල සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීමට එකග නොවූ අතර ගොනුව වසා දමන ලදී. |
| | | INV/107/2305 | මුදල් ලබාගන්නා ලද වගඋත්තරකරුට එරෙහිව විවෘත වරෙන්තුවක් නිකුත් කර ඇති අතර, විදේශ ගමන් තහනමක්ද නිකුත් කර ඇත. |
| | | INV/127/2302 | මෙම ගොනුවේ විමර්ශන කටයුතු මේ වන විටත් සිදු වන අතර, පැමිණිලිකරු කටාර්හි කම්කරු දෙපාර්තමේන්තුව හරහා මෙරටට පැමිණ ඇත. විමර්ශනයේදී අනාවරණය වූ පරිදි මේ සම්බන්ධයෙන් වෙනත් බලපත්‍රලාභියෙකු සම්බන්ධවී ඇති බවට තොරතුරු ලැබී ඇති බැවින්, ඔහුව අත්අඩංගුවට ගැනීමට නියමිතව ඇත. |
| | | INV/292/2308 | පැමිණිලිකරු පැමිණිලි පරීක්ෂණය සඳහා ඉදිරිපත් වි නොමැති අතර, වගඋත්තරකරුට මේ වන විට විවෘත වරෙන්තු නිකුත් කර ඇති අතර, වගඋත්තරකරුට එරෙහිව විදේශ ගමන් තහනමක්ද නිකුත් කර ඇත. |
| | | INV/232/2311 | විමර්ශන කටයුතු සිදුවෙමින් පවති. |

<table>
<tr>
<td></td>
<td>
<table>
<tr><td>INV/349/2306</td><td>මේ වන විටත් විමර්ශන කටයුතු සිදුවෙමින් පවතින අතර, මුදල් ලබාගන්නා ලද පුද්ගලයා දැනට කටාර්හි වෙසෙන උප ඒජන්තවරයෙකි. ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගැනිමට නොහැකි වී ඇති අතර, පැමිණිලිකරු විසින් ලබා දෙන ලද තොරතුරු මත මුදල් ගිණුමක් සම්බන්ධයෙන් මේ වන විට විමර්ශනයක් සිදුකරමින් පවතී.</td></tr>
<tr><td>INV/302/2311</td><td>විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී.</td></tr>
<tr><td>INV/248/2311</td><td>සැකකරුට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක B/33875/24 යටතේ නඩුවක් පවරා ඇත.</td></tr>
</table>
කාර්යාංශ පනතේ 62 හා 63 වගන්තිය යටතේ අධිකරණයේ නඩු ගොනු කල හැක්කේ අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් වූ සම්පූර්ණ විමර්ශනය කිරීමෙන් අනතුරුව පමණි.
එසේ නොමැතිව කටයුතු කල නොහැකි අතර, මෙම විමර්ශන ගොනු 2024.04.19 වන දින සිට 2024.07.30දින දක්වා හා 2024.10.07වන දින සිට 2024.10.14 දින දක්වා රජයේ විගණන අංශය භාරයේ තිබූ බවද විමර්ශන කටයුතු සම්පූර්ණ වූ පසු අධිකරණයට පැමිණිලි ගොනු කරන බවද සඳහන් කරමි.ඒ අනුව මෙහි දක්වා ඇති කරුණු හා එකඟ විය නොහැකිය.
</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| ii. 28 (1) (අ) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලාභීන් හතර දෙනෙකු විසින් ව්‍යාජ ලිපිලේඛන මගින් රැකියා ඇණවුම් සකස් කර කටාර් රාජ්‍ය වෙත ශ්‍රමිකයින් විදේශගත කර තිබූ බවට 2023 අප්‍රේල් 17 දින සිට නොවැම්බර් 20 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී එහි හිමිකරුවන්ගේ හා තානාපතිතුමන්ගේපැමිණිලි ලැබී ඇති බවත් එලෙස විදේශගත කරනු ලැබූ ශ්‍රමිකයෙකු 2024 මැයි 16 දින මිය ගොස් තිබූ බවත්, එහි වගකීම කිසිවකු බාර නොගත් බවත් කාර්යාංශයේ සභාපති වෙත තානාපති විසින් දන්වා තිබුණි. තවද ඉහත කරුණු පිළිබඳව විමර්ශනයක් කර, ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගෙන තානාපති කාර්යාලය දැනුවත් කරන ලෙස ලිපි 7 ක් තානාපති විසින් යොමු කර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන්විමර්ශනයක් සිදු කර 2024 ඔක්තෝබර් 29 දින දක්වා වාර්තාවක් යොමු කර නොතිබුණි. | (ii) බලපත්‍ර අංක 2860 දරන නියෝජිත ආයතනයට එරෙහිවපවතින අංක<br><br>INV/086/2305 දරන පැමිණිලි ගොනුවේ විමර්ශනවල අවසන් වාර්තාව මේ වන විට සකස්කරමින් පවතින අතර, එම කටයුතු අවසන් වූ වහාම කටාර්හි තානාපති කාර්යාලයට වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත.<br><br>පී.එස්.තනුෂාන් මහතා 2024.05.05 දින රිය අනතුරක් හේතුවෙන් මිය ගොස් ඇති අතර, ඔහුගේ දේහය 2024.05.16 දින ශ්‍රී ලංකාවට ගෙන්වා ඇත. මෙම සේවක මහතා කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ගෙන විදේශ ගත වී ඇති බැවින්, ඔහු වෙනුවෙන් කාර්යාංශය විසින් රු.40,000/- ක අවමංගල්‍ය වියදම් දීමනාවක් ඥාතීන් වෙත ලබා දී ඇත.<br><br>එමෙන්ම, ගිවිසුම්ගත කාලය තුලදී මෙම සේවක මහතාගේ මරණය සිදු වී ඇති බැවින් ඔහුගේ කාර්යාංශ ලියාපදිංචියට අදාල රක්ෂණාවරණය යටතේ රු. 600,000/- ක වන්දි මුදලක් ලැබී ඇති අතර, අදාල හිමිකරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

| | | |
|---|---|---|
| iii. 44 වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලාභියකු විසින් කාර්යාංශය වෙත ඉදිරිපත් කර තිබූ රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයින්ගෙන් මුදල් අය කිරීමකින් තොරව විදේශගත කරන ලෙස කාර්යාංශය විසින් ලබා දී තිබූ අනුමැතිය අවභාවිතා කර 2022 වර්ෂයේ සිට බලපත්‍රලාභීන් නොවන පුද්ගලයින් විසින් ශ්‍රමිකයින් විදේශගත කිරීමට මුදල් අයකර ලියාපදිංචි බලපත්‍රලාභියාගේ රැ කියා ඇණවුම් මගින් ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම සඳහා ව්‍යාජ තොරතුරු ඇතුළත් කර විදේශ ගත කර තිබුණි. ඉන් රැ කියාවන් නොමැතිව 50 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් නැවත ලංකාවට පැමිණි කාර්යාංශය වෙත පැමිණිලි කර තිබූ බව විගණනය විසින් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එහෙත් කාර්යාංශය විසින් අදාළ බලපත්‍රලාභියාට හා මුදල් අයකරගත් පුද්ගලයින්ට එරෙහිව ලැබී තිබූ පැමිණිලි සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අගතියට පත් පාර්ශවයන් වෙත සාධාරණ විසඳුමක් ලබාදී නොතිබුණි. | (iii) බලපත්‍ර අංක 2860 දරන බලපත්‍රලාභියා විසින් සිදුකරන ලද කාර්යාංශ ලියාපදිංචිය සම්බන්ධයෙන් විමර්ශන අංශයට ලැබි තිබූ පැමිණිලි සම්බන්ධයෙන් කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇත.<br><br>2009 අංක 56 සහ 1994 අංක 04 දරන සංශෝධිත පනත් මගින් සංශෝධිත 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතට අනුකූලව මේ වන විට එම සියළුම පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කර අධිකරණයට කරුණු වාර්තා කර වගඋත්තරකරුවන් වෙනුවෙන් විවෘත වරෙන්තු නිකුත් කර විදේශ ගමන් තහනම්ද පනවා ඇත.<br><br>බලපත්‍රඅංක 2860 දරන රැකියා නියෝජිත ආයතනය විසින් කටාර් රාජ්‍ය වෙත රැකියා සඳහා පිටත් කරනු ලැබූ ශ්‍රමිකයින් අතරින් 50 කට ආසන්න ප්‍රමාණයක් පොරොන්දු වූ හෝ ගිවිසුම් ගතවූ අදාළ රැකියාව හා ඉඳුම් හිටුම්, කෑම බීම නොමැතිව දින 10 සිට මාස 2 දක්වා කාලයක් එහි රැඳී සිට නැවත ලංකාවට පැමිණ ඇති අතර, ඔවුන් විසින් සමථ අංශය සහ පළාත් කාර්යාලයන් වෙත පැමිණිලි 35 ක් ගොනු කර ඇත.කාර්යාංශය විසින් පැමිණිලිකරුගේ සහ විදේශ ගත ශ්‍රමිකයාගේ අවශ්‍යතාවය සහ එකඟතාවය අනුව කටයුතු සිදුකර එම පැමිණිලි අවසන් කර ඇත.<br><br>ශ්‍රී ලංකාවට පැමිණීමට අවශ්‍ය බව ප්‍රකාශ කරන ලද විදේශගත වූවන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ දෙපාර්ෂවය අතර ඇතිවූ එකඟතාවය මත පැමිණිලි 18 ක කටයුතු අවසන් කර ඇත.ඔවුන් විසින් තෙවැනි පාර්ශවයකට ලබාදුන් මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විමර්ශන අංශයට එම පැමිණිලි යොමු කර පැමිණිලි 7 ක සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.<br><br>සේවා ස්ථානයේ ගැටළු සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමේදී,විදේශ ගත ශ්‍රමිකයින්සේවය කරනු ලබන එම සේවා ස්ථානයේම හෝ සේවය කරනු ලබන සේවා ස්ථානයෙන් වෙනත් සේවා ස්ථානයක සේවය කිරීමට ඔවුන්ගේ කැමැත්ත මත අවශ්‍ය නීතිමය රාමුව සකසා ගැනීමට උපදෙස් ලබාදී පැමිණිලි 10 ක කටයුතු අවසන් කර ඇත.<br><br>ඉහත සඳහන් පරිදි කටයුතු සිදුකරමින් පැමිණිලි 35 ට අදාළ කටයුතු අවසන් කර ඇත. |

| | | |
|---|---|---|
| iv. 48 (2) වගන්තිය | කාර්යාංශයේ විදේශිය සුභසාධන අරමුදල් කමිටු අනුමැතියකින් තොරව ඕමාන් දූත මණ්ඩල කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ උපදේශක විසින් ගෘහසේවිකාවකගේ රෝහල් බිලක් පියවීම සඳහා 2023 ඔක්තෝම්බර් 22 දින රු.2,549,640 ක් ගෙවීම් කර තිබුණි. | (iv) ගමන් බලපත්‍ර අංක N9690443 දරන ජේ.ජේ.අයි.බානුප්‍රියා නැමති ගෘහසේවිකාවගේ රෝහල් ගාස්තුව වශයෙන් ඕමාන් රියාල් 3000 ක මුදලක් ගෙවීම සඳහා කාර්යාංශයෙහි සභාපතිතුමා වෙතින් WhatsApp පණිවිඩයක් මාර්ගයෙන් අනුමැතිය ලබා ගෙන ඇති අතර ඊට යටත්ව අදාළ ගෙවීම් සිදු කර ඇත. තානාපති කාර්යාලයේ නිලධාරීන්ගේ මැදිහත්වීම මත එය ඕමාන් රියාල් 3000ක් දක්වා අඩුකර ගෙන ඇත.2024.06.27 දින පැවැති විදේශීය සුභසාධන අරමුදල් කමිටු රැස්වීමේදී ඒ සඳහා කමිටුවේ අනුමැතිය ලබා දී ඇත. |
| v. 53 (3) වගන්තිය | පනතේ විධිවිධාන වලට පටහැනිවඇමරිකානු ඩොලර් 100 ක් කාර්යාංශය වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව එක්සත් අරාබි එමීර් රාජ්‍යයට හා ඕමාන් රාජ්‍යයට රැකියා ගිවිසුමක් නොමැතිව සංචාරක වීසා මත ගෘහසේවිකාවන් විදේශ ගත කිරීමට 2023 මාර්තු 20 දිනැතිව අංක 07/2023සභාපති චක්‍රලේඛයමඟින්කාර්යාංශයේ ලියාපදිංචි බලපත්‍රලාභින්ට අනුමැතිය ලබා දී තිබුණි. එදින සිට 2024 ජුනි 6 දින වන විට රාජ්‍යයන් දෙකක් වෙත සංචාරක වීසා මත ගෘහ සේවිකාවන් 4,942 ක් විදේශගත කර තිබූ අතර ඉන් 3,954 ක් වෙත චක්‍රලේඛය ප්‍රකාරව දින 30 ක් ඉක්මයාමට පෙර රැකියාවක් ලබා දුන් බවට අදාළ ලියකියවිලි තානාපති කාර්යාලයේ තොරතුරු පරිගණක පද්ධතියට උඩුගත කර නොතිබුණි. | (v) බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතන වෙත යොමු කරන ලද 2023 මාර්තු 20 දිනැති අංක 07/2023 දරන සභාපති චක්‍රලේඛය මඟින් සංචාරක වීසා යටතේ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට සහ ඕමාන් වෙත ගෘහ සේවිකාවන් විදේශගත කිරීමට අවසර ලබා දී තිබිණි.<br><br>නමුත් රැකියා ගිවිසුමක් නොමැතිව ලියාපදිංචි කිරීම සඳහා අනුමැතිය ලබා දී නොතිබිණි.<br><br>එම චක්‍රලේඛයේ 2 (ii) වගන්තිය අනුව, ගමනාන්ත රටෙහි විදේශ රැකියා නියෝජිත විසින් අත්සන් කරනු ලබන සේවා ගිවිසුමක් යටතේ කාර්යාංශ ලියාපදිංචිය සිදු කළ හැක.<br><br>මේ සඳහා එරට රැකියා නියෝජිත විසින් ඩොලර් 100 ක මුදලක් කාර්යාංශයේ අංක 0000002305 දරන USD ගිණුමට (ලංකා බැංකුව) තැන්පත් කළ යුතුය.එසේ නොමැති නම් දූත මණ්ඩල කාර්යාලයේ කම්කරු හා සුභසාධන අංශ වෙත තැන්පත් කළ යුතුය.<br><br>ඒ අනුව, මෙම සේවිකාවන් එරට පිහිටි රැකියා නියෝජිත ආයතනය (විදේශීය රැකියා නියෝජිත) වෙත යොමු කරනු ලැබේ. රැකියා නියෝජිත ආයතනය විසින් සේවා යෝජක වෙත යොමු කරනු ලැබේ. මෙය එරට ගෘහස්ත සේවකයින් බඳවා ගනු ලබන රජය අනුමත ක්‍රමවේදයකි. චක්‍රලේඛය අනුව, දින 30 ක කාලසීමාව තුල රටට ඇතුල්වීමේ වලංගු වීසා, රැකියා වීසා බවට පරිවර්තනය කර එරට රජය අනුමත සේවා ගිවිසුමක් අත්සන් කළ යුතුය. අමතර කාල සීමාවක් අවශ්‍ය වන්නේ නම් දින 45 ක් දක්වා කාලය ලබා දී ඇත. එම ගිවිසුම එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල විසින් සහතික කර (මෙහිදී නැවත සේවා ගිවිසුම් සහතික කිරීමේ ගාස්තු අය නොකරයි), කාර්යාංශ පරිගණක පද්ධතියට උඩුගත කරනු ලැබේ. |

| | |
|---|---|
| | පරිගණකගත තොරතුරු පරීක්ෂා කිරීමේ දී පහත තොරතුරු අනාවරනය වේ.<br>• සංචාරක වීසා මත ගෘහ සේවිකාවන් ලියාපදිංචි කර ඇති ප්‍රමාණය - 5066<br>• රැකියා ගිවිසුම් පරිගණක පද්ධතියට උඩුගත කර ඇති ප්‍රමාණය - 3391<br>• රැකියා ගිවිසුම් පරිගණක පද්ධතියට උඩුගත කිරීමට නොහැකි අවස්ථාවලදී කාර්යාංශය විසින් නිදහස් කර ඇති ප්‍රමාණය - 590<br>තොරතුරු යාවත් කාලීන /උඩුගත නොකිරීමට විවිධ හේතු බලපාන අවස්ථා ඇත.<br>• කාර්යාංශ ලියාපදිංචිය ලබා ගත්තද විවිධ හේතු මත විදේශගත නොවීම<br>• අසනීප හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතු මත ප්‍රමාද වී විදේශගතවීම<br>• මෙරට හෝ පිටරට ගුවන් තොටුපලින් පැන යාම<br>• නීතිමය කරුණු මත එරටට ඇතුල්වීමට නොහැකිව හරවා එවීම /පිටුවහල් කිරීම<br>• සේවා ස්ථානයෙන් පැනයාම<br>• අසනීප හෝ පෞද්ගලික හේතු මත ලංකාවට පැමිණීම<br>• සේවය කිරීමට අකමැති වීම<br>• සේවා යෝජකගේ හෝ සේවිකාවගේ අකමැත්ත මත නිවාස කිහිපයකට මාරු කිරීම. මේ ආකාරයට අදාළ කාල පරාසය තුල නියමිත පරිදි තොරතුරු උඩුගත නොකරන රැකියා නියෝජිත ආයතන ස්වයංක්‍රීයව පරිගණක පද්ධතිය මගින් ඊකදජන වන අතර එය නිවැරදි කරන තුරු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටවනු ලැබේ. ඒ අනුව ක්‍රමවේදයට පටහැනිව කටයුතු කර නැත. |

**2.3 වෙනත් කරුණු**

(අ) 2023 ජුලි 25 දින දකුණු කොරියාව බලා පිටත්ව යාමට නියමිතව සිටි ශ්‍රමිකයින් 6 දෙනෙකු විසින් එදිනට නියමිත ගුවන් යානයේ ටිකට්පතක් රු. 272,000 කට හා ටිකට්පත් 5 ක් රු. 279,000 කට සෘජුවම ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් මිලදී ගෙන තිබුණු අතර විදේශ රැකියා ඒජන්සි සමාගමෙන් එම ටිකට්පත් රු. 319,522 ක මිලකට මිලදී නොගැනීම හේතුවෙන් ඔවුන්ව එදින කොරියාව බලා පිටත් කර යැවීම අත්හිටුවා තිබුණි. ඉන් එක් ශ්‍රමිකයෙකු පමණක් නැවත රු. 319,522 ක් ගෙවීමෙන් පසු එම ගුවන් යානයේම ද අනෙකුත් ශ්‍රමිකයින් 5 දෙනා ඉන් මාසයකට පසුව රු. 329,291 ක් බැගින් ගෙවා නැවත වරක් ටිකට්පත් මිලදී ගෙන යැවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව කාර්යාංශයේ ඉහළ කළමනාකාරිත්වය විසින් මෙම ශ්‍රමිකයින් 6 දෙනා සඳහා ටිකට්පත් වෙනුවෙන් රු. 1,961,225 ක් වැඩියෙන් වැය කිරීමට කටයුතු සලස්වා තිබුණි.

ශ්‍රී ලංකා රජය සහ දකුණු කොරියානු රජය අතර 2012 අගෝස්තු 29 දින එළඹ ඇති අවබෝධතා ගිවිසුමෙහි ගුවන් ප්‍රවේශපත් වෙන් කිරිම සම්බන්ධයෙන් සඳහන් වී තිබෙන 11 ඡේදයෙහි උප කරුණු 03 ට අනුව,

"The sending agency will take necessary measures" including making flight reservations in advance" to ensure that workers enter Korea on the scheduled date”

ඒ අනුව අදාළ ශ්‍රමිකයන් නියමිත දිනයට කොරියාවට ඇතුල්වීම තහවුරු කිරිම සඳහා එම ශ්‍රමිකයින් වෙත ගුවන් ප්‍රවේශපත්‍ර වෙන් කිරීමේ කාර්යය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් කළ යුතුය.

තවද, කණ්ඩායමක් ලෙස ශ්‍රමිකයින් පිටත් කිරිමට පෙර ඔවුනට අදාළ අවසන් දැනුවත් කිරීමේ වැඩසටහන, අදාළ කණ්ඩායම කොරියාවේ ගොඩ බැසීමට නියමිත දිනට, දින 07කට පෙර දිනකදී කාර්යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබයි. ඒ අනුව, 2023.07.25 දින පිටත් වීමට නියමිතව සිටි 806 වැනි කණ්ඩායම සඳහා අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන 2023.07.17 දින පවත්වා ඇති අතර එහිදී කණ්ඩායමක් ලෙස ගුවන් ටිකට්පත් ලබා ගැනීම ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම වෙතින් සිදුකල යුතු බව අවධාරනය කර ඇත.

එමෙන්ම, 2023.07.12 දින කාර්යාංශය විසින් ශ්‍රමිකයින් 47 දෙනෙකු වෙත යොමු කරන ලද කෙටි පණිවිඩය මගින්ද මේ සම්බන්ධයෙන් රැකියාලාභින්ව ප්‍රමාණවත් කාලයක් තුළ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම මගින් ගුවන් ටිකට් පත් වෙන් කර ගත යුතු බවට දැනුවත් කර ඇත.

| | |
|---|---|
| | නමුත්, මෙලෙස පැහැදිලි උපදෙස් ලබා දී තිබියදී මෙම කණ්ඩායමට අදාළ රැකියාලාභින් 07 දෙනෙකු මෙම ආයතනය මගින් ටිකට්පත් මිලදී ගෙන නොතිබීම සම්බන්ධයෙන් 2023.07.19 දින ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම විසින් සිදු කරන ලද දැනුම් දීම ප්‍රකාරව එම රැකියාලාභින්ගෙන් 2023.07.20 දින කාර්යාංශය කරුණු විමසා ඇත. එක් රැකියාලාභියෙකු නියමිත දින විදෙස්ගත නොවන බවත් අනෙකුත් රැකියාලාභින් 06 දෙනා කාර්යාංශය විසින් ලබා දී තිබූ උපදෙස් වලට පටහැනිව ගුවන් ටිකට්පත් මිලදීගෙන ඇති බවත් තහවුරු වී ඇත.<br><br>මෙලෙස ප්‍රමාණවත් කාලයක් ඇතිව පැහැදිලි උපදෙස් ලබා දී තිබියදී වුවද, කණ්ඩායම් හැඟීමකින් තොරව කාර්යාංශයේ හා අදාළ අවබෝධතා ගිවිසුමේ විධිවිධානයන්ට පරිභාහිරව තම අභිමතය පරිදි ගුවන් ටිකට්පත් ලබා ගැනීමට ක්‍රියා කිරීම රටවල් දෙක අතර පවතින අවබෝධතා ගිවිසුමෙහි ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති කරයි. |
| (ආ) කුවේට් දූත මණ්ඩල කාර්යාලයේ පිහිටි සුරක්ෂා නිවාසය 2021 මාර්තු 09 දින සිට මෙම ගොඩනැගිල්ලෙන් ඉවත් කර නිවාස පාදක නිලධාරියකුගේ නිවසක් ලෙස භාවිතා කිරීම හේතුවෙන් තානාපති සේවය අපේක්ෂාවෙන් පැමිණෙන ගෘහසේවිකාවන්ට රාත්‍රී කාලයේදී හා සති අන්තයේදී අදාළ ගැටළු විසඳා ගන්නා තෙක් නවාතැන් ගැනිමට සුදුසු ස්ථානයක් නොතිබුණි. තවද 2023 වර්ෂය සඳහා නිවාස පාදක නිලධාරින් දෙදෙනාගේ නිළ නිවාස සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමත කුලී ගාස්තු සීමාවඉක්මවා රු. 21,330,047 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සුරක්ෂා නිවාසය වසා දැමීමට තීරණය කර ඇත්තේ එවකට තානාපතිතුමන්ගේ අභිමතය පරිදි වන අතර, සුරක්ෂා නිවාසය නවත්වා දැමීමට තීරණය කළද, අනෙකුත් කටයුතු එනම්, කම්කරු හා සුභසාධන අංශයේ කටයුතු මෙන්ම සියරට ජේරුව නිලධාරීන්ගේ නවාතැන් පහසුකම් ද පවත්වාගෙන යා යුතුව ඇත. තවද, වියානා සම්මුතියේ ප්‍රතිපාදන අනුව ස්වජාතිකයන්හට තානාපති පරිශ්‍රය තුළ තාවකාලික නවාතැන් පහසුකම් සැපයීමේ කිසිදු තහනමක් නොමැත.<br><br>කොවිඩ් වසංගත තත්ත්වය තුළ සුරක්ෂා නිවාසය තානාපති කාර්යාලය තුළ පවත්වා ගෙන නොයාමට ගත් තීරණය හේතුවෙන් තානාපති කාර්යාලයේ එම කොටස හිස්ව පැවතුණි. එබැවින් භාවිතයට නොගෙන තිබූ සුරක්ෂා නිවාසය සුදුසු පරිදි සකස් කොට තෙවන ලේකම්ගේ නිල නිවස ලෙස භාවිතයට ගැනීමට කටයුතු කර ඇත. මේ සඳහා බාහිරින් නිල නිවසක් කුලියට ගතහොත් ඒ සඳහා වාර්ෂිකව අධික මුදලක් වැය කිරීමට සිදුවේ. (KD 4,032 = KD 336×12 පමණ) මේ අනුව, මෙය අලුත්වැඩියා කර භාවිතයට ගැනීම තුළ වියදම් අඩුකර ඇති අතර, නිලධාරියා තානාපති කාර්යාලය තුළ රැඳී සිටීම හේතුවෙන් සේවය සැපයීමට පහසුවක් වේ. |

| | |
|---|---|
| (ඇ) කාර්යාංශයට අයත් ඕමාන් තානාපති කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ සුරක්ෂා නිවාසයක් පවත්වාගෙන යෑමේ හැකියාව පැවතියදී 2019 ඔක්තෝම්බර් 01 සිට 2024 ජූලි දක්වා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි වල පවත්වාගෙන ගොස් තිබුණු අතර 2024 ජනවාරි දක්වා දළ වශයෙන් (ඕමාන් රියාල් 34,000 ක්) රු.28,561,112 ක් ගෙවා තිබුණි. තවද, 2022 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදීනවාතැන් ගෙන සිටි රැඳවියන් විසින් සුරක්ෂා නිවාසයට සිදුකරන ලද අලාභහානි අලුත්වැඩියා කරහිමිකරු වෙත භාරදීම ප්‍රමාද වූ 2023 පෙබරවාරි සිට අගෝස්තු දක්වා වූ මාස 7ක කාලපරිච්ඡේදය වෙනුවෙන් කුලී ගාස්තු, ජලබිල්පත්, විදුලි බිල්පත් හා අලාභහානි සඳහා රු. 19,130,480 ක් ගෙවා තිබුණි. | කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලෙහි ගිවිසුම් ප්‍රකාරව එම ගිවිසුම් අවලංගු කර ගොඩනැගිල්ල නැවත පළමු පාර්ශවය වෙත භාර දීමට නම් එම ගොඩනැගිල්ල භාර ගන්නා අවස්ථාවේ දි පැවති තත්ත්වයෙන්ම භාර දිය යුතු වන අතර, යම් අළුත්වැඩියා කටයුත්තක් සිදු විය යුතු නම් එය දෙවන පාර්ශවය විසින් සිදු කල යුතු වේ. කාර්යාංශය වෙත සාවද්‍ය තොරතුරු සපයමින් අවිධිමත් මාර්ග ඔස්සේ සංචාරක විසා භාවිතයෙන් රැකියා සඳහා ඕමාන් රාජ්‍ය වෙත පිටත්ව ගිය කාන්තා විගමනිකයින් විසින් සිදු කරන ලද කලහකාරී තත්ත්වය මත ඇති වූ අලාභය හා වැහි වතුරින් සිදු වූ හානිය වෙනුවෙන් විශාල මුදලක් ගෙවීමට සිදු වීය. ගොඩනැගිල්ලට සිදු වූ අලාභහානිය පිළිබඳ පරීක්ෂණය තානාපති කාර්යාල නිලධාරීන් හා ගොඩනැගිලි හිමිකරු එක්ව පැවත්විය යුතුව තිබූ අතර, ගොඩනැගිලි හිමිකරු වෙනුවෙන් පෙනී සිටි පාර්ශවයේ සිදු වූ ප්‍රමාදය හේතුවෙන් අලුත්වැඩියා කිරීමට මාස 07 ක කාලයක් ගත විය. |
| (ඈ) ඕමාන් විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සුරක්ෂා නිවාසයක් ලෙස භාවිතා කිරීමට අනුමැතිය ලබා දී නොතිබුණු ගොඩනැගිල්ලක් 2023 වර්ෂය සඳහා කුලී පදනම මත ලබා ගෙන ගිවිසුම්ගත වීමකින් තොරව ඕමාන් රියාල් 7200 ක් හෙවත් රු. 6,872,544 ක් ගෙවා තිබුණි. | විවිධ අපහසුතාවයන්ට පත්වෙන ශ්‍රී ලාංකික කාන්තා ශ්‍රමිකයින්ගේ ගැටළු විසඳෙන තුරු ආරක්ෂාව සැපයීමට කාර්යාංශයට සිදු වේ.<br><br>ගිවිසුම අත්සන් කිරීමෙන් පසු එය ඕමාන්හි විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලියාපදිංචිය සඳහා යොමු කර ඇත. එසේම විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම අදාළ ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව සිදුකළ යුතු කාර්යයක් බැවින් ගිවිසුම අත්සන් කරන අවස්ථාව වන විට විදේශ කටයුතු අමාත්‍යාංශයේ තීරණය දැනගැනීමට අවස්ථාවක් නොමැත. එසේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය නොලැබුණද ගොඩනැගිලි හිමිකරුගේ එකඟතාවය මත හා සුරක්ෂා නිවාසයක් පවත්වා ගෙන යාම අවශ්‍යතාවය මත සුරක්ෂා නිවහන පවත්වාගෙන ගොස් ඇත. |

| | |
|---|---|
| (ඉ)ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා ප්‍රථම වරට විදේශගත වන ගෘහසේවිකාවන්ට බෙදා දීම සඳහා රු. 5,000 ක් හා රු. 2,500 ක් වටිනා සතොස වවුචර්පත් පිළිවෙලින් 14,000 ක් හා 28,000 ක් සියයට 1 ක වට්ටමක් යටතේ රු. 138,600,000 කට 2023 ඔක්තෝබර් 13 දින මිලදී ගෙන තිබුණි. 2024 අගෝස්තු 14 දින වන විට ඉන් රු128,229,300 ක් වටිනා වවුචර්පත් 13,005 ක් ඉතිරිවී තිබුණි. ප්‍රථම වතාවට විදේශ ගත වන කාන්තාවන් පෙර විදේශ ගතව සිටි බවට ලියකියවිලි ඉදිරිපත් කර පුහුණුවෙන් නිදහස් කර තිබීම හා උත්සව පැවැත්වීම ප්‍රමාදවීම මේ සඳහා හේතු වී තිබුණි. | ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා ප්‍රථම වරට විදේශ ගත වන ශ්‍රමික කාන්තාවන් හට රු.10,000ක් වටිනා සතොස වවුචර්පත් බෙදාදීම සඳහා 2023.06.19 වන දින 103/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 39.39.23 මගින් අනුමත කර ඇත.<br><br>ඒ අනුව පළමු අදියර වශයෙන් රු.2500ක් වටිනා වවුචර්පත් 28000ක් ද, රු.5000ක් වටිනා වවුචර්පත් 14000ක් ද, 2023.10.20 දින සතොස ආයතනයෙන් ලබා ගෙන ඇත. එහෙත් මෙම වැඩසටහන සඳහා අදාළ පරිගණක වැඩසටහන සකස් කිරීම, ශ්‍රමිකයන්ගේ භාරකරුවන් වෙත කෙටි පණිවුඩ (SMS) යොමු කිරීමට අදාළ වැඩසටහන් සකස් කිරීම, චක්‍රලේඛය නිකුත් කිරීම හා පූර්ව සූදානම් කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම යන හේතු නිසාවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2023.11.24 දින ආරම්භ කරන ලදී.<br><br>ඒ අනුව පළාත් කාර්යාල, විගමණික සම්පත් මධ්‍යස්ථාන, ප්‍රධාන කාර්යාලය හා සහන පියස මධ්‍යස්ථානය මගින් ලබා දී ඇති තොරතුරු අනුව 2023 නොවැම්බර් 24 සිට 2023 දෙසැම්බර් 31 වන දින වනවිට සුදුසුකම් ලැබූ විගමණික ශ්‍රමික කාන්තාවන් 52කු වෙනුවෙන් අදාළ වවුචර්පත් බෙදා දී ඇති අතර 2024 ජනවාරි 01 දින සිට 2024 අගෝස්තු මස 31 වන විට වවුචර්පත් 1220ක් බෙදා දී ඇත.<br><br>ගෘහස්ථ අංශයෙහි රැකියාවන් සඳහා පළමුවරට විදේශගතවන කාන්තාවන්ගේ පවුල්වලට සහනයක් සැලසීමේ අරමුණින් ලංකා සතොස වෙතින් භාණ්ඩ මිලදීගැනීම සඳහා රු. 10,000/- ක වටිනාකමකින් යුත් වවුචර්පත් නිකුත් කිරීම කාර්යාංශය විසින් සිදුකළ අතර, ඒ වෙනුවෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව පහත සඳහන් කාණ්ඩයන්ට අයත් ශ්‍රමිකයින් වවුචර්පත් ලබාග ැනීම සඳහා සුදුසුකම් නොලබයි. |

| | |
|---|---|
| | 1.මීට පෙර විදේශ රැකියාවක නිරතවූ කාන්තාවන්<br>2.විදේශ රැකියාවක නිරතව සිට නැවත ඇතුළත්වීමේ වීසාපත් සහිතව මෙරටට පැමිණ නැවත විදේශගතවන කාන්තා ශ්‍රමිකයින්<br>3.විදේශයන්හි සේවය කිරීම මත පුහුණු අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලද කාන්තා ශ්‍රමිකයන්<br>ඒ අනුව, එතෙර පූර්ව සේවා පළපුරුද්ද සලකා බලා පුහුණුවෙන් නිදහස් කර ගෘහස්ථ අංශයේ රැකියා සඳහා විදේශ ගතවූ කාන්තාවන්හට ලංකා සතොස වෙතින් භාණ්ඩ මිලදීගැනීමට වවුචර්පත් නිකුත් කිරීමක් සිදුකර නොතිබුණි. |
| (ඊ) 2022 ජුනි 07දිනැති කාර්යාංශයේ සභාපතිගේ ලිපියට හා 2023 ජනවාරි 09 දිනැති නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු) ලිපියට පටහැනිව පළමු වතාවට විදේශ ගත වන ගෘහසේවිකාවන් සඳහා රු22,410 ක ගාස්තුවක් අයකර දින 28 ක (NVQ Level 3) නේවාසික පුහුණුවක් ලබා නොදී 2023 ජනවාරි සිට 2024 මැයි 29 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ගෘහසේවිකාවන් 28,165දෙනෙක් පළමු වතාවට විදේශ ගත කර තිබීම හේතුවෙන් රු.631,177,650 ක පුහුණු ආදායමක් කාර්යාංශයටඅහිමි වී තිබුණි. | ගෘහස්ථ අංශයේ රැකියාවන් සඳහා කාන්තාවන් නැවත විදේශගතවීම සඳහා ලියාපදිංචි කිරීමේදී ඕනෑම රටක දින 150 ක් (ගමන්වාර තුනකදී) විදේශගතව සිට ඇත්නම් ලියාපදිංචිය පුහුණුවකින් තොරව සිදුකිරීමේ හැකියාව ඇත. එසේ තහවුරු කරනු ලබන කාන්තා ශ්‍රමිකයින් කාර්යාංශ ලියාපදිංචි කිරීමේදී පුහුණු අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.<br>කාර්යාංශය විසින් පුහුණු ගාස්තු අයකරනු ලබන්නේ පුහුණුවට අදාළ පිරිවැය අයකරගැනීම වෙනුවෙන් වන අතර, පුහුණුවෙන් නිදහස් කළ අය වෙනුවෙන් එවැනි පිරිවැයක් නොමැති බැවින් පුහුණු ගාස්තු අයකිරීමක් නොමැත. පූර්ව සේවා පළපුරුද්ද සැලකිල්ලටගෙන පුහුණු අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලද ශ්‍රමිකයින් වෙනුවෙන් පුහුණු ගාස්තු අයකිරීමක් සිදුනොවන බැවින් පුහුණු ආදායම අහිමිව නොමැත. |
| (උ) 2022 ඔක්තෝම්බර් 15 හා 16 දෙදින, ගාල්ල සමනළ උයනේදී පැවති වැඩසටහන සඳහා වෙළඳ කුටියක් රු. 170,000ක් බැගින් හා 2023 ජුලි 15 හා 16 දිනයන්හි යාපනය දිස්ත්‍රික්කයේ පැවති වැඩසටහන සඳහා කුටියක් රු.500,000ක් බැගින් පිළිවෙලින් කුටි 30 ක් හා කුටි 25 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව පුද්ගලික ආයතනයකින් ලබා ගෙන තිබුණි. ඒ අනුව කුටියක මිල රු. 330,000 කින් වැඩි වීම පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව 2023 මැයි 29 දිනැති කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන කුටි 25ක් වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු. 12,500,000 ක් ගෙවීම් කර තිබුණි. | මෙහි සඳහන් ප්‍රසම්පාදන කටයුතු සියල්ල සිදුකරනු ලැබුවේ රේඛීය අමාත්‍යාංශය විසින් වන අතර, අදාළ ගෙවීම් ද අමාත්‍යාංශයේ දැනුම් දීම මත සිදුකර ඇත. ඒ අනුව අංක 2023/96 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඇති අතර, අංක 39.39.16 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව එය අනුමත කර ඇත. රේඛිය අමාත්‍යාංශයේ දැනුම් දීම මත කාර්යාංශය විසින් සෙස් අරමුදලින් අදාළ වියදම් සිදු කර ඇත. |

| | |
|---|---|
| ( උෟ) දකුණු කොරියාවේ ධීවර අංශයේ රැකියාවක නියුතුව සිටි ශ්‍රමිකයෙකු 2019 ඔක්තෝම්බර් 08 දින අනතුරකට පත්වීම හේතුවෙන් ඔහු මෙරටට ගෙන්වා ගැනිම සඳහා සහෝදරයා විසින් රු.1,564,546ක් කාර්යාංශයේ තැන්පත් කර තිබියදී, මොහු ශ්‍රී ලංකාවට නැවත එවිමට හා රෝහල් බිල පියවීම සඳහා කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකු විසින් ඔහුගේ එරට බැංකු ගිණුම්හි තැන්පත් මුදල් භාවිතා කර තිබුණි. තවද, කම්කරු සුභසාධන අංශයේ නිලධාරියෙකුගේ ණය කාඩ්පත භාවිතා කර ගුවන් ටිකට්පත් මිලදී ගෙන තිබුණි. එම දරන ලද වියදම් පිළිබඳව පරීක්ෂා කිරිමකින් තොරව සහෝදරයා විසින තැන්පත් කර තිබු මුදලින් ඉතිරිව තිබු රු.98,786 ක් පමණක් 2023 අගෝස්තු මාසයේදී ඔහු වෙත ගෙවා තිබුණි. | මුදල් අංශය වෙත කොරියානු තානාපති කාර්යාලය මඟින් යොමු කරන ලද ගිණුම් ලේඛන වලට අනුකූලව පිළියෙළ කරන ලද ලැබීම් හා ගෙවීම් සාරාංශයට අනුව විගණන විමසුමෙහි සඳහන් ශ්‍රමිකයා වෙනුවෙන් ඔහුගේ ඥාතීන් විසින් කාර්යාංශයේ තැන්පත් කර තිබූ මුදලින් නැවත ඔහු වෙත ගෙවිය යුතු මුදල රු.98,786.66 ලෙස තහවුරු කර ගැනීමෙන් අනතුරුව මෙම ගෙවීම සිදු කර ඇත.<br><br>දකුණු කොරියාවේ ධීවර අංශයේ රැකියාවක නියුතුව සිට 2019.10.08 දින අනතුරට පත් වූ හසිදු දිනුක මහතා ලංකාවට එවීම සඳහා ඔහුගේ බැංකු ගිණුමේ තිබූ මුදල් භාවිතා කර නොතිබුණි.<br><br>කොරියානු රට තුලදී ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සිදු කල හැක්කේ මාර්ගගත (Online) ක්‍රමය භාවිතා කිරීමෙනි. තානාපති කාර්යාලයට ණයපත් (ක්‍රෙඩිට් කාඩ්පතක්) නොමැති බැවින්, පවතින එකම විකල්ප ක්‍රමය භාවිතා කර ඇත. ගුවන් ටිකට්පත් වෙන් කිරීමේදී එය ඉතා කඩිනමින් සිදු කල යුතු බැවින්, මාර්ග ගත ක්‍රම වේදය ඔස්සේ ණයපත් මඟින් ගුවන් ටිකට්පත් වෙන් කිරීම එම රට තුලදී බහුලව අනුගමනය කරන ක්‍රියාමාර්ග යක් වේ.<br><br>ඒ අනුව, හසිඳු දිනුක මහතා මෙරටට එවීම සඳහා මාර්ගගත ක්‍රම වේදය ඔස්සේ ණයපත් භාවිතා කර ගුවන් ටිකට්පත් වෙන් කිරීම සිදු කර ඇත. |
| (එ) 2013 ජනවාරි 24 දිනැතිඅමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමග ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත රු.100,000,000ක මුදලක් සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේ කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත් , එම මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමෘද්ධිසංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෙම මුදල අයකර ගැනීම සඳහා 2024.01.19 දිනැතිව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යංශයේ ලේකම් වෙත යොමු කරන ලද කැබිනට් පත්‍රිකාවකැබිනට් මණ්ඩල ලේකම් වෙත යොමු කර ඇත. ජනාධිපතිවරණයෙන් පසු අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යොමු කරන ලද කැබිනට් පත්‍රිකාව ආපසු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යංශය වෙත එවා ඇත. |

| | |
|---|---|
| (ඒ) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ලැබිය යුතු විවිධ තැන්පතු යටතේ පැවති රු. 1,000,000 ක ශේෂය හා 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු. 1,388,788,991ක් වු ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමකින් හා විධිමත් අනුමැතියකින් තොරව පිළිවෙලින් සමුච්චිත අරමුදලට හා වර්ෂයේදී ආදායමට හර හා බැර කර තිබුණි. | 2016 වර්ෂයේ දී ශේෂ තහවුරු කිරීමේ ලිපියකට අනුව මහජන බැංකුව විසින් කාර්යාංශය සතුව රු.8,484,160ක බැංකු ශේෂයක් පවතින බවට තහවුරු කර තිබුණි. ඒ පිළිබඳව පරීක්ෂා කිරීමේ දී කාර්යාංශයේ ගිණුම් වල සඳහන් බැංකු ශේෂයන්හි අදාල අගය නොමැති බව තහවුරු වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 58/2016 (M-04) ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව 2016 වර්ෂයේ ආදායමට අදාල අගය බැර කල අතර නව ස්ථාවර තැන්පතුවක් විවෘත කරන ලදි. නමුත් කාර්යාංශයේ ගිණුම් වල සඳහන් ලැබිය යුතු ශේෂයන් පරීක්ෂා කිරීමේ දී රු.මිලියනයක මුදලක් ලැබිය යුතු ශේෂයක් ලෙස පවත්නා බව නිරීක්ෂණය වූ අතර එය ඉහත බැංකු ශේෂයට අදාල බව පෙනී ගිය බැවින් 2023 වර්ෂයේ ගිණුම් වලට මෙම අගය ලිහා හැරීම සිදු කර ඇත.<br><br>රු.1,388,788,991ක ශේෂයට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 52/2024 (M-03) මඟින් නිසි අනුමැතියක් සහිතව ආදායමට ගෙන ඇත. |

කෝශල වික්‍රමසිංහ
සභාපති